
තමාගේ මාතෘභූමියට අබමල් රේණුවක තරම්වත් ආදරයක්
තිබෙන සියලු ශ්‍රී ලාංකික මනුෂ්‍යයන් විසින් මුල සිට අගට කියවිය යුතු...




# ව්‍යවස්ථා සෙල්ලමෙන් රට බෙදන හැටි:

## බෙදුම්වාදීන්ගේ සහ පාවාදෙන්නන්ගේ රහසිගත සැලසුම්

මහජන රාජ්‍ය සභාව



**සිංහලයිනි සමඟි වව්!**
**සිංහල සමගිය සිංහල, දෙමළ, මුස්ලිම්**
**ජාතික සමගියේ පදනමයි.**
**මෙසේ නො කරන ජාති ද්‍රෝහීන්**
**ශ්‍රී ලංකාවෙන් පන්නමු.**

ඉතා හිනවත් ව රටේ සාමය හා දියුණුව සඳහා කියන කරුණු පිළිගන්නේ නැති ව, නිතුවක්කාරකමට පනත රාජ්‍ය සභාවට ඉදිරිපත් කළ හොත් ඒ අවස්ථාවේදී කළ යුත්තේ ඡන්දය නො දී සිටීම සහ විරුද්ධ ව ඡන්දය දීමයි. එසේ නො කළොත් සිංහල ජාතියේ විනාශයයි. විනාශයයි! විනාශයයි!

ශ්‍රී ලංකාව කවරකුගේවත් පෞද්ගලික දේපළක් නො වන බව සියලු ම දේශපාලකයන් පැහැදිලි ව ම දනගෙන සිටිය යුතු ය. මේ කරුණු විස්තර කොට කියන්නේත් ලියන්නෙත් සිංහලයාට තිබෙන එක ම රට රැකගන්නයි.

සිංහලයන්ට තිබෙන එක ම රට රැකගන්න කියන, කරණ අහන්නේ නැති ව නිතුවක්කාරකමට පනත ඉදිරිපත් කළොත් විරුද්ධ ව ඡන්දය දෙනවා පමණක් නො ව ඔවුන් පරදවා දමන්නට තරයේ ම සිතිය යුතු ය. එසේ නො කරන ජාතිද්‍රෝහීන් රටින් නෙරපා දමමු.

අති පූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
2000.03.09

(මෙය උන්වහන්සේ විසින් 2000 දී ඉදිරිපත් කළ ව්‍යවස්ථා සංශෝධනයට විරුද්ධව නිකුත් කළ ලිඛිත ප්‍රකාශනයකින් උපුටාගත් කොටසකි.)

# ව්‍යවස්ථා සෙල්ලමෙන් රට බෙදෙන හැටි:

## බෙදුම්වාදීන්ගේ සහ පාවාදෙන්නන්ගේ රහසිගත සැලසුම්

මහජන රාජ්‍ය සභාවේ ප්‍රකාශනයක්

අනුග්‍රහය

ශ්‍රී ලාංකීය ගෝලීය සංසදය

මහජන රාජ්‍ය සභාව

මුද්‍රණය
ඉමාෂි මුද්‍රණාලය
වනාත පාර,
නුගේගොඩ

ප්‍රකාශනය
ව්‍යවස්ථා ආවේක්ෂණ කමිටුව,
මහජන රාජ්‍ය සභාව,
අංක 544/ඒ, නාවල පාර, රාජගිරිය.
දුරකථන - 0112 865742
www.rajyasabaha.lk
FB- mahajanarajyasabhawa


# පිදුම

**මව්බිමේ ඒකීයභාවය**

**වෙනුවෙන්**

**දිවි දුන් සියලු**

**විරුවන්ට!**



# පෙරවදන
## 23 වැනි පැයේ අවධාරණය

මතු පිටින් පෙනුනත් මේ අප පසුකරමින් සිටින්නේ ශ්‍රී ලංකාවේ අනාගත ඉරණම තීන්දු කරන ඉතාමත් තීරණාත්මක මාස කිහිපයකි. දැන් පෙනෙන ආකාරයට ආණ්ඩුව සහ ටී.එන්.ඒ. පක්ෂය පමණක් නො ව විපක්ෂයේ සෙසු සියලු බලවේග ද එකට එකතු වී 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන් ම බලාත්මක කිරීම සඳහා ගෙන ඒමට නියමිත ව්‍යවස්ථා සංශෝධනය සම්මත වීමට ඉඩ හරිනු ඇත. සමහර පක්ෂ, ඊට තුනෙන් දෙකේ බහුතර කැමැත්ත අහිමි කිරීම සඳහා සක්‍රීය භූමිකාවක් ඉටු නො කර, තමා පමණක් විරුද්ධ ව ඡන්දය දීමෙන් හෝ ඡන්දය නොදී සිටීමෙන් මහජන අපවාදයෙන් ගැලවීමට උත්සාහ කරනු ඇත. ඔවුන් ඇත තිබෙන හෝ කිසිසේත් ම නො පැමිණෙන හෝ ජනමත විචාරණයක් පැරදවීම සඳහා මහජනයා පෙළගැස්විය යුතු බවට ව්‍යාජ සටන් - කාමීත්වයක් පෙන්වමින් තුනෙන් දෙක අහිමි කිරීමේ සටන අත්හැරීමට සැරසෙන බව පෙනේ. මෙවැනි තත්වයක් නිර්මාණය වීමට බොහෝ විට ඉන්දියාවේ බලපෑම හේතු විය හැකිය.

ඒකාබද්ධ විපක්ෂයේ ජාතිකවාදී බලවේග තමා ඉදිරියේ පෙළගැස්වෙමින් තිබෙන මෙම පාවාදීමේ සැලසුම තේරුම් ගෙන වහා අවදි වී, ඊට දායක නො වන ලෙසට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සෙසු මන්ත්‍රීවරුන්ට බලපෑම් කළ යුතු ය. ඔවුන් ඊට අසමත් වුවහොත් බෙදුම්වාදීන්ගේ සූක්ෂම මෙහෙයුම ජයග්‍රහණය කරනු ඇත. මෙම ක්‍රියාවලිය තුළ ඉතා ම පහත් සහ දරුණුතම පාවාදීම කරන්නේ ජනතා විමුක්ති පෙරමුණ විසිනි. ඔවහු තම නායකයා ඇතුළු සාමාජිකයන් දස දහස් ගණනින් ජීවිත පුදා තහවුරු කළ මතවාදයට සම්පූර්ණයෙන් ම ප්‍රතිවිරුද්ධ මතයක් දරමින් බෙදුම්වාදයට වාම වාදී සළු පිළි අන්දවති. ඒ මගින් ඔවුන් ආණ්ඩුව ආරක්ෂා කිරීමේ කොන්ත්‍රාත්තුවද මැනවින් ඉටුකරන බව පෙනේ. ඒ මහා පාවාදීමට,

ඉතිහාසයේ මියගිය වුන්ගෙන් මෙන් ම, අනාගතයේදී උපදින වුන්ගෙන්ද කිසි දිනෙක සමාව නො ලැබෙනු ඇත.

**මහා සංඝරත්නය සහ මහජනයා**
**නිහඬ ව සිටියහොත්,**
**විපක්ෂ බලවේග පාවාදෙන්නන්ගේ**
**උපක්‍රමවලට ගොදුරු වුවහොත්**
**රට බෙදන ව්‍යවස්ථා සංශෝධනය සම්මත කෙරෙනු ඇත.**

**සාහිත්‍යසූරි ගුණදාස අමරසේකර**

# සංස්කාරක සටහන

## ෆෙඩරල් දානයේ ආනිශංසය හෙවත් ආණ්ඩුවේ මානසික යුද උපක්‍රමවලට ගොදුරුවීම

අගමැතිගේ ෆෙඩරල්දානය වැළඳූ අප රටේ නායක මට්ටමේ භික්ෂූන්වහන්සේ කිහිප නමක් විසින් ප්‍රකාශ කරන්නට යෙදුනේ යෝජිත ව්‍යවස්ථා සංශෝධනය මගින් ඒකීය වගන්තිය සහ බුද්ධාගමට හිමි තැන අහෝසි කිරීමට යන බව ය. බෙදුම්වාදී ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය තුළ මහජනයා ගොනාට ඇන්දවීම සඳහා යොදාගන්නා ප්‍රධාන ම මානසික යුද උපක්‍රමය අගමැතිවරයා ගේ ක්‍රියාකාරීත්වය තුළින් මැනවින් පැහැදිලි වේ.

ව්‍යවස්ථා සංශෝධන කථිකාව තුළ ආරම්භයේ පටන් ම අප විසින් පවසන්නට යෙදුනේ ''ඒකීය'' වචනය සහ බුද්ධාගමට හිමි තැන අහිමි කිරීමේ උත්සාහයක් තිබෙන බවට කෙරෙන චෝදනාව ඉතා පරිස්සමින් විමසා බැලිය යුතු බව ය. එයට හේතුව ඒ පිළිබඳ ව පමණ ඉක්මවා අවධාරණය කිරීමේදී බෙදුම්වාදීන් විසින් සැබැවින් ම කරන්නට උත්සාහ කරන දේ පිළිබඳ ව අවධානය වෙනත් පැත්තකට යොමු වීම ය. බෙදුම්වාදීන්ට එම උවමනාවන් දෙක ම තිබෙන බවට විවාදයක් නැත. එහෙත් ඒ සඳහා ගන්නා වූ උත්සාහය තුළ සිංහල බෞද්ධ ජනතාවගේ ප්‍රබල විරෝධයක් මතුවීම මගින් ව්‍යවස්ථා සංශෝධනයට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ විශේෂ බහුතරය අහිමිවීමේ අනතුරට මුහුණ දීමට ඔවුන්ට සිදුවේ. ඔවුන් විසින් මෙතෙක් අනුගමනය කරන ලද සූක්ෂ්ම ක්‍රියාවලිය අනුව ඔවුන් එවැනි අනතුරක් කර නො ගන්නා බව පැහැදිලි ව තෙරුම් ගත හැකිය.

ඔවුන් දැන් ඒකීය වචනය ව්‍යවස්ථාවේ තිබියදී ම, රටේ ඒකීයභාවය නැතිකරන ක්‍රමය ඉතා හොඳින් ප්‍රගුණ කොට ඇත. පසුගිය දිනවල අධිකරණ තීන්දුවක් මගින් ද ඔවුන්ගේ උත්සාහය නිවැරදි බව පෙන්වා දී ඇත. බුද්ධාගමට හිමිතැන පිළිබඳ ව ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාවේ කුමක් තිබුණද ඒ මගින් ඔවුන්ගේ ඊළාම් මාර්ග සිතියමට බාධාවක් එල්ල නොවේ. ඊළාම් රාජ්‍යයේ ආගම

වන්නේ ''අන්තවාදී ක්‍රිස්තියානිය'' මිසක් හින්දු හෝ කතෝලික ආගම නො වේ. ඔවුන් බුද්ධාගමට හිමි තැන සැබැවින් ම අහිමි කරන්නේ වෙන ම රාජ්‍යය දක්වා යන ගමන තුළ ඇති කරන ජාතිවාදී, ආගම්වාදී ගැටුම් තුළ ය.

අප ඔවුන්ගේ මානසික යුද උපක්‍රමයට ගොදුරුවුවහොත් අන්තිම මොහොත්දී ඔවුන් විසින් අප සැම නිරායුද කරන බවට කිසිදු සැකයක් නැත. ඒ ''ඒකීය'' වචනය සහ බුද්ධාගමට හිමි තැන එසේ ම තිබියදී වෙන ම රාජ්‍යයක් සඳහා අවශ්‍ය බලතල සහිත ව්‍යවස්ථාව ඉදිරිපත් කිරීම මගිනි. එවිට එම සටන් පාඨය අතිශයෝක්තියෙන් අතට ගත් අය කරන්නේ කුමක් ද?

# පටුන


01) අතුරු වාර්තාවෙන් නොපෙනෙන ව්‍යවස්ථා සෙල්ලමේ කුඨ සැලසුම් 1-14

02) ව්‍යවස්ථා සෙල්ලම තුළ වරදවා ගැනීම් සහ පාවාදීම් 15-24

03) වෙල්ලාලයින්ගේ ෆෙඩරල් සංහිඳියාව සහ සැබෑ සංහිඳියාව 25-31

04) 13 වැනි සංශෝධනය ද? ඉන් එහාට ද? ඉන් මෙහාට ද? ඔත්තුකරුවන්ගේ මතය සහ ජාතිකවාදීන්ගේ මතය 33-40

05) ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණයෙන් ම අතහැරිය යුත්තේ හෝ පරාජය කළ යුත්තේ ඇයි? 41-50

06) ඇමුණුම් -1- - අධිෂ්ඨාන පූජාව 61-62

07) ඇමුණුම් -2- - මන්ත්‍රීවරුන්ගේ දුරකථන අංක 63-70

08) ඇමුණුම් -3- - මන්ත්‍රීවරුන්ට පණිවිඩය - අපේ මව්බිම එතරම් අවාසනාවන්ත නැහැ 71-73

09) ඇමුණුම් -4- සෙත් කවි සහ වස් කවි - ඡන්දදායකයන්ට පමණයි 75-76

10) ඇමුණුම් -05- හෘද සාක්ෂිය තිබෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත ඡන්දදායකයින්ගේ කාරුණික ඉල්ලීම (මහජන පෙත්සමේ ආකෘතිය) 77-79

# 01

## අතුරු වාර්තාවෙන් නොපෙනෙන ව්‍යවස්ථා සෙල්ලමේ කූට සැලසුම්

මේ වන විට ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ මෙහෙයුම් කමිටුව විසින් සකස් කළ වාර්තාවේ අවසන් කෙටුම්පත එම මණ්ඩලයට ඉදිරිපත් කොට ඇත. මෙහෙයුම් කමිටු ප්‍රධානී අගමැති රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රකාශය අනුව ඒ පිළිබඳ විවාදය ඔක්තෝබර් මාසයේදී පැවැත්වේ. පාර්ලිමේන්තුව විසින් අනුමත කළ ව්‍යවස්ථා මණ්ඩලය පිහිටුවීමේ යෝජනාව අනුව ඊළඟ පියවර වන්නේ වාර්තාව පිළිබඳ විවාදයෙන් පසුව ව්‍යවස්ථා කෙටුම්පත ව්‍යවස්ථා මණ්ඩලයට ඉදිරිපත් කිරීම ය. බොහෝ විට එය නිශ්චිත වගන්ති අඩංගු පනත් කෙටුම්පතක් ලෙස නො ව, දියාරු වගන්ති අඩංගු ''කොටුම්පත් රාමුවක්'' ලෙස ඉදිරිපත් කිරීමට වැඩි ඉඩක් ඇත. එයට හේතුව වන්නේ නිශ්චිත වගන්ති මගින් ආණ්ඩුවේ අරමුණු උවමනා වෙලාවට පෙර එළිදරව් වීම ය. ඒ ආකාරයට අවසාන මොහොත දක්වා සැඟවිය යුතු යම් ප්‍රතිපාදන සඟවා තබා ගැනීම යනු ආණ්ඩුවේ ව්‍යවස්ථා සෙල්ලමේ මූලික රීතියකි.

### සහන අය වැය සහ අසහන ව්‍යවස්ථාව:

අයවැය විවාදය පැවැත්වෙන කාලය අතරතුර යම් ආකාරයක ව්‍යවස්ථා කෙටුම්පතක් ව්‍යවස්ථා මණ්ඩලයට ඉදිරිපත් කිරීම මගින් තවත් වාසියක් ආණ්ඩුව විසින් අත්පත්කර ගනු ඇත.

එනම්, අය වැය පිළිබඳ සෝෂාව තුළ ව්‍යවස්ථා කෙටුම්පතේ වැදගත්කම අවතක්සේරු කිරීම ය. විශේෂයෙන් ම, මහජනයා විස්මයට පත්වන ''සහන අයවැයක්'' ඉදිරිපත් කිරීමෙන් එම තත්වය තව දුරටත් වාසියට හරවාගත හැකිය. ව්‍යවස්ථා ක්‍රියාවලියට එරෙහිව මතුවන මහජන විරෝධය පෙන්වා බෙදුම්වාදී අධිරාජ්‍යවාදී බලවේගවලින් සහන ලබාගැනීමේ හැකියාව ද ආණ්ඩුව සතු වේ. එම නිසා ව්‍යවස්ථා කෙටුම්පත ඉදිරිපත් කිරීමට පෙර අය වැය විවාදය පැවැත්වීම සහ සහන අයවැයක් ගෙන ඒම යන කාරණා දෙක ම ආණ්ඩුවේ පැත්තෙන් වාසි සහගත වේ. ආණ්ඩුව විසින් ව්‍යවස්ථා සංශෝධනය සම්මත කොට බෙදුම්වාදී බලවේගවල අවශ්‍යතාව ඉටුකළ පසු ව, එම බලවේග විසින් ශ්‍රී ලංකාවේ මධ්‍යම රජයට සහන සැලසීමට වැඩි උනන්දුවක් නො දක්වන බවට කිසිදු සැකයක් නැත. ඉන් පසුව ඔවුන්ට, වඩා වැදගත් වන්නේ ව්‍යවස්ථා සංශෝධනය මගින් බිහිවන ෆෙඩරල් රාජ්‍යය වෙන ම රාජ්‍යයක් දක්වා යන ගමනට සහාය දැක්වීමය.

## කාරක සභා අවස්ථාවේ බලහත්කාරය යොදා ගැනීම:

එසේ අයවැය සෝෂාව තුළ ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයට ඉදිරිපත් කෙරෙන ව්‍යවස්ථා කෙටුම්පත් රාමුවට බරපතළ බෙදුම්වාදී ප්‍රතිපාදන ඇතුළු නො කරන බවට ද කිසිදු සැකයක් නැත. එසේ වුවත් පසු ව ඉවත්කර ගැනීම මගින් කෙටුම්පතට සුජාතභාවය ලබාගැනීම සඳහා ම ඉලක්ක කරමින් ඊට යම් විවාදාත්මක ප්‍රතිපාදන ඇතුළු කෙරෙනු ඇත. එසේ ම, මීට පෙර 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය සහ පසුගියදා තුනෙන් දෙකේ බහුතර බලයෙන් සම්මත කළ පළාත් සභා මැතිවරණ පනත සම්මත කිරීමේදී ආණ්ඩුව විසින් පරීක්ෂාවට ලක්කොට සාර්ථක වූ ක්‍රමවේදය පාර්ලිමේන්තුවට ඊළඟට ගෙන ඒමට නියමිත 20 වැනි ව්‍යවස්ථා සංශෝධනයේදීත් යොදා ගන්නා බවට කිසිදු සැකයක් නැත. එනම් පාර්ලිමේන්තුවට සහ ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන පනත් කෙටුම්පතට විවාදාත්මක ප්‍රතිපාදන ඇතුළු නො කර, ඒවා පසුව කාරක සභා අවස්ථාවේදී සංශෝධන ලෙස ඉදිරිපත් කිරීමේ ප්‍රජාතන්ත්‍ර විරෝධි බලහත්කාරී

ක්‍රමවේදය ආණ්ඩුව විසින් සාර්ථක ව නැවත අත්හදා බලනු ඇත. පසුගිය අවස්ථාවල විපක්ෂ බලවේග එම උපක්‍රමයට ගොදුරු වූ ආකාරය අනුව ආණ්ඩුව ඒ පිළිබඳව සුබවාදී ව කටයුතු කිරීම පුදුමයට කරුණක් නො වේ.

ආණ්ඩුව විසින් අවසානයට සම්මත කරගන්නා ලද පළාත් සභා මැතිවරණ කල්දැමීමේ පනතට තුනෙන් දෙකේ විශේෂ බහුතරය ලබාගත් බැවින් ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිත 20 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ ''ව්‍යාජ කෙටුම්පතට'', ඒ ආකාරයට ම විශේෂ බහුතරය ලබාගත හැකි යැයි ආණ්ඩුව විශ්වාස කරන බව පෙනේ. බරපතළ මහජන විරෝධයක් මගින් ඒකාබද්ධ විපක්ෂය තින්දෙන් අවදිකොට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මෛත්‍රී පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ට බලපෑමක් සිදු කිරීමට ජාතික බලවේග අසමත් වුවහොත් එම තත්වය වෙනස් නො වනු ඇත. ඒ අනුව ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයට ඉදිරිපත් කරන ව්‍යාජ කෙටුම්පතට තුනෙන් දෙකේ විශේෂ බහුතරය ලැබුනහොත් එය ඍජු ව අමාත්‍ය මණ්ඩලයට යොමු කළ යුතු වේ. එසේ නො මැති ව ඊට සාමාන්‍ය බහුතර අනුමැතිය පමණක් ලැබුනහොත් එම කෙටුම්පත පාර්ලිමේන්තුව හරහා අමාත්‍ය මණ්ඩලයට යොමු කිරීමට සිදුවේ.

## ව්‍යාජ කෙටුම්පත පළමුව සැබෑ කෙටුම්පත පසුව:

ඉන් පසු ව එම කෙටුම්පතේ අන්තර්ගතය පිළිබඳ ව සමාජයේ මතුවන කථිකාව අනුව, අමාත්‍ය මණ්ඩලය තුළදී ද ඊට යම් සංශෝධන සිදු කිරීමේ හැකියාව ඇත. විශේෂයෙන් ම, ඉහත සඳහන් කළ ආකාරයට පාර්ලිමේන්තුවේ කාරක සභා අවස්ථාවේ විවාදයේදී නැවත ගෙන ඒමේ කූඨ අරමුණ සහිත ව මහජනයා ගොනාට ඇන්දවීම සඳහා යම් ප්‍රතිපාදන තාවකාලික ව  සංශෝධනය කිරීමට හෝ ඉවත් කිරීමට ඉඩ ඇත. එසේ වුවත් කෙටුම්පත ගැසට් කිරීමෙන් පසුව මතුවන තත්වය අනුව, ශ්‍රේෂ්ඨාධිකරණයේදී ඉවත්කර ගැනීමට ප්‍රතිඥාදීම මගින් කෙටුම්පතට සුජාතභාවය ලබාදීම සඳහා එසේ ඉවත්කර ගැනීමේ අරමුණ සහිත ව යම් ප්‍රතිපාදන ඇතුළු කිරීමට හෝ වෙනස් කිරීමට ආණ්ඩුව විසින් කටයුතු කරනු ඇත.

විශේෂයෙන්ම ජනමතවිචාරණයක් අවශ්‍ය වන වගන්තිවලට කරනු ලබන සංශෝධන එසේ ශ්‍රේෂ්ඨාධිකරණයේදී ඉවත්කර ගැනීම මගින් ජනමතවිචාරණය වළක්වාගත හැකිය. උදාහරණයක් ලෙස, ඒකීයභාවයට සහ බුද්ධාගමට ප්‍රමුඛස්ථානය ලබාදීමට අදාළ වගන්තිවලට කරනු ලබන යම් රූපලාවන්‍ය වෙනස්කම් එසේ ඉවත්කර ගැනීම මගින් කෙටුම්පතට ඉහළ සුජාතභාවයක් ලබාදීමට ආණ්ඩුව උත්සාහ කරනු ඇත. එම වෙනස් කම් යෝජනා කිරීමේ මූලික අරමුණ ද ඒවා පසුව ඉවත් කර ගැනීම බවට තර්ක කළ හැකිය.

## නව ව්‍යවස්ථා බොරුව සහ ජනමත විචාරණ බොරුව:

ආණ්ඩුව ජනමත විචාරණයකට යාමට බිය නො වන බව විවිධ පාර්ශ්ව විසින් පුරසාරම් දෙඩුව ද, අනවශ්‍ය ලෙස එවැනි අනතුරකට මුහුණදීම මගින් තම අරමුණු අනතුරේ හෙළීමට බෙදුම්වාදීන් කටයුතු නො කරනු ඇත. කෙසේවෙතත් සුළුජාතික ඡන්ද පදනම මුල්කරගෙන ජනමත විචාරණයක් ජයග්‍රහණය කළ හැකි බවට රාජ්‍ය නො වන සංවිධාන ආණ්ඩුවට උපදෙස් දෙති. එහෙත් ජනමතවිචාරණ ප්‍රතිඵල කෙරෙහි ආණ්ඩු විරෝධී පොදු සමාජ මනෝභාවය මගින් ප්‍රභල බලපෑමක් ඇතිකරන බව ආණ්ඩුව මෙන් ම, බෙදුම්වාදී බලවේග ඉතා හොඳින් දනිති.

අනෙක් පැත්තෙන් ගත්විට ජනමත විචාරණයක් අවශ්‍ය වන ප්‍රබල සංශෝධන සඳහා තුනෙන් දෙකේ විශේෂ බහුතර කැමැත්ත ලබාගැනීම ඉතා දුෂ්කර බව, සාමාන්‍ය බහුතර බලයවත් නොමැති අගමැතිවරයා ඉතා හොඳින් දන්නා බවට සැකයක් නැත. පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බහුතර බලය ලබාගත නොහැකි වුවහොත් ජනමත විචාරණය පමණක් නොව සමස්ත ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය ම අහෝසි වේ. ඒ නිසා අත්‍යවශ්‍ය නො වන සංශෝධන ඉදිරිපත් කිරීම මගින් අවශ්‍ය ම දේ අනතුරේ හෙළිමට අගමැතිවරයා මෙන් ම, සෙසු බෙදුම්වාදී බලවේග ද කටයුතු නො කරනු ඇත. එහෙත් විපක්ෂ බලවේග නිදාවැටී සිටින තත්වයක් යටතේ තම දේශපාලන බලය තහවුරු කර ගැනීම සඳහා අගමැතිවරයා විසින් ජනමත විචාරණය යොදා ගැනීමට ඉඩ ඇත.

මේ වන විට සකස් කොට ඇති මෙහෙයුම් කමිටු වාර්තාව අනුව ඉතා පැහැදිලිව පෙනී යන්නේ එම සංශෝධන නව ව්‍යවස්ථාවක් සඳහා යෝජනා කෙරෙන ඒවා නො වන බව ය. ඒවා ඉදිරිපත් කෙරෙන්නේ පවතින ව්‍යවස්ථාවට අදාළ ව ගෙන එන සංශෝධන ලෙස ය. ඒ අනුව නව ව්‍යවස්ථාවක් පිළිබඳ ව හෝ ඒ සඳහා යොදාගන්නා ජනමතවිචාරණයක් ගැන කථා කිරීම හාස්‍යජනක වේ. නව ව්‍යවස්ථාවක් ජනමත විචාරණයකින් පරාජය වුවහොත් ඊට තුනෙන් දෙකේ බහුතර කැමැත්ත පාර්ලිමේන්තුවේදී ලැබී තිබුණද එය සම්පූර්ණයෙන් ම අහෝසි වේ. නමුත්, පවතින ව්‍යවස්ථාවට අනුව ගෙන එන සංශෝධන එසේ ජනමත විචාරණයකදී පරාජය වුවත් පාර්ලිමේන්තුවේ විශේෂ බහුතරයෙන් සම්මත වන කොටස් වලංගු වේ.

ආණ්ඩුව ජනමත විචාරණයකට යන බවට යමෙක් තර්ක කරන්නේ නම් එහි සම්භාවිතාව ඉතා අඩු බවට සහ එය යොදාගන්නේ පවතින ව්‍යවස්ථාව යටතේ බවට සැකයක් නැත. අලුත් ව්‍යවස්ථාවකට එකඟ නැති බව සහ විධායක ජනාධිපති ක්‍රමය ආහෝසි කිරීමට එකඟ නැති බව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නිලවශයෙන් ප්‍රකාශ කොට ඇත. එසේ නම් පවතින ව්‍යවස්ථාව යටතේ ජනමත විචාරණයකට යන්නේ කුමක් සඳහා ද? ඒකීය වගන්තිය එසේ ම තිබියදී රට ෆෙඩරල් කළ හැකි නම්, එහි වචන වෙනස් කිරීමට ජනමත විචාරණයකට යාම මගින් ඊට තුනෙන් දෙක'' අහිමි කරගන්නේ කුමකට ද?

## ෆෙඩරල් ලේබල් නැති ෆෙඩරල් ව්‍යවස්ථාව

බෙදුම්වාදී බලවේගවලට අවශ්‍ය වන්නේ 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන් ම බලාත්මක කිරීමට එරෙහි ව පවතින ව්‍යවස්ථාමය සහ පරිපාලන බාධක ඉවත්කර ගැනීම සහ ව්‍යවස්ථාව තුළින් ස්වයං පාලන සංකල්පය තහවුරු කර ගැනීම ය. මේ වන විට ලබාදී ඇති නඩු තීන්දුවක් අනුව ව්‍යවස්ථාවේ ඒකීය වචනය එසේ ම තිබියදී, ෆෙඩරල් බලතල සහ ස්වයං පාලන සංකල්පය තහවුරු කිරීමට හැකියාව ඇත. ඒ නිසා බෙදුම්වාදීන්ට නව

ව්‍යවස්ථාවක් හෝ පවතින ව්‍යවස්ථාව යටතේ ජනමත විචාරණයකට තුඩුදෙන සංශෝධනයක් අවශ්‍ය වන්නේ නැත. ඔවුන් විසින් එවැනි යෝජනා ගෙන එන්නේ ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය සාධාරණීකරණය කිරීමේ කූඨ සටන් පාඨයක් ලෙස පමණි. ඒ නිසා ආණ්ඩුව විසින් ආරම්භ කර ඇති ව්‍යවස්ථා සෙල්ලමේ කූඨ උපක්‍රම සහ එහි අවසානය පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගැනීම ඉතා වැදගත්වේ. එසේ ආණ්ඩුවේ මාර්ග සිතියම පිළිබඳ ගැඹුරු අවබෝධයකින් තොර ව එය පරාජය කළ නොහැකිය. ඒ නිසා ආණ්ඩුවේ ක්‍රීඩා සැලසුම අවබෝධ කර ගැනීම සහ එය එළිදරව්කිරීම සඳහා සමාජ කථිකාවක් වහා ම ආරම්භ කළ යුතු ය.

එසේ නොමැති ව එම මෙහෙයුම පරාජය කිරීම පහසුවන්නේ නැත. විශේෂයෙන් ම ඒකාබද්ධ විපක්ෂයට උපදෙස් ලබාදෙන සමහර විද්වතුන් විසින් බෙදුම්වාදීන්ට උවමනා ආකාරයට එම කථිකාව අවුල් කරන නිසා තත්වය වඩාත් දුෂ්කර වී ඇත. ඒකාබද්ධ විපක්ෂය ව්‍යවස්ථා සම්පාදක ක්‍රියාවලිය තුළ දිගින් දිගට ම රැඳී සිටීම නිසා පමණක් නො ව, ආණ්ඩුවේ සමස්ත උපාය මාර්ගය එළිදරව් කරනවා වෙනුවට එහි යම් යම් කොටස් පමණක් අල්ලාගෙන අදහස් දැක්වීම නිසා මහජනයා තවදුරටත් වික්ෂිප්ත වේ. සතුරාගේ යුද රහස් නො දන්නා ජෙනරාල්ලා යුද්ධ දිනන්නේ කෙසේ ද? යුද්ධ දිනූ ජෙනරාල්ලා නිදා සිටිත් නම් සතුරා කුමක් කරනු ඇත් ද?

## බෙදුම්වාදීන් "මරාගෙන මැරී" ඉල්ලන්නේ මොනවාද?:

ආණ්ඩුවේ උපායමාර්ගික සැලසුම හෙවත් මාර්ග සිතියම පරාජය කිරීම සඳහා පළමුව එය කුමක්දැයි තේරුම්ගත යුතු ය. ඒ සඳහා දැන් ඉදිරිපත් කිරීමට නියමිත කෙටුම්පත දෙස පැතිකඩ 6 කින් බැලිය හැකිය. ඒවා මහජන අවබෝධය සහ සංවාදය සඳහා මෙසේ සංක්ෂිප්ත ව දැක්විය හැකිය. ඒ සඳහා පළමුවෙන් ම බෙදුම්වාදීන් දිර්ඝ කාලයක් තිස්සේ ඉල්ලා සිටි ව්‍යවස්ථා සංශෝධන මොනවාදැයි හඳුනාගත යුතු ය. 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් ඔවුන්ට අවශ්‍ය වන මූලික ෆෙඩරල් ව්‍යුහය ලබාගත්ත ද ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා ඊට එරෙහි ව පැන වූ

ව්‍යවස්ථාමය සහ පරිපාලන බාධක ඉවත්කර ගැනීම දැන් ඔවුන් මුහුණ දෙන අභියෝගයයි. ඊට සාපෙක්ෂ ව, ඔවුන් ඉල්ලා සිටින සහ ආණ්ඩුව ලබාදීමට සූදානම්වන බෙදුම්වාදී ව්‍යවස්ථා ප්‍රතිපාදන 8ක් හඳුනාගත හැකිය.

1) ආණ්ඩුකාරයාගේ බලතල දුර්වල කොට එය නාමික තනතුරක් බවට පත් කිරීම. එවිට 13 වැනි සංශෝධනයේ පොලිස් සහ ඉඩම් බලතල මෙන් ම, මහ ඇමති අරමුදල් බලය ඇතුළු බරපතළ බෙදුම්වාදී බලතලවලට අදාළ ප්‍රඥප්ති ගෙන එනවිට ඒවා සම්මත කිරීමට එරෙහි ව ආණ්ඩුකාරවරයා සතු බලතල භාවිතා කිරීමට නොහැකි වේ. එසේ ම, ඒ මගින් සමස්ත පළාත් රාජ්‍ය සේවයම මහ ඇමැතිවරයාගේ විධායක බලයට යටත් කෙරෙනු ඇත.

2) දැනට මධ්‍යම ආණ්ඩුව සතු ජාතික ප්‍රතිපත්ති හැදීමේ බලය පළාත් සභාවලට පැවරීම. ඒ මගින් පළාත් බලතල ක්‍රියාත්මක කිරීමේදී ඊට මැදිහත් වීම සඳහා යොදාගත හැකි උපාංගයක් මධ්‍යම ආණ්ඩුවට අහිමි කෙරේ.

3) මහ ඇමති අරමුදල් පිහිටුවීම ඇතුළු ස්වාධීන මූල්‍ය බලතල පළාත් සභාවලට ලබාදීම. එවිට දෙමළ ඩයස්පෝරාවේ කළු සල්ලි ඇතුළු ජාත්‍යන්තර අරමුදල් මධ්‍යම ආණ්ඩුවේ පාලනයකින් තොර ව භාවිත කිරීමට බෙදුම්වාදී බලවේගවලට ඉඩ ලැබේ.

4) පළාත් ආණ්ඩුව විසින් භාවිත කරන යම් බලතල ප්‍රමාණයකට අදාළව මධ්‍යම ආණ්ඩුව විසින් මැදිහත්වීමට ඉඩ සලසන ''සමගාමී බලතල ලැයිස්තුව'' ඉවත් කිරීම. ඒ මගින් එක් පැත්තකින් මධ්‍යම ආණ්ඩුව සහ පළාත් බල ඒකක අතර පරමාධිපත්‍යය බලය බෙදී වෙන් වී ක්‍රියාත්මක වන බව තහවුරු කළ හැකිය. එය ජාත්‍යන්තර ව වෙන ම රාජ්‍යයක් ප්‍රකාශයට පත් කිරීමේදී ස්වයං පාලන සංකල්පයට අදාළව පරීක්ෂාවට ලක්වන මූලධර්මයකි. අනෙක් පැත්තෙන් එමගින් පළාත් කටයුතුවලට මැදිහත්වීම සඳහා මධ්‍යම රජය සතු බලතල අහිමි වේ.

5) 13 වැනි සංශෝධනයෙන් දැනටමත් ලබාදී ඇති ඉඩම් බලතල තවදුරටත් ශක්තිමත් කිරීම. එවිට ඉඩම්වල අයිතිය සම්පූර්ණයෙන් ම පළාත් සභා යටතට පත්වන අතර මධ්‍යම රජයේ ව්‍යාපෘතියක් සඳහා ඉඩම් ලබාගැනීම පවා පළාත් ආණ්ඩුවේ අනුකම්පාවට යටත්වේ.

6) ව්‍යවස්ථා අධිකරණයක් පිහිටුවීම මගින් ව්‍යවස්ථාව නිර්වචනය කිරීම සඳහා දැනට ශ්‍රේෂ්ඨාධිකරණය සතුව පවතින බලය ''එන්.ජී.ඕ. අධිකරණයකට'' පැවරීම. පළාත් බලතල අයුතු ලෙස ක්‍රියාත්මක කිරීමට එරෙහි ව විධායකය සහ ව්‍යවස්ථාදායකය විසින් ගන්නා වූ නිත්‍යානුකූල තීන්දු පවා නිශ්ප්‍රභ කිරීමේ බලයක් එම අධිකරණයට ලැබේ.

7) දෙවන මන්ත්‍රණ සභාවක් පිහිටුවීම මගින් සහ එහි බහුතර සාමාජිකයන් පත්කිරීමේ බලය පළාත් සභාවලට ලබාදීම මගින් පාර්ලිමේන්තුවේ බලය දුර්වල කිරීම. ඒ මගින් අනාගතයේදී ව්‍යවස්ථා සංශෝධනයක් සිදුකිරීමේදී ඒ සඳහා එම ඊනියා දෙවන මන්ත්‍රී මණ්ඩලය හෙවත් සෙනෙට් සභාවේ විශේෂ බහුතර අනුමැතිය ගැනීමට සිදුවේ.

8) පළාත් ආණ්ඩු විසින් ගනු ලබන නීති විරෝධි තීන්දුවලට එරෙහිව සෘජුව සහ කඩිනමින් ක්‍රියාත්මක වීම සඳහා ජනාධිපතිවරයා සතු ව පවතින බලය පාර්ලිමේන්තුවට සහ ව්‍යවස්ථා අධිකරණයට පවරා එම බලය දුර්වල කිරීම.

**** මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යමක් ද ඇත. එනම් 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් පොලිස් බලතල උපරිමයෙන් ලබාදී ඇති බැවින් කොමිසම පිහිටුවීම හැර ඒ පිළිබඳ ව නව ව්‍යවස්ථා සංශෝධනය තුළ සඳහන් කිරීමවත් අවශ්‍ය නො වනු ඇත.***

## සීනි තැවරීමේ යෝජනාඃ

ඉහත සඳහන් කළ බෙදුම්වාදී යෝජනාවල බරපතළකම සැඟවීම සඳහා ආණ්ඩුව විසින් යොදා ගැනීමට ඉඩ තිබෙන 'සීනි තැවරීමේ'' ප්‍රතිපාදන 4ක් හඳුනාගත හැකිය. ඒවා මෙසේ දැක්විය හැකිය.

1) මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම මගින් මනාප ක්‍රමය අහෝසි කිරීම. ත්‍රෛනිකායික මහානායක හිමිපානන් වහන්සේ විසින් එවැනි ඉල්ලීමක් කළ බැවින්, විශේෂයෙන් ම උන්වහන්සේ ඉලක්ක කරමින් එම සීනි තැවරීම සිදු කෙරෙන බවට සැකයක් නැත.

2) රට බෙදීම නීත්‍යානුකූල ව කළ නො හැකි බවට යම් ආරක්ෂාකිරීම් මනසක් මහජනතාව තුළ ඇති කිරීම සඳහා ඊට අදාළ වචන ''ඒකීය වගන්තියට'' හෝ වෙනත් වගන්තියකට ඇතුළු කිරීම. ව්‍යවස්ථාවේ සෙසු ප්‍රතිපාදන මගින් ස්වයං පාලන ඒකකයක් බිහිකරන්නේ නම් එවැනි සීනි බෝල වචනවල බලයක් නැත. අවසාන වශයෙන් රට බෙදෙන්නේ ව්‍යවස්ථාවට අනුකූල ව නො ව, ඊට පරිබාහිර නීති විරෝධි ක්‍රියාමාර්ග මගිනි.

3) සුළු ජාතික අයිතිවාසිකම් සහ යම් ආර්ථික අයිතිවාසිකම් මූලික අයිතිවාසිකම් ලෙස පිළිගැනීම.

4) පළාත් පාලන ආයතනවලට වැඩි බලතල දීම. නමුත් එම බලතල පළාත් සභාව යටතේ ලබාදෙන අමතර බලතල ප්‍රමාණයකි. ඒ අනුව පළාත් පාලන ආයතනවලට ''තුන්වන'' බලතල ලැයිස්තුවක් නිර්දේශකොට ඒ මගින් සමගාමී ලැයිස්තුව ඉවත් කිරීමේ අනතුර සැඟවීමට ද ආණ්ඩුව උත්සාහ කරනු ඇත.

## මහජනයා සහ විපක්ෂය ගොනාට ඇන්දවීම සඳහා කරන දේඃ

මෙම ව්‍යවස්ථා සම්පාදක සෙල්ලම තුළ මහජනයා ගොනාට ඇන්දවීම සඳහා ඉවත්කර ගැනීමේ අරමුණ සහිත ව ඇතුළු කරනු ලබන යම් වගන්ති ප්‍රමාණයක් ද ඇත. සැබැවින්ම ඒවා සම්මත කිරීම සඳහා ජනමත විචාරණයක් අවශ්‍ය වේ. ප්‍රධාන වශයෙන්

එවැනි ප්‍රතිපාදන 03ක් හඳුනාගත හැකිය. එම ප්‍රතිපාදනවලට බෙදුම්වාදී න්‍යාය පත්‍රය තුළ තාක්ෂණික වැදගත් කමක් නැත.

1) ඒකීය වගන්තිය දියාරුකොට ව්‍යාජ ලෙස ''බෙදිය නොහැකි'' වැනි වචන ඊට ඇතුළු කිරීම.

2) බුද්ධාගමට හිමි ප්‍රමුඛස්ථානය වෙනස් කිරීම.

3. ජාතික ගීය දෙමළ භාෂාවෙන් ගැයීමට ඍජු ප්‍රතිපාදන ඇතුළු කිරීම.

මෙම වගන්ති ඉවත්කර ගැනීමට ශ්‍රේෂ්ඨාධිකරණයේදී ප්‍රතිඥාවක් ලබාදීම මගින් ආණ්ඩුව තම යෝජනාවලට සුජාතභාවයක් ආරෝපණය කරනු ඇත. ඒ මගින් ආණ්ඩුවේ යම් පාර්ශවලට, ''තමා රටේ ඒකීය භාවය සහ බුද්ධාගමට හිමි තැන අහිමි කිරීමට ඉඩ නොදුන් බවට'' ලකුණු දමා ගැනීමේ අවස්ථාවක් ද නිර්මාණය වේ. සමහර විට ඒකාබද්ධ විපක්ෂය ද තමා ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ දිගින් දිගටම රැඳී සිටිය බැවින් එම වගන්ති ඉවත් කිරීමට බලපෑම් කළ හැකි වූ බවට උදන් ඇනීමට ඉඩ ඇත. ආණ්ඩුවේ සැබෑ අරමුණට සාපේක්ෂ ව බලන විට එම වගන්ති වෙනස් නොකර ඉතිරි කිරීම මගින් ගැටළුවක් පැන නගින්නේ නැත. ව්‍යවස්ථාවේ ඒකීය වචනය එසේ ම තිබියදී, එසේ නැතහොත් ''ෆෙඩරල් ලේබලය'' නො මැතිව රට ෆෙඩරල් කිරීමේ ක්‍රමවේදය ඔවුන් දැන් සොයාගෙන ඇත.

## ජාත්‍යන්තර අධිකරණය සඳහා බෙදුම්වාදී සංකල්පඃ

බෙදුම්වාදීන්ට තමා විසින් අනාගතයේදී වෙන ම රාජ්‍යය ප්‍රකාශයට පත්කරන අවස්ථාවේදී ජාත්‍යන්තරය හමුවේ තම ක්‍රියාමාර්ග සාධාරණීකරණය කිරීම සඳහා සහ ස්වයං පාලන සංකල්පය තහවුරු කිරීම සඳහා යම් යම් ප්‍රතිපාදන ව්‍යවස්ථාවට ඇතුළු කිරීමේ අවශ්‍යතාවක් ඇත. එහෙත් ඒවායේ බරපතළකම මහජනයාට එක්වර ම තේරුම්ගත නො හැක. එවැනි තාක්ෂණිකව වැදගත් ප්‍රතිපාදන තුනක් හඳුනාගත හැකිය.

1) ව්‍යවස්ථාවේ 3,4,5 යන වගන්තිවලට සංශෝධන ඉදිරිපත් කරමින් මහජන පරමාධිපත්‍යය මධ්‍යම ආණ්ඩුව සහ පළාත් ආණ්ඩු අතර නිශ්චිතව බෙදීයන බව තහවුරු කිරීම. එහිදී තුන් වැනි වගන්තිය වෙනස් කිරීම සඳහා ජනමත විචාරණයක් අවශ්‍ය වන බැවින් එය ඉල්ලා අස්කර ගනිමින් 4 සහ 5 වගන්ති හරහා එම තාක්ෂණික උවමනාව ඉටුකර ගැනීමට බෙදුම්වාදීන් උත්සාහ කරනු ඇත. එසේ තහවුරු කෙරෙන සංකල්පය ''අනු පූරකතාවය'' ලෙස ද හැඳින්වේ.

2) සුළු ජාතික ජනතාවට ස්වයං තීරණ අයිතිය තිබෙන බවට ව්‍යවස්ථාව මගින් තහවුරු කිරීම සඳහා යම් ප්‍රතිපාදන සංකල්පීය වශයෙන් හෝ සුළු ජන අයිතිවාසිකම් ලෙස ව්‍යවස්ථාවට ඇතුළු කිරීම.

3) පළාත් පාලන ආයතනවලට වැඩි බලතල දීමේ මුවාවෙන් සමගාමී ලැයිස්තුව ඉවත් කිරීමේ භයානක කම ආවරණය කොට එහි අඩංගු බලතල තුන්වන ලැයිස්තුවක් ලෙස පළාත් පාලන ආයතන හරහා පළාත් සභා යටතටම පත් කිරීම. සමගාමී ලැයිස්තුව ඉවත් කිරීම මගින් මධ්‍යම රජයට සහ පළාත් වලට වෙන් වූ සහ අනන්‍ය වූ බලතල ප්‍රමාණයක් තිබෙන බව තහවුරු වේ. ඒ මගින් පරමාධිපත්‍යයයේ බලය බෙදී යාමේ බෙදුම්වාදී සංකල්පය තහවුරු වේ.

## කාරක සභා අවස්ථාවේ කූඨ සැලසුම:

ඉහත සඳහන් කළ ආකාරයට 13වැනි ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන් බලාත්මක කොට තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා යොදා ගන්නා ඍජු බෙදුම්වාදී ව්‍යවස්ථා සංශෝධන පිළිබඳ ව මහජන විරෝධය පැනනැගීමේ අවදානම ගැන ආණ්ඩුව ඉතා දැනුවත් ව කටයුතු කරන බවට කිසිදු සැකයක් නැත. එම නිසා එම සංශෝධන 8 අතුරින් ප්‍රබල විරෝධය මතුවිය හැකි ප්‍රතිපාදන 5කට අදාළව ආණ්ඩුව මේ වන විට සාර්ථක ව අත්හදා බලා ඇති කූඨ ක්‍රමවේදය වන කාරක සභා අවස්ථාවේදී සංශෝධන ඉදිරිපත් කිරීමේ ක්‍රමය යොදාගනු ඇත. ඒ අනුව ගැසට් කිරීමෙන් සහ

පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමෙන් පසුව ශ්‍රේෂ්ඨාධිකරනය හමුවේ අභියෝගයට ලක්වන මුල් පනත් කෙටුම්පතට එම වගන්ති ඇතුළත් නො කර හෝ ඒවා දියාරු ලෙස ඇතුළු කොට පසුව කාරක සභා අවස්ථාවේදී ඒවා සංශෝධන ලෙස බෙදුම්වාදීන්ට අවශ්‍ය ආකාරයට නැවත පනතට ඇතුළත් කෙරෙනු ඇත. එම ප්‍රතිපාදන 5 මෙසේ හඳුනාගත හැකිය.

1) ආණ්ඩුකාරවරයාගේ බලය අහිමි කිරීමට අදාළ තීරණාත්මක වගන්ති.
2) සමගාමී ලැයිස්තුව ඉවත් කිරීම සඳහා අනුගමනය කරන ප්‍රයෝගය.
3) මූල්‍ය බලයට අදාළ විවාදාත්මක ප්‍රතිපාදන.
4) ඉඩම් බලයට අදාළ බරපතල ප්‍රතිපාදන.
5) ජනාධිපති බලය දියාරු කිරීමට අදාල ගැටළු සහගත ප්‍රතිපාදන.

ඊට අදාළව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිර්දේශ කිරීමට ඉඩ ඇති සංශෝධන පවා ඉතා සූක්ෂම ව නො සලකා හරිමින් එම සංශෝධන ඉදිරිපත් කිරීමට ඉඩ ඇත.

## විස්මිත යෝජනා:

ව්‍යවස්ථා සෙල්ලම තුළ ඉහත සඳහන් කළ කූඨ ක්‍රියාවලට අමතර ව, වැඩි දුරටත් මහජනයා ගොනාට ඇන්දවීම සඳහා සහ ඒ මගින් තවදුරටත් ක්‍රියාවලියේ ආරක්ෂාව තහවුරු කර ගැනීම සඳහා ඉතා සුවිශේෂී සංශෝධනයකට ආණ්ඩුව පමණක් නො ව, බෙදුම්වාදීන් ද එකඟවීමට ඉඩ ඇත. එය මහජනයා, විශේෂයෙන් ම සිංහල ජනතාව වික්ෂිප්ත කිරීමට හෝ ''අන්දුන්-කුන්දුන්'' කිරීමට සමත් වන සංශෝධනයකි. ඒ මගින් ආණ්ඩුව ඉදිරිපත් කරන ව්‍යවස්ථා සංශෝධනය නිසා රටට කිසිදු අනතුරක් සිදු නො වන බවට ප්‍රබල මතයක් ගොඩ නැගිය හැකිය. එම සංශෝධන මගින් 13වැනි ව්‍යවස්ථා සංශෝධනය හරහා දැනට ව්‍යවස්ථාවට ඇතුළුකොට තිබෙන පළාත් 2ක් ඒකාබද්ධ කිරීමේ ප්‍රතිපාදනය සම්පූර්ණයෙන් ම ඉවත් කිරීමට හෝ සංශෝධනය කිරීමට හෝ ඉඩ ඇත.

නමුත් ජාත්‍යන්තර නීතියේ ප්‍රබල න්‍යායක් වන ''උටි පොසිඩෙටිස්'' (Uti Possidetis) සංකල්පය අනුව ස්වයං පාලන ඒකකයක් පළමුවෙන් ම නිර්මාණය කිරීමේදී එකඟ වූ දේශසීමා පසුව වෙනස් කළ ද එය වලංගු නො වේ. විශේෂයෙන් ම ජාත්‍යන්තර ගිවිසුමකට අනුව එකඟ වූ එම දේශසීමා පසුව එසේ වෙනස් කිරීම සිදු කරන්නේ නම් එය වලංගු නො වේ. උතුරු නැඟෙනහිර පළාත් දෙක ඒකාබද්ධ කොට එක්තරා මට්ටමක ස්වයං පාලනය සහිත පළාත් ආණ්ඩුවක් සඳහා දේශසීමා නිර්ණය කරනු ලබන්නේ ඉන්දු - ලංකා ගිවිසුම මගිනි. එම නිසා ජාත්‍යන්තර අධිකරණයකදී වෙනම රාජ්‍යයක් පිහිටුවීමට අදාළ තීරණ ප්‍රකාශ කිරීම්දී 'උටි පොසිඩෙටිස්''න්‍යාය අදාලකරගත හැකි වනු ඇත. දේශසීමා වෙනස් කෙරෙන්නේ අදාල පාර්ශ්ව වල එකඟතාවයන්ගෙන් නොවේ නම් එම ක්‍රියාවලියේ වලංගු භාවය තවදුරටත් අභියෝගයට ලක්වේ. ඒ අනුව අඩු තරමින් එම සංශෝධනයට පමණක් හෝ විරෝධය පළකිරීමට ටී.එන්.ඒ පක්ෂයට සිදුවනු ඇත. මෙම සංශෝධනය මගින් සියල්ල කණපිට පෙරළිය හැකි බැවින් ටී.එන්.ඒ. පක්ෂය සමස්ත සංශෝධනයට විරුද්ධ ව ඡන්දය ප්‍රකාශ කළ ද තුනෙන් දෙකේ බහුතරය ලබාගැනීම ආණ්ඩුවට ගැටළුවක් නො වනු ඇත.

## පාවාදීමේ බේදවාචකය:

ව්‍යවස්ථා සෙල්ලමට අදාළ මෙම මහා පින්තූරය විශ්ලේෂණය කිරීමේදී පෙනී යන්නේ ආණ්ඩුවේ උපාය මාර්ගික සැලසුම ජයග්‍රහණය කළ හොත් එය රටට මාරාන්තික වන බව නො වේ ද? නමුත් ඊට මුහුණ දෙන විපක්ෂ බලවේග හැසිරෙන්නේ එම අභියෝගයේ බරපතළකමට සාපෙක්ෂ ව නො වේ. නිල විපක්ෂය වන ටී.එන්.ඒ. පක්ෂය ආණ්ඩුවේ ''නීත්‍යානුකූල භාර්යාව'' ලෙස හැසිරෙමින් ඊට සහාය දක්වයි. අර්ධ නිල විපක්ෂය වන ජනතා විමුක්ති පෙරමුණ ආණ්ඩුවේ ''අනියම් භාර්යාව'' සේ ආණ්ඩුවට අවශ්‍ය වේලාවට සහ අවශ්‍ය ප්‍රමාණයට සහාය ලබාදේ. ඒකාබද්ධ විපක්ෂය ප්‍රේක්ෂකයකු ලෙස විටෙක අත්පුඩි ගසමින් සහ විටෙක 'හූ' කියමින් සිදු වෙන දේ නරඹමින් සිටියි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු ඉතිහාසයේ සිදුවන බරපතළම පාවාදීම නාට්‍යානුසාරයෙන් සිදුකෙරන විට විපක්ෂ බලවේග ඍජු ව සහ වක්‍ර ව මෙන් ම, නිහඬව සහ ඝෝෂා කරමින් ඊට සහාය දක්වනු ඇත. එම තත්වය වෙනස් කළ හැක්කේ ඇත්තට සහ බොරුවට නිදා සිටින විපක්ෂ බලවේගවල ''කකුල්වලට වෙඩි තබා'' ඔවුන් සැබෑ ලෙස ම අවදි කිරීමෙන් පමණි. මෙතෙක් කාලයක් සිදුකළ ආකාරයට උඩට වෙඩි තැබීමෙන් පමණක් එය කළ නො හැකි බව මහජනයා තේරුම් ගත යුතු ය. එසේ නො වන්නේනම් එම පාවාදීම ශ්‍රී ලංකාවේ ඉතිහාසය ද අවසන් කරමින් අවසන් වනු ඇත. ඉන්පසු උදාවන්නේ ජාත්‍යන්තර මැදිහත්වීම සහිත ව සිදු කෙරෙන රට දෙකඩ කිරීමේ ක්‍රියාවලිය තුළ සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනතාව එකිනෙකාට එරෙහි ව අවි ඔසවන අවාසනාවන්තයින්ගේ හෝරාවයි.

# 02

## ව්‍යවස්ථා සෙල්ලම තුළ වරදවා ගැනීම් සහ පාවාදීම්

යහපාලන ආණ්ඩුව බලයට ගෙන ඒම සඳහා සකස් කෙරුණු මහා උපාය මාර්ගික සැලසුම තුළ ව්‍යවස්ථා සංශෝධනයට ඉතා වැදගත් සහ තීරණාත්මක ස්ථානය හිමි විය. ඊට ප්‍රධාන වශයෙන් හේතු 3ක් මුල් විය. පළමුවැන්න, අංක ගණිතමය උවමනාවකි. එනම්, මහින්ද රාජපක්ෂගේ ඡන්ද පදනමින් සුළු ජාතික ඡන්ද ප්‍රමාණයක් ගලවා ගැනීම ය ඒ සඳහා කෘත්‍රිමව නිර්මාණය කළ ජාතිවාදී ගැටුම් ද යොදා ගැනුණි. දෙවන හේතුව වන්නේ යුද්ධය පරාජය වීමෙන් පසු ව ජාත්‍යන්තර බෙදුම්වාදී බලවේග විසින් මානව හිමිකම් යොදා ගනිමින් කේවල් කරනු ලබන බෙදුම්වාදී ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලියට සුජාතභාවය ලබාදීම ය. තුන්වැනි හේතුව වන්නේ ප්‍රජාතන්ත්‍රවාදයට සහ යහපාලනයට එරෙහි ව පවතින ප්‍රධාන බාධක ලෙස ස්ථානගත කළ මහින්ද රාජපක්ෂ සහ ඒකාධිපති ව්‍යවස්ථාව යන දෙක ම ''පරාජය'' කිරීමේ අවශ්‍යතාව සාධාරණීකරණය කිරීම ය.

ඒ අනුව ව්‍යවස්ථා සංශෝධනය ජනාධිපතිවරණයේදී ප්‍රධාන පොරොන්දුවක් ලෙස මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් ඉදිරිපත් කරන්නට යෙදුණි. ඉන්පසුව 19 වැනි සංශෝධනය මගින් ජනාධිපතිවරයාගේ බලය දුර්වල කොට අගමැතිවරයා අතට එම

බලතල ලබාගැනීම සිදු කෙරිණි. එය ඉදිරි ක්‍රියාමාර්ග සඳහා පූර්ව කොන්දේසියක් හෙවත් අවශ්‍යතාවකි. එහිදී 19 වැනි සංශෝධනයට සද්භාවය ආරෝපණය කිරීම සඳහා 20 වැන්නක් ද පොරොන්දු වූ නමුත් එය ඉටුකරනු ලැබුවේ නැත. ඒ මගින් ඉදිරි ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය අවතක්සේරු වීම වළක්වා ගැනුණි. ඒ නිසා දැන් අලුත් ව්‍යවස්ථාවක් කෙසේවෙතත්, වෙනත් 20 වැනි සංශෝධනයක් සාධාරණීකරණය කිරීමට හැකි වී ඇත. කෙසේවෙතත් මහ මැතිවරණයේදී අගමැතිවරයා විසින් නව ව්‍යවස්ථාවක් සහ විධායක ජනපති ක්‍රමය අහෝසි කිරීම පිළිබඳව නව වටයකින් පොරොන්දු ලබාදුණි. එහෙත් ඔහුට ඒ සඳහා අවශ්‍ය වන පාර්ලිමේන්තුවේ 2/3 බලය කෙසේවෙතත් සාමාන්‍ය බහුතර බලයවත් ලැබුණේ නැත. ඔහු විසින් 19වැනි සංශෝධනයට ජාතික ආණ්ඩු සංකල්පය ඇතුළු කිරීම තුළින් පෙන්වන්නේ ආණ්ඩුවට ඒ පිළිබඳව පූර්ව අවබෝධයක් තිබූ බව ය.

අවසානයේදී රනිල් වික්‍රමසිංහ අගමැතිවරයාට පාර්ලිමේන්තුවේ විශේෂ බහුතරය නොමැති නිසා ම පමණක් නො ව, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලියට පටලවා ගැනීම සඳහා නව උපක්‍රමයක් අවශ්‍ය විය. ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් හරහා ව්‍යවස්ථාව සම්පාදනය කිරීමේ ක්‍රමය හඳුන්වාදෙන්නේ ඊට අනුව ය. එදා 2000 ව්‍යවස්ථා පැකේජය ගිනි තබා පරාජය කිරීමට රනිල් වික්‍රමසිංහ මහතාට හැකි වන්නේ චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිණියට ඒ පිළිබඳ අවබෝධයක් නො තිබූ නිසා ය. කෙසේවෙතත් ඒ සඳහා 1972දී ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් පිහිටුවීම සඳහා මහජන අනුමැතිය ලබාගත් ආකාරයට ඔහුට පාර්ලිමේන්තු මැතිවරණයේදී මහජන අනුමැතිය ලැබෙන්නේ නැත. ඊට අමතරව එවැනි ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් පිහිටුවීම සඳහා ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන නොමැත. එවැනි තත්වයක් තුළ එවැන්නක් පිහිටුවීම සඳහා සමස්ත පාර්ලිමේන්තුවේ ම අනුමැතිය ලබාගැනීමට හැකිවීම රනිල් වික්‍රමසිංහ මහතාගේ සුවිශේෂී ජයග්‍රහණයකි.

ඒකාබද්ධ විපක්ෂයට විපක්ෂයේ බහුතර මන්ත්‍රී පදනම තිබියදී සියලු පාර්ලිමේන්තු සම්ප්‍රදායන්ට පිටුපාමින් ඔවුන්ට විපක්ෂ නායකකම අහිමි කර තිබූ තත්වයක් යටතේ පවා එම නව ක්‍රියාවලියට ඔවුන් ඇතුළුකර ගැනීමට ආණ්ඩුව සමත් විය. එය ආණ්ඩුවේ සමත්කමකට වඩා, ආණ්ඩුවට උපදෙස් දෙන පිරිස් වල උපදෙස් අනුව කටයුතු කරන විපක්ෂයේ උපදේශකයන්ගේ දක්ෂ කමක් ලෙස හැඳින්වීම වඩා සාධාරණ විය හැකිය. මහජනයාගේ පැත්තෙන් නව ව්‍යවස්ථාවක් සඳහා කිසිදු ඉල්ලීමක් නො තිබුණ ද 1977 සිට එවැනි ඉල්ලීමක් තිබෙන බවට ව්‍යාජ මත සෑදීමට එම උපදේශකයන්ට හැකිවිය. ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය ප්‍රතික්ෂේප කිරීමට නීතිමය සහ සාදාචාරමය නිදහසට කාරණා කෙතෙකුත් තිබියදී ඒකාබද්ධ විපක්ෂයට එසේ කළ නො හැකි වන්නේ ඔවුන්ගේ උපදේශකයින් ඉතා දක්ෂ ලෙස ආණ්ඩුවේ උවමනාව ඉටු කළ බැවිනි.

ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය තුළට ඇතුළුවීමෙන් පසුව සියලු විපක්ෂ බලවේගවල හැසිරීම එක සමාන විය. ටී.එන්.ඒ. පක්ෂය ආණ්ඩුව විසින් තමා වෙනුවෙන් ඉටු කරන භූමිකාවට කොන්දේසි විරහිත ව සහය දීම පිළිබඳ ව විශේෂයෙන් සඳහන් කළ යුතු නැත. නිල විපක්ෂය ඒ ආකාරයට ආණ්ඩුවේ 'භාර්යාවගේ' භූමිකාව ඉටු කරයි. එහිදී ජනතා විමුක්ති පෙරමුණ විසින් ඉටු කරන්නේ 'අනියම් භාර්යාවගේ' භූමිකාව බව පෙනේ. ඔවුහු අද, එදා රෝහණ විජේවීරයන් දැරූ මතයට සම්පූර්ණයෙන් ම ප්‍රතිවිරුද්ධ මතයක සිට ආණ්ඩුවට සහාය දෙති. ඒ නිසා ඔවුන් පිළිබඳ ව කතා කිරීම එලක් නොමැති ක්‍රියාවකි. එසේ වුවත් ඒකාබද්ධ විපක්ෂයට ආණ්ඩුව ඉදිරියේ හීලෑ වීමට කිසිදු සදාචාරාත්මක අයිතියක් නැත. එසේ කිරීම ඔවුන් විසින් ඔවුනට ඡන්දය දුන් ජනතාව පාවාදීමකි. මහින්ද රාජපක්ෂ මහතාගේ මුහුණ පෙන්වා ඡන්දය ලබාගත් කිසිදු මන්ත්‍රීවරයකුට ආණ්ඩුව සමඟ ව්‍යවස්ථා මණ්ඩලයක වාඩිවීම සඳහා ජනවරමක් ලැබී නැත.

ආණ්ඩුව විසින් ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය පත් කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන්ගේ අනුමැතිය ලබාගත් යෝජනාව

අනුව එම මණ්ඩලයේ උපකමිටුවල සාකච්ඡා මාධ්‍යයට නිරාවරණය කළ යුතු ය. නමුත් ආණ්ඩුව විසින් එම පොරොන්දුව පූර්ණ වශයෙන්ම උල්ලංඝනය කිරීමේදී ඒකාබද්ධ විපක්ෂය නිහඬ ව නිවට බලා සිටියේය. එය මහජනයාගේ අයිතිය පාවාදීමකි. එසේ ම මෙහෙයුම් කමිටුව විසින් යෝජනාවේ සඳහන් නොවූ අමතර කමිටු පත්කිරීමේදී සහ උප කමිටු තුළ විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ අදහස් නොසලකා වාර්තා සකස් කිරීමේදී ඒකාබද්ධ විපක්ෂය නිහඬ ව ඉවසා සිටියාය. එක් උප කමිටුවකින් ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීවරයා ඉල්ලා අස්වූ විට ඒ සඳහා යෝජනා වූ උදය ගම්මන්පිල මන්ත්‍රීවරයාට ආණ්ඩුව විසින් එම අවස්ථාව ලබා දුන්නේ නැත. ඒ පිළිබඳ ව සියලු දෙනා නිහඬ වතින් ම පිළිතුරු දුණි. අඩුතරමින් ආණ්ඩුව විසින් මහජනයා අඳුරේ තබන විට මෙහෙයුම් කමිටු වාර්තා ''එළියට දැමීම'' මගින් ඊට ප්‍රතිචාර දැක්වීමටවත් ඔවුන්ට ධෛර්ය නො තිබුණි.

ව්‍යවස්ථා සම්පාදක ක්‍රියාවලිය අගමැතිවරයා ප්‍රමුඛ ඔහුගේ උපදේශකයින් වන ජයම්පති වික්‍රමරත්න සහ එම්.ඒ සුමන්තිරන් මන්ත්‍රීවරුන්ට උවමනා ආකාරයට ඉදිරියට ගමන් කරන විට ඊට එරෙහි ව ඔවුන් විසින් ඇතුළේ සටනක් නො කළා පමණක් නොව එළියේ ද සටනක් කළේ නැත. එම ක්‍රියාවලියෙන් උපදින්නේ රටට හතුරු ව්‍යවස්ථාවක් බව මහජනයාට යන්තමින් හෝ අනතුරු ඇඟවීමටවත් ඔවුන් ක්‍රියා කළේ නැත. අඩුතරමින් අත්පත්‍රිකාවකින්, සම්මන්ත්‍රණයකින් හෝ යම් අනතුරු ඇඟවීමක් නො කිරීමට ඔවුහු වගබලාගත්හ. ඒ නිසා ම ජාතික බලවේග වලට ද එම ක්‍රියාවලියේ අනතුර පිළිබඳ ව මහජනයාට තේරුම් කිරීම දුෂ්කර විය. විපක්ෂය සම්බන්ධ වී කරනු ලබන ක්‍රියාවක් මගින් රටට මහා අනතුරක් විය නො හැකි බවට මහජනයා විසින් කල්පනා කිරීම පුදුමයක් නො වේ. එම ක්‍රියාවලියෙන් ඉවත් වී එහි භයානකකම රටට එළිදරව් කරන ලෙස ජාතික බලවේග විසින් කොතෙක් ඉල්ලීම් කළත් ඔවුන් ඊට යහපත් ප්‍රතිචාරයක් දැක්වූයේ නැත.

අවසානයේදී ත්‍රෛනිකායික මහා නායක ස්වාමීන් වහන්සේ විසින් නව ව්‍යවස්ථාවක්, හෝ ව්‍යවස්ථා සංශෝධනයක් මේ මොහොතේ රටට අවශ්‍ය නො වන බවට දෙනු ලැබූ උපදේශයන්ට ද ඒකාබද්ධ විපක්ෂය නිසි ගෞරවයෙන් සැලකිල්ල දක්වූයේ නැත. එහිදී උන්වහන්සේ සඳහන් කළේ එම ක්‍රියාවලියට මහජන අනුමැතිය ලැබී නැති බැවින් සහ එය බාහිර පාර්ශ්වවල බලපෑමට යටත් වූ ක්‍රියාවලියක් බැවින් සමස්තයක් ලෙස එම ක්‍රියාවලියම අත්හැරිම සුදුසු බවය. නමුත් ඇතුළේ සිටීම මගින් තොරතුරු දැනගත හැකි බවට සහ එම ක්‍රියාවලිය කල්දැමිය හැකි බවට බොළඳ තර්ක ඉදිරිපත් කරමින් ඒකාබද්ධ විපක්ෂය ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය තුළ දිගින් දිගටම රැඳී සිටීමට තීරණය කළාය. එහිදී ඔවුන් මහානායක හිමිවරුන්ගේ බසට කන්දී ව්‍යවස්ථා ක්‍රියාවලියෙන් ඉවත්වීමට තීන්දු නොකිරීම මගින් මහා සංඝරත්නයේ මතයට ගරු කිරීමට අදාළව ඔවුන් සහ ආණ්ඩුව අතර කිසිදු වෙනසක් නැතැයි ඔප්පු කළේය. එය ඓතිහාසික දේශපාලන වරදක් බව දේශපාලනයේ 'අයන්න' දන්නා අයකුට වුව ද වැටහේ.

දැන් අවසන් වාර්තාව මෙහෙයුම් මණ්ඩලය හරහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අතට සහ මහජනයාට ලැබී ඇත. දැන් තවදුරටත් දැන ගැනීමට ''තොරතුරක්'' ඇත්නම් ඒ ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත පමණි. එහි අවසන් වගන්ති නිශ්චිත ව කිව නො හැකි වුවත් ආණ්ඩුව විසින් එහි අන්තර්ගත කිරීමට නියමිත මොනවාදැයි දළ වශයෙන් හෝ අවබෝධයක් ඒකාබද්ධ විපක්ෂයට නැද්ද? එවැනි අවබෝධයක් තිබෙනම් ඔවුන් විසින් වහාම මහජනයා දැනුම්වත් කොට පාර්ලිමේන්තුවේදී ඊට තුනෙන් දෙකේ විශේෂ බහුතර කැමැත්ත අහිමි කිරීම සඳහා සැලසුම් සහගත ව ක්‍රියාත්මක විය යුතු ය. එවැනි අවබෝධයක් ඔවුන්ට නො මැතිනම් රටට දෙවියන්ගේ පිහිට පැතීම හැර අන් විකල්පයක් මහජනයාට නැත. පසුගියදා ශ්‍රේෂ්ඨාධිකරණය පවා හෑල්ලුවට ලක්කරමින් සහ පනතක් සම්මත කිරීමට අදාළ ප්‍රජාතන්ත්‍රවාදී පටිපාටි සම්පූර්ණයෙන්ම උල්ලංඝණය කරමින් පළාත් සභා මැතිවරණ පනත බලහත්කාරයෙන් සම්මත කරන අවස්ථාවේදී ඊට තුනෙන් දෙකේ විශේෂ බහුතර

කැමැත්ත අහිමි කිරීමට ඒකාබද්ධ විපක්ෂය ප්‍රබල භූමිකාවක් ඉටු කළේ නැත. එය චෝදනාවක් නොව සාමාන්‍ය මහජනයා පවා කථා බහ කරන තොරතුරකි. ඒ මගින් ආණ්ඩුවට විශේෂ බහුතරය කළමනාකරණය කළ හැකි බවට සියලු පාර්ශ්ව අතර විශ්වාසය ඇතිවිය. එය, ඊළඟ ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත පරාජය කිරීම සඳහා උපක්‍රම තේරීමේදී, බරපතළ අවාසිදායක තත්වයකි.

වවුලන් එක ගසක සිට තවත් ගසකට මාරුවන්නේ පළමු ගසට වඩා දෙවන ගස සරුසාරව එල දරන්නේ නම් පමණි. උන් කොළ ඇති ගසක සිට දර ඉපලකට පියඹා යන්නේ නැත. දේශපාලන වවුලන් පිල් මාරුකරන්නේ අනෙක් පිල දේශපාලන බලය පෙන්වන තරමට සාපේක්ෂ ව ය. මුදල් හුවමාරු මගින් ඔළුගෙඩි මාරු සිදුකිරීම පිළිබඳ අත්දැකීම් අප රටේ බහුල ව ඇතත්, ඊළඟ මැතිවරණයේදී ඡන්දය දිනීමට හිතන මන්ත්‍රීවරුන් මුදල් මෙන්ම දේශපාලන තත්වය ද සැලකිල්ලට ගන්නා බව ප්‍රායෝගික සත්‍යයකි. රට පාවා දෙන පනතකට ඡන්දය ප්‍රකාශකර ආපසු ගමට යා නො හැකි දේශපාලන තත්වයක් රට තුළ තිබේනම් මන්ත්‍රීවරුන් ඡන්දය දීමට පෙර දෙවරක් සිතනු ඇත.

විශේෂයෙන් ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ට එම තත්වය වැඩි වශයෙන් දැනෙනු ඇත. එයට හේතුව ඔවුන්ගේ ඡන්ද දායකයා ජාතිකවාදී දේශපාලන තත්වයන් පිළිබඳ සංවේදී වීම ය. නමුත් දේශපාලන ''තත්වයන්''ස්වයංව ඇතිවන්නේ නැත. ඒවා දේශපාලන නායකයින්ගේ සක්‍රීය මැදිහත්වීමෙන් ඇතිකළ යුතු ය. ඒකාබද්ධ විපක්ෂය විසින් නො කරන්නේ ද එය ම ය. වාසිදායක දේශපාලන තත්වයන් නිර්මාණය නොකර ඔළුගෙඩි මාරු කළ නො හැකිය. ඔළුගෙඩි මාරුවක් දෙස බලාසිටිමින් එම දේශපාලන තත්වය නිර්මාණය නො කර සිටීම බලවත් දේශපාලන වරදකි. පසුගිය දිනවල ඒකාබද්ධ විපක්ෂය විසින් කරනු ලැබුවේ එම වරද නො වේ ද? දැන් ඔවුහු ආණ්ඩුව විසින් පාර්ලිමේන්තුව තුළ සිදුකරන බලහත්කාරයට දේශපාලන වශයෙන් මුහුණ දීමට උත්සාහ කරනවා වෙනුවට, අධිකරණය හරහා එම කටයුත්ත කරවා ගත හැකි බවට

බලාපොරෝත්තු හදති. ඒ අනුව බලන විට ඔළු ගෙඩි සෙල්ලම දෙස බලාසිටීමද නිර්මාණය කරන ලද බලාපොරොත්තුවක් විය හැකිය.

කෙසේවෙතත්, මේ වන විට ඒකාබද්ධ විපක්ෂය තම අවසාන තුරුම්බුව ලෙස තවත් බලාපොරොත්තුවක් හදමින් සිටියි. එය එළුවාගේ වෘෂණ කෝෂය දෙස බලාසිටීමට වඩා භයානක දේශපාලන සෙල්ලමකි. ඊට අනුව පාර්ලිමේන්තුවේදී ව්‍යවස්ථා සංශෝධනයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මන්ත්‍රිවරුන් විසින් තුනෙන් දෙකේ කැමැත්ත ලබාදීම වැළැක්වීම සඳහා කළ යුතු සියල්ල කරනවා වෙනුවට ඊට ඇත තිබෙන ජනමත විචාරණ සටන සඳහා සූදානම් විය යුතු ය. එයින් වක්‍ර ව කියවෙන්නේ එසේ පාර්ලිමේන්තුවේදී ආණ්ඩුවට තුනෙන් දෙක අහිමි කිරීම අභියෝගාත්මක බැවින්, මහජනයා පෙළගස්වා ජනමත විචාරණය පරාජය කිරීම වඩා පහසුවනු ඇති බවයි. ඒ මගින් ඔවුන් දේශපාලන බලවේග වලින් ඉල්ලා සිටින්නේ ''තුනෙන් දෙකේ හන්දියෙදී'' සටනට සූදානම් වෙනවා වෙනුවට එතැනින් ඉවත්වී ඉන් එහා තිබෙන ''ජනමත විචාරණ හන්දියට'' ගොස් එහි ''කඳවුරු ලා'' ගන්නා ලෙස ය.

ඒ මගින් දේශපාලන වැරදි කිහිපයක් ම සිදුවේ. එසේම මූලික යුද උපක්‍රම න්‍යායක් ද බරපතළ ලෙස අමතක කෙරේ. පළමුවෙන් ම ඒ මගින් මන්ත්‍රීවරුන් කරපිට පැටවී ඇති පාවාදීමේ බර මහජනයා මත පැටවීම සිදුවේ. එපමණක් නො ව, ඒ මගින් පාර්ලිමේන්තුවේදී පරාජය වූවත් ජනමත විචාරණයේදී දිනිය හැකි ය යන ව්‍යාජ අරක්ෂාකාරී මනෝභාවය සමාජය තුළ ඇතිවේ. කෙසේවෙතත්, ජනමත විචාරණය පැවැත්වීම සඳහා මහජනයා පෙළගැස්වීමේදී එහි පීඩනය මහජන නියෝජිතයන්ට දැනෙන බැවින් ඒ මගින් පාර්ලිමේන්තුවේදී ''තුනෙන් දෙක'' අහිමි කිරීම සඳහා බලපෑමක් ඇති වන බවට තර්කයක් මතු කළ හැකිය. එහෙත් තුනෙන් දෙක අහිමි කිරීම සඳහා පාර්ලිමේනතු මන්ත්‍රිවරුන් ඉලක්ක කර ගනිමින් කරනු ලබන මහජන ක්‍රියාකාරකම් සහ ජනමතවිචාරණය පැරදවීම සඳහා කරනු ලබන මහජන ක්‍රියාකාරකම් අතර බරපතල

උපායමාර්ගික වෙනස්කම් ඇත. එසේම හදිසියේ කළ යුතු ක්‍රියාකාරකම් ඉදිරි සටනක් දක්වා කල් දැමීම වරදකි. මූලික යුද උපක්‍රම අනුව සලකා බැලුවද සතුරාගේ දුර්වල ස්ථාන සහ අවස්ථා සියල්ල ම ඔවුන්ගේ සටන දුර්වල කිරීම සඳහා ප්‍රයෝජනයට ගත යුතු ය. එක් දුර්වල ස්ථානයක් අත්හැරීම මගින් සතුරාට සහනයක් ලැබෙන අතර, ඊළග ස්ථානයේදී හමුවන්නේ බලවත් සතුරෙකි.

ආණ්ඩුව විසින් ජනමත විචාරණයක් කැඳවන බවට උපකල්පනය කළත් ඊට මුහුණ දීම පහසු වන්නේ පාර්ලිමේන්තුව තුළ බලවත් සටනක් කළහොත් පමණි. ඒ සටන අතහැර හෝ දුර්වල කොට ඊළග සටනට සූදානම් වීම බලවත් උපායමාර්ගික වරදවා ගැනීමකි. අනෙක් පැත්තෙන් ගත්විට පාර්ලිමේන්තුවේදී සතුරා පරාජය කළහොත් ජනමත විචාරණ සටන් බිමේදී ඔහු මුණ ගැසීම අවශ්‍ය වන්නේ නැත. ඒ නිසා පාර්ලිමේන්තුවේ සටන අවතක්සේරු කොට ජනමත විචාරණ සටනට බරතැබීම යනු සතුරාට වාසි සහගත තේරීමකි. එම තේරීම දෙවන තේරීමක් නැති, පරාජයෙන් කෙළවරවීමට වැඩි සම්භාවිතාවක් සහිත තේරීමකි.

කෙසේ වෙතත් ජනමත විචාරණ සටන්බිම යනු සමස්තයක් ලෙස ම ව්‍යාජ සටන්බිමක් විය හැක. දෙවන සටන්බිමකදී බලවත් සටනක් කැඳවන බවට සතුරා විසින් ප්‍රකාශ නිකුත් කරන්නේ සතුරාට ඉතා වැදගත් පළමු සටන් බිම අවතක්සේරු කර පෙන්වීම සඳහා විය හැකිය. සතුරාට ජනමත විචාරණ සටන් බිමක් අවශ්‍ය වන්නේ අවස්ථා දෙකකදී ය. පළමු අවස්ථාව වන්නේ පවතින ව්‍යවස්ථාවට පිටින් නව ව්‍යවස්ථාවක් ගෙනඒම සඳහා ය. එවැන්නකට තමන් සූදානම් නොමැති බව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දැනටමත් ප්‍රකාශ කොට ඇත. එම තත්වය යටතේ පාර්ලිමේන්තුවේදී ''තුනෙන් දෙක'' අහිමි වුවහොත් සියල්ල අවසන් වේ. ආණ්ඩුව කෙසේවෙතත් බෙදුම්වාදීන් විසින් එවැනි අනතුරක් නො ගන්නා බවට සැකයක් නැත.

දෙවනු ව, ජනමත විචාරණයක් අවශ්‍ය වන්නේ පවතින ව්‍යවස්ථාව යටතේ ජනමත විචාරණයක් අවශ්‍යවන වගන්තිවල

සංශෝධන කෙරෙනවානම් පමණි. නමුත් උදාහරණයක් ලෙස ඒකීය වගන්ති හෝ බුද්ධාගමට ප්‍රමුඛස්ථානය දීමේ වගන්ති සංශෝධනය කිරීමට ගන්නා උත්සාහය තුළ පාර්ලිමේන්තුවේ තුනෙන් දෙක අහිමි වීමේ අනතුර බරපතළ වේ. බෙදුම්වාදීන් එම අනතුර නොසලකා කටයුතු කරන්නේ නැත. ඒ නිසා ආණ්ඩුව ඒ ආකාරයට ජනමත විචාරණයකට තල්ලු වීමට තිබෙන ඉඩ කඩ ද සීමා සහිතවේ බෙදුම්වාදීන්ට තමන්ට අවශ්‍ය සියල්ල ජනමත විචාරණයකින් තොර ව ඉටුකරගත හැකි නම් වෙනත් හේතු මත එම අනතුර ගැනීමට තිබෙන ඉඩකඩ ඉතා අවම වේ. එම නිසා ජනමත විචාරණය පැරදවීමේ සටන ඉදිරියට දමා පාර්ලිමේන්තුවේ සටන අවතක්සේරු කිරීම යනු සතුරාට වාසි සහගත කුමන්ත්‍රණයක් ලෙස හැදින්වීම වරදක් නො වේ.

එම තේරීම අනෙකුත් සිදුවීම් සමග එක්ව ගෙන සලකා බලන විට පින්තූරයේ භයානකකම තවදුරටත් වර්ධනය වේ. උදාහරණ ලෙස එවැනි සිදුවීම් කිහිපයක් සඳහන් කළ හැකි. පළමු වැන්න සාධාරණ හේතුවක් හෝ බලපෑමක් නො මැතිව ව්‍යවස්ථා මණ්ඩලයට ඇතුළු වීම ය. දෙවැන්න මහා සංඝරත්නයේ මතය නො සලකා දිගින් දිගට ම ව්‍යවස්ථා මණ්ඩලය තුළ රැඳී සිටීම ය. තුන්වැන්න, නව ව්‍යවස්ථාවක් අවශ්‍ය නැති වුවත් ව්‍යවස්ථා සංශෝධනයක් ගෙන ඒම ගැටළුවක් නොවන බවට මතයක් පැතිරවීම ය. හතරවැන්න, 13 වැනි සංශෝධනයෙන් දශමයක්වත් එහාට නො යා, එය සම්පූර්ණයෙන්ම බලාත්මක කිරීම වරදක් නොවන බවට මතයක් තහවුරු කිරීමය. පස්වැන්න ''13දීලා හෝ රට ෆෙඩරල් කරන එක වළක්වා ගත යුතුයි'' යනුවෙන් යම් නායකයින් අප්‍රසිද්ධියේ මත පළකිරීමය.

ඒ සියලු දේ එක් ව සලකන විට ඒකාබද්ධ විපක්ෂය ව්‍යවස්ථා සංශෝධනය කෙසේ හෝ පරාජය කළ යුතුය යන දැඩි මතයක සිටිනවා ද යන සැකය මතුවීම වැළැක්විය නො හැකිය. ඒකාබද්ධ විපක්ෂය ව්‍යවස්ථාව පිළිබඳ ව පමණක් නො ව රටට අහිතකර ආණ්ඩුවේ වෙනත් ක්‍රියාමාර්ග පිළිබඳ ව කටයුතු කරන ඇල්මැරුණු

ස්වභාවය නිසා එම සැකය තවදුරටත් වර්ධනය වේ. උදාහරණයක් ලෙස ආණ්ඩුව විසින් ගෙන එන ඉතා බරපතළ පනත් වලට සංශෝධනය ගෙන ඒම මගින් ඒවාට සුජාතභාවය ලබාදීම බලවත් වරදක් බව බැලූ බැල්මට පෙනේ. යකාගේ දතක් ගැලවීමෙන් හෝ නියපොත්තක් කැපීමෙන් හෝ පවුඩර් දැමීමෙන් උගේ භයානක කම නැති කළ හැකි ද? ඒ ආකාරයට ඉදිරියේදී ආණ්ඩුව විසින් ගෙන ඒමට නියමිත ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතට සංශෝධන ගෙන ඒමට ඒකාබද්ධ විපක්ෂයත් උත්සාහ කළහොත් එය ඔවුන් විසින් කරන අවසාන පාවාදීම බවට කිසිදු සැකයක් නැත. එසේ නොවන ලෙස රටට ආදරය කරන සියලු මිනිසුන් දස දහස් වරක්, ප්‍රාර්ථනා කරනු ඇත. ඒ විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණ විසින් එසේ සංශෝධන ගෙනඑමින් රට බෙදන ව්‍යවස්ථා සංශෝධනයට සුජාතභාවය ලබාදෙන බව සක්සුදක් සේ පැහැදිලි බැවිනි.

# 03

## වෙල්ලාලයින්ගේ "ෆෙඩරල් සංහිඳියාව" සහ සැබෑ සංහිඳියාව

ජාතිකත්ව හෙවත් ජනකොටස් අතර සංහිඳියාව ජාතියක පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය මූලික සාධකයකි. ශ්‍රී ලංකාව තුළ ඓතිහාසික ව බහුතර සිංහල ජනතාව සහ දෙමළ ජනකොටස් අතර සංහිඳියාව පලුදු වීමට මූලික වශයෙන් හේතු වන්නේ යටත් විජිත පාලකයන් විසින් රෝපණය කළ දෙමළ ජාතිවාදී බෙදුම්වාදී ව්‍යාපාරයයි. ක්‍රමයෙන් පොදු ජනතාව සහ රජයට එරෙහි සන්නද්ධ යුද්ධයක් බවට පත්වූ එම ප්‍රවණතාව දීර්ඝ ගැටුමකින් පසු ව යුදමය වශයෙන් පරාජය කෙරුනද ජාතිවාදය සහ බෙදුම්වාදය මතවාදී ව පරාජය නො වී ය. බෙදුම්වාදය ප්‍රචලිත කරන ජාතිවාදය පරාජය කිරීමෙන් තොර ව සංහඳියාව ඇතිකරන්නේ කෙසේ ද?

දෙමළ බෙදුම්වාදී තුවක්කු නිහඬ කිරීම සඳහා අති බහුතරයක් වූ සිංහල සොල්දාදුවන්ට දස දහස් ගණනින් ජීවිත දන්දීමට සිදුවිය. ත්‍රස්තවාදීන්ගේ ග්‍රහණයට ලක් වූ ලක්ෂ සංඛ්‍යාත අහිංසක දෙමළ ජනතාව මුදා ගැනීම මුල් කරගෙන දියත් වූ අවසන් සටනේදී බහුතර සිංහල ජනතාව සහ විශේෂයෙන් ම යුදහමුදාව පෙන්වූ උසස් මානුෂික ගුණය සංහිඳියාව නැවත ගොඩනැගීම සඳහා ඉතා නිර්මාණශීලී ව යොදාගත හැකි ව තිබුණි. එහෙත් යුද්ධය අවසන් වූ සැණින් බෙදුම්වාදීන්ට පක්ෂපාත සහ ඔවුන් පෝෂණය

කළ ජාත්‍යන්තර බලවේග විසින් ''මානව හිමිකම්'' නාමයෙන් බෙදුම්වාදයට නැවත පණ දීම ආරම්භ කරන ලදී. ඒ තුළ සැබෑ සංහිඳියාව ජනතාවගෙන් වඩා දුරස් විය. සංහිඳියාව බෙදුම්වාදයට ආවරණය සපයන ලේබලයක් බවට පත්විය.

සැබෑ සංහිඳියාව සඳහා අත්පුඩි ගැසීමට මෙන් අත් දෙකක් අවශ්‍ය වේ. එක් අතකින් අත්පුඩි ගැසීමට නො හැකි ය. දෙමළ ජනතාවට පමණක් විශේෂයෙන් සලකා විසඳුම් ඉදිරිපත් කිරීමෙන් හෝ සිංහල ජනතාවට වෙනත් ආකාරයකට සලකමින් සංහිඳියාව ඇති කළ නො හැකිය. සංහිඳියාව මූලික වශයෙන් සිතෙහි හටගන්නා දෙයක් මිස, භෞතික ව බාහිරින් ලබාදිය හැක්කක් නො වේ. බහුතර සිංහල ජනතාව අතර සැක සංකාව සහ අසතුට ඇති වන ආකාරයට දෙමළ ජනතාව සතුටු කිරීමට උත්සහ කිරීමෙන් සංහිඳියාව ඇති කළ නොහැක එහි අනෙක් පැත්ත ද ඒ ආකාරයට ම වලංගුවේ. එමෙන් ම දෙමළ බෙදුම්වාදී බලවේගවලට කප්පම් ලබාදීම මගින් බහුතරයක් දෙමළ ජනතාවට සහන ලැබෙනවා යැයි උපකල්පනය කිරීම ද බලවත් වරදකි. අප කවුරුත් ඒ පරම සත්‍යය තේරුම් ගත යුතු ය.

ඒ නිසා ජාතියක ජාතිකත්ව අතර සංහිඳියාව ඇති කිරීමට නම් සියලු ජන කොටස්වලට සමාන ව සැලකිය යුතු ය. සංහිඳියාව උපදින්නේ සමානාත්මතාවය තුළිනි. සංහිඳියාවේ නාමයෙන් යෝජනා වන පළාත් මට්ටමින් දේශපාලනඥයන්ට බලය බෙදා දීමේ විසඳුම් මගින් පොදු ජනතාව අතර සමානාත්මතාව තහවුරු වන්නේ නැත. ඒ සඳහා සියලු ජනතාවට බලය ලැබෙන සේ ඉතා කුඩා ම ඒකකය වන පුද්ගලයා වෙත බලය බෙදිය යුතු ය. උතුරේ කුල හීන ජනතාව පීඩනයට පත් කරන වෙල්ලාලයන් කිහිප දෙනෙකු අතට බන්දේසියක තබා බලය බෙදා දීමෙන් ඒ ජනතාවට සෙතක් වී නැති බව දැන් ඉතා හොඳින් ඔප්පු වී ඇත.

අපේ රටේ උතුර සහ නැගෙනහිර පළාත්වල දක්නට ලැබෙන කුල පීඩනය නැති කිරීම සඳහා 1957 දී අංක 21 දරන පනත මගින් විශේෂ නීතියක් ද සම්මත කරනු ලැබී ය. එසේ වුවත්

එම පනත මගින් වැරදි ලෙස හඳුන්වන උතුරේ ජනතාවට එරෙහි ව කරනු ලබන අකටයුතුකම් නිවැරදි කොට සියලු ජනයාට සමාන ව සලකන සමාජයක් බිහි කිරීමට උතුරේ නායකයින් අසමත් වී ඇත. පසුගිය දිනවල දකුණින් උතුරට මහා සංඝරත්නය සියක් නමක් වඩම්මවා යාපනය රෝහලේ අසාධ්‍ය රෝගීන්ට ලේ දන්දීමට සිදුවූයේ කුල මානය නිසා ලේ දන් නො දෙන පිරිස්වලට ආදර්ශයක් සැපයීම සඳහා ය. පළාත් සභා බලය ලබා ගැනීමෙන් පසුව උතතුරේ දෙමළ බෙදුම්වාදී නායකයන් විසින් එම ප්‍රදේශවල ජනතාවට විශේෂයෙන් ලබා දුන්නේ මොනවා ද? එසේ නැතහොත් ඉහත සඳහන් කළ නීතිය මගින් නැති කිරීමට උත්සහා කළ ම්ලේච්ඡ කුළ පීඩනය නිසා උතුරේ වෙසෙන බහුතරයක් දෙමළ ජනතාවට සිදුවන අසාධාරණය අවම කිරීමට ඔවුන් විශේෂයෙන් කළේ කුමක්ද? අන්තවාදී වෙල්ලාලයින් සුළු පිරිසක් අතට ස්වයං පාලන බලය ලබා දීමෙන් එම තත්වය වෙනස් නොවන බව කුල පීඩනයෙන් පීඩාවට පත්වන උතුරේ සාමාන්‍ය ජනතාව ඉතා හොඳින් දනිති.

අප රටේ මහජනයාගේ අවධානයට ලක් නො වූ 1957 දී සම්මත කළ ''සමාජ දුබලතාවයන් වැළැක්වීමේ පනත'' ලෙස නම් කළ එම නීතිය පිළිබඳ ව උතුරේ වෙල්ලාලයන් ලැජ්ජා විය යුතුය. එම නීතිය මගින් වැළැක්වීමට උත්සාහ කළ පහත් ක්‍රියාවන් අතුරින් යම් දේවල් දකුණු අප්‍රිකාවේ වර්ණභේදවාදී පාලකයින් යටතේ හෝ සිදු වූ බවක් දනගන්නට නැත. කුල හීනයන්ට පොදු ළිඳකින් වතුර බීමට ඉඩ නො දීම, පොදු ගමනාගමනය භාවිත කිරීමට ඉඩ නොදීම වැනි වැරදි 12ක් එම පනත මගින් ආවරණය කෙරිණි. ඒ අනුව යටත් විජිත පාලනය අවසන් කිරීමෙන් පසු ව ගෙන එන ලද එම පනත මගින් එස්.ඩබ්.ආර්.ඩී බණ්ඩාරනායක මහතා විසින් උතුරේ කුල හීන ජනතාවට දෙවන වරට නිදහස ලබාදුන් බව පැවසීම අතිශයෝක්තියක් නො වේ. අද වන විට එම පනතේ සඳහන් යම් වැරදි උතුරේ සිදු නො වන බවට වෙල්ලාලයන් වාද කරනු ඇත. එහෙත් සමස්තයක් ලෙස එම පනත අදටත් වලංගු වන බව ඔවුන්ට ප්‍රතික්ෂේප කළ නො හැකිය.

එම නීතිය මගින් වෙල්ලාලයින් බලවත් සේ ලැජ්ජාවට පත් කෙරුන ද, ඒ පිළිබඳ ව ඔවුන් කිසිදු සෝෂාවක් නො කර සිටීමට පරිස්සම් විය. එහෙත් 1956 දී රාජ්‍ය භාෂා පනත මගින් එතෙක් රාජ්‍ය භාෂාව වූ ඉංග්‍රීසිය වෙනුවට ඉන්දියාවේ මෙන් බහුතර ජනතාව කතා කරන භාෂාව රාජ්‍ය භාෂාව බවට පත් කළ විට ඔවුහු මහත් සෝෂාවක් කළහ. එයට හේතුව සාමාන්‍ය දෙමළ ජනතාවට ඒ මගින් අසාධාරණයක් වනු ඇතැයි ඔවුන් විසින් කල්පනා කිරීම නො වේ. ඒ මගින් ඉංග්‍රීසි උගත් වෙල්ලාලයින් විසින් අත්පත් කරගෙන සිටි සමාජ බලය බහුතර සිංහලයන් විසින් අත්පත් කරගනු ඇතැයි ඔවුන් බියට පත් විය.

1958 දී දෙමළ භාෂා විශේෂ විධිවිධාන පනත මගින් දෙමළ භාෂාවෙන් අධ්‍යාපනය ලැබීමට, රාජ්‍ය සේවයට ඇතුළුවීම සහ පාර්ලිමේන්තුවේදී දෙමළ භාෂාව භාවිත කිරීමට සම්පූර්ණ අයිතිය ලබා දුන්නද වෙල්ලාලයන්ට ඒ පිළිබඳ ව සතුටක් ඇති නො වී ය. එයට හේතුව, සාමාන්‍ය දෙමළ ජනතාවගේ ගැටළුව ඒ මගින් විසඳීම ය. ඔවුනට අවශ්‍යවූයේ බහුතර සිංහල ජනතාව මෙන්ම දෙමළ ජනතාවගෙන් බහුතරය සමාජ හිණිමගේ ඉහළ නැගීම වැළැක්වීම ය. එම පනත මගින් දෙමළ භාෂා ප්‍රශ්නය 1958 දීම ඉතා සාධාරණ ලෙස විසඳා තිබියදී වෙල්ලාලයන් ව්‍යාජ ලෙස ''භාෂා ප්‍රශ්නය'' දිගින් දිගට ම මතු කරනු ලැබී ය. ඉන් පසු 1978 ව්‍යවස්ථාවෙන් දෙමළ සහ සිංහල, ජාතික භාෂා ලෙස පිළිගැනුණි. ඉන් පසුව 1987 දී 13 වන සංශෝධනය මගින් දෙමළ සහ සිංහල යන භාෂා දෙක ම රාජ්‍ය භාෂා බවට පත් කෙරිණි, ඉන් පසුව වෙල්ලාලයන්ගේ බලපෑම මත භාෂා අසාධාරණය සිදු වූයේ සිංහලයාට ය. ඒ 1988 දී සම්මත කළ 16 වන සංශෝධනය මගින් ඒ වන විට ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සිංහලෙන් හෝ දෙමළෙන් පරිපාලන ගනුදෙනු කිරීමට තිබූ අයිතිය දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවට පමණක් සීමා කිරීම මගිනි. සිංහල භාෂාවට ඒ අයිතිය ලැබෙන්නේ පරිපාලන භාෂාව ලෙස දෙමළ භාෂාව කතා කරන ප්‍රදේශයක පමණි. එහෙත් අදත් වෙල්ලාලයන් සෝෂා කරන්නේ ඔවුනට බරපතළ ''භාෂා අසාධාරණයක්'' තිබෙන බවට ය. 1958 දෙමළ භාෂා විශේෂ

විධිවිධාන පනත ඔවුනට යුක්තිය ඉටු කිරීම පිළබඳ ඔවුහු සෑම විට ම මුණිවත රකිති. ඒ ආකාරයට ම ඔවුහු 1957 වෙල්ලාලයන්ගේ අසාධාරණකම් වලින් බහුතර දෙමළ ජනතාව ගලවා ගැනීම සඳහා සම්මත කළ පනත පිළිබඳව ද කුහක මුනිවත රකිති.

යම් ජන කොටසක් තුළ අභ්‍යන්තරික ව සංහිඳියාව ඇති කිරීමට බාධා කෙරෙන බරපතල සංස්කෘතික ගැටුමකට හේතුකාරක වන දේශපාලන නායකයින් පිරිසකට ජනකොටස් දෙකක් අතර සංහිඳියාව ඇති කිරීමට මුල්වි ය හැකි ද? ඇමෙරිකාවේ නිර්දේශය මත පිහිටුවා ඇති ඊනියා සංහිඳියා ලේකම් කාර්යාලයේ වාර්තාවෙන් නිර්දේශ ඉදිරිපත් කරන්නේ බහුතර සිංහල ජනතාවගේ හැසිරීමට අදාළ ව පමණි. ඊට අනුව ඊනියා සංහඳියාවට බාධා කෙරෙන දෙමළ නායකයින්ගේ සංස්කෘතික පසුගාමිත්වය නැතිකර ගැනීමට අවශ්‍ය නො වේ. මේ බොරුව එළිදරව් කළ හැක්කේ සත්‍ය මතු කර ගැනීමෙන් සහ ඒ මත දේශපාලන උපායමාර්ග තේරීමෙන් පමණි. ඒ සඳහා පටු ජාතිවාදී, කුලවාදී නායකයන් අතලොස්සක් අතට බලය ලබාදීම මගින් ජනතාව අතට බලය ලැබෙන්නේ නැති බව තහවුරු කෙරෙන මතවාදය අභියෝගාත්මකව ඉදිරිපත් කළ යුතුය. එනම් ''සංහිඳියාව ඇතිකළ හැක්කේ සමානාත්මතාව ය තුළින් පමණි'' යන මතය ඉහළට එසවිය යුතුය. බෙදුම්වාදීන්ට තර්කානුකූල ව අභියෝග කළ හැක්කේ ඒ මගින් පමණි.

ඒ සඳහා දකුණේ ජනතාව භුක්ති විඳින, එහෙත් උතුරේ හෝ නැගෙනහිර ජනතාවට අහිමි වී ඇති බව කියන අයිතිවාසිකම් හා වරප්‍රසාද සියල්ල ලැයිස්තු ගත කරන ලෙස අප උතුරේ දේශපාලන නායකයින්ගෙන් ඉල්ලා සිටිය යුතු ය. එසේ ම ලෝකයේ වෙනත් ඕනෑ ම රටක සුළු ජාතිකත්වයන්ට ලබාදී ඇති, එහෙත් ශ්‍රී ලංකාවේ එසේ ලබාදී නැති කුමන හෝ අයිතිවාසිකමක් හෝ වරප්‍රසාදයක් ඇත්නම් ඒවා ද එම ලයිස්තුවට එකතු කළ යුතුය. එසේ අහිමිකොට ඇතැයි කියන කිසිදු අයිතිවාසිකමක් හෝ වරප්‍රසාදයක් ඔවුනට ලබා දෙනවාට අකමැති එක සිංහලයෙක් හෝ බෞද්ධයෙක් සිටීනම් ඔහුගේ ප්‍රශ්නය විසඳීම බහුතර සිංහල ජනතාව විසින් බාර ගත යුතුය. ඉන් පසුව ඒ බහුතරය විසින්ම ඒ අයිතිවාසිකම්

සහ වරප්‍රසාද ලැයිස්තුවේ අඩංගු සියල්ල ''සුළුතරයට''ලබාදිය යුතු බවට රජයට බල කළ යුතු ය. ඒ අභියෝගය රජයට හෝ දෙමළ බෙදුම්වාදී දේශපාලන නායකයන්ට පමණක් නො ව, සංහිඳියාවේ නාමයෙන් ඩොලර් ඉපයීම සඳහා ජාතිවාදයට සහ බෙදුම්වාදීන්ට උඩගෙඩි දෙන පිරිස්වලට ද එල්ල විය යුතු ය. සැබෑ සංහිඳියාව දිරිගැන්විය හැක්කේ ඒ මගින් පමණි.

නමුත් බෙදුම්වාදී කප්පම්කරුවන් ඉල්ලන්නේ සැබෑ සංහිඳියාව හෝ ජනතාවගේ සැබෑ අයිතිවාසිකම් නො වේ. ඔවුන් ඉල්ලා සිටින ව්‍යවස්ථාමය විසඳුම කුමක් ද? මහින්ද රාජපක්ෂ පාලනය පෙරළා දැමීමෙන් පමණක් ලබා ගත හැකි යැයි ඔවුන් විශ්වාස කළ එම විසඳුම කුමක් ද? ඔවුන්ගේ සැබෑ අරමුණ අනාගතයේදී ඒකපාර්ශ්වීය ව වෙනම රාජ්‍යයක් ප්‍රකාශයට පත් කිරීම සඳහා අවශ්‍ය තරමට දේශපාලන බලය බෙදා හරින ''ව්‍යවස්ථාමය විසඳුමක්'' ලබා ගැනීම නො වේ ද? ඒ අරමුණ ඉටුකර ගැනීම සඳහා ඔවුනට නව ව්‍යවස්ථාවක් අවශ්‍ය වන්නේ නැත. එසේ ම 'ඒකීය' වචනය ව්‍යවස්ථාවෙන් ඉවත් කිරීමට අවශ්‍ය වන්නේ නැත. ව්‍යවස්ථාවේ බුද්ධාගමට හිමි තැන අහිමි කිරීමට අවශ්‍ය වන්නේ ද නැත.

ඒකීය වචනය ව්‍යවස්ථාවේ එසේ ම තිබියදී 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන් ම බලාත්මක කිරීම මගින් රටේ ඒකීය භාවය නැති කළ හැකිය. එනම්, ෆෙඩරල් ලේබලය නො මැති ව ෆෙඩරල් රාජ්‍යක් බිහිකළ හැකිය. ඒ බව මෑතකදී ලබාදුන් නඩු තීන්දුවකින් ද තහවුරුකොට ඇත. ඒ සඳහා අවශ්‍ය වන්නේ 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන් ම ක්‍රියාත්මක කිරීමට එරෙහි ව පවතින බාධක ඉවත්කර ගැනීම සහ හැකිනම් ව්‍යවස්ථා අධිකරණය සහ දෙවන මන්ත්‍රණ සභාව මගින් එය තවදුරටත් ශක්තිමත් කරගැනීම පමණි.

ඒ නිසා 13 වැනි සංශෝධනයෙන් ලබාදුන් බලතලවලින් දශමයක්වත් එහාට යන බලතල ඉල්ලා සිටීමට ඔවුන්ට උවමනාවක් නැත. උවමනා පමණට වඩා දේ ලබා ගැනීමට උත්සාහ කිරීම

අනතුරුදායක බව බෙදුම්වාදීහු ඉතා හොඳින් දනිති. පාර්ලිමේන්තුවේ සාමාන්‍ය බහුතරයවත් නැති රනිල් වික්‍රමසිංහ මහතාගෙන් උවමනාවට වැඩි දේ ඉල්ලා සිටියහොත් තුනෙන් දෙක අහිමි වී සියල්ල අහිමි වන බව ඔවුහු ඉතා හොඳින් දනිති. නමුත් විද්වතුන් යැයි කියාගන්නා පිරිස් ඒ බව නො දනිති. සතුරාගේ සැලසුම් හඳුනා ගන්නට නොහැකිව ඊට පහසුකම් සලසන ක්‍රියාමාර්ගවල අප නියැලී සිටින්නේ ඒ නිසා නො වේ ද? අප රටේ යම් නායක මට්ටමේ භික්ෂූන් වහන්සේලා විසින් ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ අඩංගු වීමට නියමිත භයානක බෙදුම්වාදී ප්‍රතිපාදන පිළිබඳ ව වචනයක්වත් කතා නො කර බුද්ධාගමට හිමි තැන අහිමි කරනවායැයි බොරුවට සෝෂා කරන්නේ ඒ අනවබෝධය නිසා නො වේ ද?

# 04

## 13 වැනි සංශෝධනයද, ඉන් එහාට ද? ඉන් මෙහාට ද? ඔත්තුකරුවන්ගේ මතය සහ ජාතිකවාදීන්ගේ මතය

වර්තමාන ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලියට එරෙහි ව ගෝඨාභය රාජපක්ෂ මහතාගේ මූලිකත්වයෙන් දියත්වන 'එළිය' ව්‍යාපාරයේ සමාරම්භක උත්සවය පසුගියදා බොරලැස්ගමුවේදී ඉතා උත්සවාකාරයෙන් පැවැත්විණි. ශ්‍රී ලංකාවේ බෙදුම්වාදී ව්‍යාපාරයට එරෙහි ව 1948 සිට දියත් වූ විවිධ ජාතිකවාදී ව්‍යාපාරවල ඉතිහාසයට සහ වර්තමානයට 'එළිය ව්‍යාපාරයෙන්' සුවිශේෂී එළියක් විහිදුවන බවට සැකයක් නැත. එම ව්‍යාපාරය පමා වී මතුවුනත් කාලීන අවශ්‍යතාවක් බවට ද විවාදයක් නැත. ඉතා හොඳින් සංවිධානය කොට තිබූ සමාරම්භක උත්සවයේදී කථිකයින් 8 දෙනෙකුට විනාඩි 8 බැගින් ලබාදී තිබුණි. එහිදී මැද මාවතක් මෙන් ම, අන්ත දෙකක් ද පෙන්වමින් කථිකයින් තම අදහස් දැක්වීම ඉතා සුවිශේෂී ලක්ෂණයක් ලෙස දක්නට ලැබුණි.

එහිදී යම් කථිකයින් ආකාර දෙකකට මැද මාවතක් පෙන්වා දුණි. ඊට අනුව වර්තමාන ආණ්ඩුවට නව ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම සඳහා පැහැදිලි ජනවරමක් ලැබී නොමැති බැවින් සහ ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය ජාත්‍යන්තර බෙදුම්වාදී බලවේගවල බලපෑමට යටත් වී ඇති බැවින් එම ක්‍රියාවලිය වහා නැවැත්විය යුතු ය. ඊට ඉඩ ලබා නො දිය යුතු ය. ගෝඨාභය රාජපක්ෂ මහතා ඇතුළු

කථිකයින් අදහස් දැක්වූයේ නව ව්‍යවස්ථාවක් අවශ්‍ය නො වන බවට පමණි. නමුත් තවත් කථිකයින් පිරිසක් නව ව්‍යවස්ථාවක් පමණක් නො ව 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන් ම බලාත්මක කිරීම සඳහා යොදා ගැනීමට නියමිත ව්‍යවස්ථා සංශෝධනයක් ද අවශ්‍ය නො වන බවට තර්ක කළහ. මේ වන විට ත්‍රෛනිකායික මහා නායකහිමිවරුන් විසින් ද නව ව්‍යවස්ථාවක් හෝ ව්‍යවස්ථා සංශෝධනයක් යන දෙක ම අවශ්‍ය නො වන බවට මතයක් පළකොට ඇති බැවින් එම මතය පොදු මතය හෙවත් මැද මාවත ලෙස සැලකීමේ වරදක් නැත. කෙසේවෙතත් යමෙක් නව ව්‍යවස්ථාවක් අවශ්‍ය නො වන බව කියමින් ව්‍යවස්ථා සංශෝධනයක් පිළිබඳ සඳහන් නො කිරීමෙන් අදහස් වන්නේ ඔහු හෝ ඇය කුමන ආකාරයේ ව්‍යවස්ථා සංශෝධනයකට එකඟ බව ය. ඒ අනුව එම ස්ථාවරය වෙන් ව ගත්විට මැදමාවතක් ලෙස සැලකිය නො හැකිය.

ඉහත සඳහන් කළ අන්තවාදී මත දෙකෙන් එකක් වන්නේ 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන් ම බලාත්මක කළ යුතුය යන මතයයි. අනෙක් අන්තය වන්නේ පවතින 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කළ යුතු බව ය. 13 වැනි සංශෝධනයට අදාළව බහුතර කථිකයින්ගේ අදහස් කේන්ද්‍රගත වන්නේ බෙදුම්වාදී බලවේගවල ඉල්ලීම් ඒ වටා කේන්ද්‍රගත වන නිසා බව පිළිගත හැකිය. කෙසේවෙතත් එහිදී ව්‍යවස්ථා සංශෝධනයක් ඉදිරිපත් කිරීමේ වරදක් නැති බවට අදහස් දැක්වූ ආචාර්ය දයාන් ජයතිලක මහතා පවා එම සංශෝධනය මගින් 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන් ම බලාත්මක කිරීමේ ව්‍යවස්ථා ප්‍රතිපාදන ඇති කළ යුතු බව ඍජු ව පැවසුවේ නැත. ඊට හේතුව ඔහුට පෙර කතාකළ මහාචාර්ය පූජ්‍ය මැදගොඩ අභයතිස්ස හිමිපාණන් විසින් 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන් ම බලාත්මක කිරීම බරපතළ වරදක් ලෙස හැඟෙන අදහස් ඉදිරිපත් කිරීම විය හැකිය.

නමුත් එම මානසික බාධකය වෙනත් ආකාරයකට අතික්‍රමණය කරමින් දයාන් ජයතිලක මහතා විසින් 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන් ම බලාත්මක කිරීමට පක්ෂපාතී තර්ක

5ක් ඉදිරිපත් කරන්නට යෙදුණි. ඊට පෙර අවස්ථා කිහිපයකදීම ඒ මහතා විසින් ඉංග්‍රීසි පුවත්පත් මගින් අදහස් පළ කරමින් 13 වැනි සංශෝධනයෙන් එහාට දශමයක්වත් යා යුතු නැති බවට නියමයන් පනවමින් 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන් ම ක්‍රියාත්මක කිරීම වරදක් නො වන බවට තර්ක ඉදිරිපත් කොට ඇත. ඒ අනුව ඔහුගේ කතාව මගින් ඉදිරිපත් කළ තර්ක හරහා 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන් ම බලාත්මක කිරීමේ අන්තය සාධාරණීකරණය කරන බව පිළිගත හැකිය.

ඔහුගේ පළමු තර්කය වන්නේ, බලය බෙදීම මගින් රට බෙදීම අරමුණු නො කළ යුතු නමුත් ඒ මගින් රට බෙදීමට ලක්විය හැකි බවයි. ඔහු ඉන් අදහස් කරන්නේ, විය හැකි නරක දෙයක් පිළිබඳ උපකල්පනය මත කළ යුතු දේ නොකර සිටීම වරදක් බවයි. එනම් බෙදී යා හැකි වුවත් බෙදීමේ අරමුණක් නොමැති නිසා බලය බෙදීමට බිය නො විය යුතු බවයි. එම තර්කය තවදුරටත් තහවුරු කිරීම සඳහා ඔහු ඉදිරිපත් කළ දෙවන තර්කය වූයේ ශල්‍යකර්මයකින් ලෙඩා මිය යා හැකි වුවත් රෝගය සඳහා ශල්‍යකර්මය නො කර සිටීම වරදක් බව ය. ඔහු එම තර්ක දෙක මගින් බලය බෙදීම හරහා අනාගතයේදී රට බෙදීමේ අනතුරක් මතුවන බවට ජාතිකවාදී බලවේග විසින් ගොඩනගන තර්කය බිඳ හෙළීමට ප්‍රශස්ත උත්සාහයක් දැරී ය.

එම උත්සාහය තුළ ඔහු ජාතිකවාදී බලවේග අන්තවාදයේ එක් පැතිකඩක් නියෝජනය කරන බවට ද චෝදනාවක් එල්ල කෙළේය. ඔහුගේ තර්කයට අනුව අන්තවාදී අනෙක් කෙළවර සිටින්නේ බෙදුම්වාදීන් ය. ඒ අනුව ඔහු සහ සම්බන්ධන් මහතා වැන්නවුන් රට නො බෙදා බලය බෙදිය යුතු බව කියන ''මධ්‍යස්ථවාදීන්'' විය යුතු ය. ඔහු චෝදනාවට ලක්කරන ''ජාතිකවාදී අන්තවාදීන්'' ''මධ්‍යස්ථවාදීන්'' බවට පත්කිරීම සඳහා ඔවුන් නවීන ජාතිකවාදීන් බවට පත්කළ යුතු බවට ඊට පෙර ඔහු විසින් මතයක් පළකරන්නට යෙදුණි. ඔහුට අනුව දැන් ගුණදාස අමරසේකර, නලින් ද සිල්වා වැනි පැරණි ජාතිකවාදීන් අත්හැරදමා නවීන ජාතික

බලවේගයක් ගොඩනැගිය යුතු ය. එහිදී ඔහු වක්‍ර ව කියන්නේ පැරණි ජාතිකවාදීන් සමඟ ඔහුට එක්විය නො හැකි වුවත් නවීන ජාතිකවාදීන් සමඟ එක්විය හැකි බවයි. සමහර විට ඔහු දැන් උත්සාහ කරන්නේ ඔහුගේ එම මතය පිළිගන්නා නවීන ජාතිකවාදී බලවේගයක් ගොඩනැගීමට විය හැකිය.

ඔහු ඉදිරිපත් කළ තුන්වන තර්කය වූයේ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාවට අදාළ ව තීන්දු ගැනීමේදී අසල්වැසි රටවල මතයට ද ගරුකළ යුතු බවයි. ''ජාත්‍යන්තරය නො සලකා තනි ව ගමනක් යා නො හැක'' යන ''පට්ට ගසනු'' ලැබූ පැරණි කියමන මත පදනම්ව ඔහු එම අදහස ඉදිරිපත් කරන බවක් පෙනුණි. නමුත් ඔහු සැබැවින් ම අදහස් කරන්නේ ඉන්දියාවේ කැමැත්ත හෝ අකැමැත්ත නො සලකා ශ්‍රී ලංකාව කටයුතු නොකළ යුතු බවයි. ඉන්දියාව විසින් ශ්‍රී ලංකාව මත බලෙන් පැටවූ 13 වැනි සංශෝධනය විස්මිත විසඳුමක් ලෙස ආරම්භයේ සිට ම එම මැදිහත්වීම සාධාරණීකරණය කළ පුද්ගලයෙක් ලෙස ඔහු විසින් පළකරන එම අදහස පිළිබඳ ව මහජනයා පුදුම නො වනු ඇත. ඔහු නිර්දේශ කරන ආකාරයට අප ඉන්දියාවේ මතයට ගරු කරමින් අප රටේ ව්‍යවස්ථාව සංශෝධනය කරන්නේ නම්, ඔහුගේ ද මතයට ගරු කරමින් 13 වැනි සංශෝධනයෙන් දශමයක්වත් එහාට නොගොස් එය සම්පූර්ණයෙන් ම බලාත්මක කළ යුතු ය.

මේ දිනවල උතුරේ යම් පූජකවරුන් ද දකුණට පණිවිඩ එවන්නේ එවැනි විසඳුමකින් තමා සතුටට පත්වන බව ය. බෙදුම්වාදී මාර්ග සිතියමට අනුව තාක්ෂණික ව බෙදුම්වාදී බලවේගවලට අවශ්‍ය වන්නේ වෙන ම රාජ්‍යයකට ආසන්න බලතලසහිත ෆෙඩරල් රාජ්‍යයක් නීත්‍යා නුකූල ව ව්‍යවස්ථාව මගින් බිහිකර ගැනීම පමණි. ඉතිරි දුර හෙවත් වෙනම රාජ්‍යයක් දක්වා යන ගමන ආරම්භවන්නේ එම නීත්‍යා නුකූල බලතල නීත්‍යා නුකූල නො වන ආකාරයට භාවිත කිරීමට උත්සාහ කිරීමේදී ඇතිවන ගැටුම් ජාත්‍යන්තරකරණය කිරීමෙනි. උතුර නැගෙනහිර පළාත් ඒකාබද්ධකොට බිහිවන රාජ්‍යය මත පය තබා ගැනීමට හෙවත් එම රාජ්‍යය අර්ථ කොලනියක්

ලෙස විවිධ ආරක්ෂක සහ වෙළෙඳ ගිවිසුම් මගින් ඇඳාගැනීමට ඉන්දියාවට මඟ පැදෙන්නේ එම ගැටුම් කළමනාකරණය කිරීමෙනි. ඒ නිසා ඉන්දියාව සතුටු කිරීමේ විසඳුමක අවසන් ඵලය, ඉතා භයානක වන බවට සැකයක් නැත.

දයාන් ජයතිලක මහතා ඉදිරිපත් කළ හතරවැනි තර්කය කරුණුමය වශයෙන් වැරදි වුවත් එය එක්තරා ආකාරයක අනතුරු ඇඟවීමකි. ඒ මගින් ඔහු පෙන්වා දෙන්නේ කොසෝවෝ ප්‍රාන්ත රාජ්‍යයට බෙදාදුන් බලය ක්‍රියාත්මක කිරීමට සර්බියානුවන් ඉඩ නො දුන් බැවින් හෝ එම බලය ආපසු ගැනීමට උත්සාහ කළ බැවින් කොසෝවෝ රාජ්‍යය බෙදී වෙන් වූ බව ය. ඒ මගින් ඔහු ඉහත සඳහන් කළ එක් අන්තයක් වන 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන්ම අහෝසි කළ යුතු ය යන මතය දරන්නන්ට ප්‍රබල අභියෝගයක් එල්ල කරයි. ඔහුගේ පස්වැනි තර්කය වූයේ නව ව්‍යවස්ථාවක් අවශ්‍ය නොවූවත් ''කුඩා කුඩා සංශෝධන'' මගින් ගැටළු විසදීම වරදක් නොවන බවයි. ඒ අනුව එම සභාවේ යම් කථිකයින් මෙන් ඔහු ද විරුද්ධ වන්නේ නව ව්‍යවස්ථාවක් ගෙන ඒමට පමණි. බෙදුම්වාදීන්ගේ දිර්ඝ කාලීන ඉල්ලීමක් වන 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කිරීමට එරෙහි ව පවතින ව්‍යවස්ථාමය බාධක ඉවත් කිරීම සඳහා අවශ්‍ය වන්නේ ඔහු කියන ආකාරයේ කුඩා කුඩා සංශෝධන පමණි.

ඒ අනුව ත්‍රෛනිකායික හිමිවරුන් විරුද්ධ වන්නේ නව ව්‍යවස්ථාවක් සඳහා බවටත්, උන්වහන්සේලා ව්‍යවස්ථා සංශෝධනයක් සඳහා විරුද්ධ නොවන බවටත් ව්‍යාජ මතයක් ගොඩනගන පිරිස් දයාන් ජයතිලක මහතාගේ ''කුඩා කුඩා සංශෝධන තියරියට'' පක්ෂපාතී අය විය යුතු ය. කෙසේවෙතත් දයාන් ජයතිලක මහතාගේ අන්තයට ප්‍රතිවිරුද්ධ අන්තය ලෙස එම සභාවේදී මතු වූයේ 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන්ම අහෝසි කළ යුතුය යන මතයයි. එසේ වුවත් එම මතය දරන්නන් වියුක්ත ව එම මතය ඉදිරිපත් කළේ නැත. ජනාධිපති නීතිඥ මනෝහර ද සිල්වා මහතා විසින් 13 වැනි සංශෝධනය පවා අහෝසි කළ යුතුය යන මතය

ඉදිරිපත් කළේ 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන් ම බලාත්මක කිරීමේ බරපතලකම තහවුරු කිරීම සඳහා ය. රියර් අද්මිරාල් සරත් වීරසේකර මහතා විසින් ද ඊට සමාන මතයක් පළකරනු ලැබී ය.

නමුත් මේ දෙන ලද මොහොතේදී, එනම් රට බරපතළ ව්‍යවස්ථා උගුලක හිර වී සිටින මොහොතක 13 වැනි සංශෝධනය අහෝසිකළ යුතුය යන මතය මගින් රට එම උගුලින් ගලවා ගැනීම සඳහා තේරිය යුතු උපාය මාර්ගයට නිශේධාත්මක බලපෑමක් ඇති කරයි. ඒ මගින් එක් පැත්තකින් බෙදුම්වාදී කප්පම්කරුවන්ට සුළු ජන කොටස් අතර මානසික අවුල් ඇති කිරීමට අවකාශය නිර්මාණය වේ. අනෙක් පැත්තෙන්, ඒ මගින් පළාත්සභාවලට පක්ෂපාතී මැද සහ පහළ මට්ටමේ මහජන නියෝජිතයන් අතර භීතියක් ඇති කෙරේ.

එසේ ම, තවත් පැත්තකින් බෙදුම්වාදය පරාජය කිරීම සඳහා ඊනියා බලය බෙදීම හැර වෙනත් විසඳුමක් නැති බවට මොළ සේදීමට ලක් වී සිටින ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් අතර මානසික බාධක පැනවේ. ඊට අමතර ව, ඒ මගින් සත්‍ය කතාකිරීම සිංහල ජාතිවාදීන්ගේ මෝඩ ක්‍රියාවක් ලෙස මානසික බාධක පනවාගෙන සිටින පිරිස් බියවැද්දීමට දෙමළ ජාතිකවාදීන්ට පක්ෂපාත ඊනියා ජාත්‍යන්තරවාදීන්ට අවස්ථාව නිර්මාණය වේ. ඒ අනුව 2009 දී යුද්ධය අවසන් වූ විගස 13 වැනි සංශෝධනය අහෝසි කිරීමේ සටන් පාඨයට යම් ඉඩක් තිබුණා වුවත් බොහෝ වරදවා ගැනීම්වලින් පසුව මේ මොහොතේදී ඊට ඉඩක් නොමැති බව පැහැදිලි ව පෙනේ.

එසේ නම් දැන් කළ යුත්තේ කුමක් ද? එය සොයා ගැනීම සඳහා 'එළිය' ව්‍යාපාරයට මහත් ආලෝකයක් සැපයිය හැකිය. විශේෂයෙන්ම ගෝඨාභය රාජපක්ෂ මහතාට ඒ සඳහා ඉතිහාසය විසින් මහත් ඉඩක් නිර්මාණය කොට ඇත.එසේ නම් දැන් පළමුවෙන් ම කළ යුත්තේ බෙදුම්වාදීන් විසින් අටවා ඇති උගුලේ ස්වභාවය ඉතා හොඳින් තේරුම් ගැනීම ය. ඔවුන්ට නව ව්‍යවස්ථාවක් හෝ විධායක ජනාධිපති ක්‍රමය වෙනස් කිරීමේ උවමනාවක් නැත. එසේ ම මානසික ව යම් උවමනාවක් තිබිය හැකි වුවත් තාක්ෂණික ව

ගත් විට බුද්ධාගමට හිමි තැන අහිමි කිරීමට හෝ ව්‍යවස්ථාවෙන් ඒකීය වචනය ඉවත් කිරීමට ද ඔවුන්ට උවමනාවක් නැත.

පසුගිය දිනවල ලබාදුන් නඩු තීන්දුවක් මගින් ඒකීය අන්තය දැක්වෙන වගන්තිය ව්‍යවස්ථාවේ එසේ ම තිබියදී ෆෙඩරල් අන්තයට ගොස් දෙමළ ජනතාවට ස්වයංපාලන අයිතිය ලබාදිය හැකි බව ප්‍රකාශ විය. ඒ අනුව ඔවුන්ට අවශ්‍ය වන්නේ 13 වැනි සංශෝධනය බලාත්මක කිරීමට එරෙහි ව ජේ.ආර්. ජයවර්ධන මහතා විසින් ඇති කළ ව්‍යවස්ථාමය බාධක ඉවත් කිරීම පමණි. උතුරේ පූජකවරුන් ඊට වඩා දෙයක් අවශ්‍ය නො වන බව කියන්නේ එම ප්‍රමාණය බෙදුම්වාදී අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රමණවත් වන බැවින් මිස ඔවුන් තම බෙදුම්වාදී අරමුණ අත්හළ නිසා නො වේ.

ඒ අනුව දයාන් ජයතිලක මහතා ඉදිරිපත් කරන කුඩා කුඩා සංශෝධන මගින් ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා විසින් තැබූ 'අඩ' ඉවත් කිරීමේ අන්තවාදී යෝජනාව තරයේ ප්‍රතික්ෂේප කිරීමට සිදුවේ. නමුත් ඊට විකල්ප ලෙස පළමුවෙන්ම පවතින තත්වය තවදුරටත් නරක අතට හැරීම වළක්වා ගැනීම අවශ්‍ය වේ. ඒ සඳහා ත්‍රෛනිකායික මහනායක හිමිවරුන්ගේ මතයට ගරු කරමින් නව ව්‍යවස්ථාවක් හෝ ''කුඩා කුඩා'' සංශෝධන යන දෙක ම ප්‍රතික්ෂේප කළ යුතු ය. දෙවනු ව, නව ව්‍යවස්ථාවක් ඉදිරි ජනාධිපති මැතිවරණයේදී ජනතාවට ඉදිරිපත් කොට එම මැතිවරණය නව ව්‍යවස්ථාවක් අනුමත කරන ජනමත විචාරණයක් බවට පත්කළ යුතු ය. ඒ නව ව්‍යවස්ථාව මගින් සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනතාවට සමාන ව සැලකීම තුළින් ඊනියා 13 වැනි සංශෝධනයේ අවශ්‍යතාව ඉබේම අහෝසිවනු ඇත. ඒ සඳහා බෙදුම්වාදී කප්පම්කරුවන්ට දේශපාලන බලය දීම මගින් ජනතාවට අයිතිවාසිකම් ලැබෙන බවට වන සාවද්‍ය දේශපාලන මතය පරාජය කළ යුතු ය.

සිංහල, දෙමළ මුස්ලිම් ජනතාවට සමාන ව සලකන්නේ නම්, බිම් මට්ටමේදී හෙවත් ප්‍රාදේශීය සභා මට්ටමේදී ඔවුන් අතට

දේශපාලන බලය ලබාදෙන්නේ නම් 13 වැනි සංශෝධනයේ ප්‍රතිපාදන අවශ්‍ය වන්නේ නැත. නමුත් ඒ බව බෙදුම්වාදී බලවේග විසින් දශක කිහිපයක් තිස්සේ මනස අවුල්කොට තිබෙන සුළු ජනකොටස්වලට ඒත්තු ගැන්වීම පහසු නැත. එය කළ හැක්කේ අවංක ව සහ කැපවීමෙන් සමානාත්මතා ව්‍යාපාරයක් දියත් කිරීම මගිනි. ව්‍යවස්ථා මර උගුලින් රට ගලවාගැනීමෙන් පසු ව ''එළිය'' ව්‍යාපාරයට ඒ සඳහා නායකත්වය ලබාදිය හැකිය. යම් අවස්ථාවල මාක්ස්වාදියෙක් ලෙස ද පෙනී සිටින දයාන් ජයතිලක මහතාට සමානාත්මතා පදනමින් ජාතික ගැටළුව විසඳීමේ ප්‍රවේශයට නායකත්වය සැපයීමට බාධාවක් තිබේ ද? සිංහල ජනතාව භුක්ති විඳින අයිතිවාසිකම් සහ වරප්‍රසාද සියල්ල දෙමළ සහ මුස්ලිම් ජනතාවට ලබාදිය යුතුය යන සටන්පාඨය සිංහල, දෙමළ, මුස්ලිම් සියළු බලවේගවලට පිළිගත හැකි නො වේ ද?

ප්‍රායෝගික ව ඊට පක්ෂ ව ජනමතය ගොඩනැගීම සඳහා දේශපාලන ක්‍රියාකාරකමක් යෝජනා කළ හැකිය. ඒ සඳහා පළමු ව සිංහල බහුතර ජනතාව භුක්ති විඳින එහෙත් දෙමළ හෝ මුස්ලිම් ජනතාවට මේ වනතුරු ලැබී නැති අයිතිවාසිකම් සහ වරප්‍රසාද ලැයිස්තුගත කිරීමට සිංහල දේශපාලන බලවේගවලට ආරාධනා කළ යුතු ය. ඊට පසුව ලෝකයේ ඕනෑම රටක සුළු ජාතිකයින් භුක්තිවිඳින එහෙත් ශ්‍රී ලංකාවේ ලබාදී නොමැති අයිතිවාසිකම් සහ වරප්‍රසාද හඳුනාගෙන ඒවා ද එම ලැයිස්තුවට එකතු කළ යුතු ය. ඉන්පසු ව එම අයිතිවාසිකම් ලබාදෙන ව්‍යවස්ථා සංශෝධනයක් අවශ්‍ය බවට මහජන උද්ඝෝෂණයක් දියත් කළ යුතුය. ''එළිය ව්‍යාපාරය'' ඊට එළිය සපයනු ඇත. ඒ සඳහා සිංහල දෙමළ, මුස්ලිම් සියලු ජනතාව සහභාගීවන දැවැන්ත පා ගමනක් සංවිධානය කළ යුතු ය. එවිට ''සිංහල ජාතිවාදීන්'' ලෙස දයාන් ජයතිලක මහතා වැනි අය හඳුන්වන භික්ෂූන් වහන්සේලා පුමුඛ පැරණි ජාතිකවාදීන් සියලු දෙනා එම පාගමනේ පෙරමුණ ගනු ඇත. එවිට 13 සංශෝධනය අහෝසි කිරීම ගැන විශේෂයෙන් කතා කිරීම අවශ්‍ය නො වනු ඇත.

# 05

## ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණයෙන් ම අත්හැරිය යුත්තේ හෝ පරාජය කළ යුත්තේ ඇයි?

ත්‍රෛනිකායික අති පූජ්‍ය මහානායක හිමිපාණන් වහන්සේ විසින් පසුගිය දිනවලදී ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලියට අදාළව සිදුකරන ලද ප්‍රකාශවල වලංගුභාවය තවදුරටත් තහවුරු කිරීම සඳහා මෙම කරුණු දැක්වීම සිදුකෙරෙන බව කරුණාවෙන් සලකන්න.

වර්තමාන ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය ආශ්‍රිත ව පවතින ගැටළු සහගත තත්වයන් නිසා ඒ මගින් නව ව්‍යවස්ථාවක් හෝ ව්‍යවස්ථා සංශෝධනයක් සම්මත කිරීමට කටයුතු නො කළයුතු බව උන්වහන්සේගේ මතය විය.

ඒ අනුව මහා නායකහිමිපාණන් වහන්සේගේ මතය පිළිගෙන වර්තමාන ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය අත්හළ යුත්තේ හෝ එය සම්පූර්ණයෙන්ම පරාජය කළ යුත්තේ කුමක් නිසා ද? මාතෘකා අටක් යටතේ ඊට අදාළ කරුණු දැක්විය හැකිය.

### 01) ව්‍යවස්ථා සම්පාදන මණ්ඩලය පිහිටුවීම සඳහා ජනවරමක් නොමැති වීම

නව ව්‍යවස්ථාවක් සකස් කිරීම සඳහා හැට දෙලක්ෂයක ජනවරමක් ලැබී ඇති බවට විවිධ පාර්ශ්ව විසින් ව්‍යාජ මතයක්

පතුරුවමින් ඇත. නමුත් එම ජනවරම ලබා ගැනීම සඳහා වර්තමාන ජනාධිපතිවරයා විසින් ඉදිරිපත් කළ මැතිවරණ ප්‍රකාශනය මගින් නව ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම මුල්කරගෙන ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් පිහිටුවීම සඳහා කිසිදු ආකාරයකින් ජනවරමක් ඉල්ලා නැත. එසේ ම එම ප්‍රකාශනය මගින් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සඳහා ප්‍රතිඥාවක් ලබා දුන්න ද, ඒ තුළ ඉතා පැහැදිලිව සඳහන් වන්නේ ජනමත විචාරණයක් අවශ්‍ය නො වන සංශෝධන පමණක් සිදුකරන බවය. ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාවේ මූලික රාමුව වන විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සඳහා ජනමත විචාරණයක් අවශ්‍ය වන බව ඉතා පැහැදිලි කරුණකි. ඒ අනුව ව්‍යවස්ථා සංශෝධනයට අදාළව ලබාදී ඇති එම ප්‍රතිඥාව සාවද්‍ය සහ වලංගු නො වන බවට විවාදයක් නැත. එම ප්‍රකාශය මගින් ගම්‍ය වන්නේ, පවත්නා ව්‍යවස්ථාව යටතේ යම් සංශෝධනයක් පමණක් සිදු කිරීමට එතුමා එකඟ බව ය.

එක්සත් ජාතික පක්ෂය විසින් නව ව්‍යවස්ථාවක් සඳහා පාර්ලිමේන්තු මැතිවරණයේදී ප්‍රතිඥාවක් ලබා දුන්න ද එම පක්ෂයේ අපේක්ෂකයන් තරග වැදුණු එක්සත් ජාතික පෙරමුණට පාර්ලිමේන්තුවේ සාමාන්‍ය බහුතරයවත් ලැබී නැත. වර්තමාන ඒකාබද්ධ විපක්ෂය සහ ආණ්ඩුවේ එක් පාර්ශ්වයක් අයත්වන එක්සත් ජනතා නිදහස් සන්ධානය විසින් ව්‍යවස්ථා සංශෝධනයක් සඳහා කිසිදු ජන වරමක් ඉල්ලා සිටියේ නැත. ඒ අනුව නව ව්‍යවස්ථාවක් හෝ ව්‍යවස්ථා සංශෝධනයක් සඳහා ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් පිහිටුවීම සඳහා පැහැදිලි ජනවරමක් ලැබී නැත. එසේ ම, එවැන්නක් පිහිටුවීම සඳහා ප්‍රතිපාදනයක් පවතින ව්‍යවස්ථාවේ අඩංගු වන්නේ ද නැත. නමුත් 1972 දී ජනරජ ව්‍යවස්ථාව සඳහා ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් පිහිටුවීමේදී ඒ සඳහා ඊට පෙර පැවති මැතිවරණයේදී පැහැදිලි ජනවරමක් ලැබුණි. එසේ ම, එම ආණ්ඩුවට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතර බලයක් ද ලැබුණි.

## 02) ව්‍යවස්ථා සම්පාදනයට අදාළව සැඟවුණු අරමුණු තිබෙන බව ඔප්පු වීම

වර්තමාන ව්‍යවස්ථා සම්පාදක ක්‍රියාවලිය තුළ ප්‍රබල භූමිකාවක් ඉටු කරන ජාතික ලයිස්තු මන්ත්‍රීවරුන් වන එම්.ඒ. සුමන්තිරන් සහ ජයම්පති වික්‍රමරත්න යන මහත්වරු සහ වර්තමාන මුදල් අමාත්‍ය මංගල සමරවීර මහතා ඇතුළු උතුර නැගෙනහිර ස්වයං පාලනයක් වෙනුවෙන් පෙනී සිටින පිරිස් 2013 දී සිංගප්පූරුවේදී ඇති කරගත් එකඟතාවය ''සිංගප්පූරු එකඟතාව'' නමින් ප්‍රසිද්ධියට පත්වී ඇත. ඊට අදාළ ව ප්‍රසිද්ධියට පත්වී ඇති වාර්තා අනුව එදා පැවති ආණ්ඩුව වෙනස් කිරීම මුල්කරගෙන ව්‍යවස්ථා සංශෝධන පොරොන්දුව යොදාගැනීම සඳහා මංගල සමරවීර මහතා ''හිඟන්නෙක් සේ'' බැගෑපත් ව රැස්ව සිටි පිරිසගෙන් සහාය ඉල්ලා ඇත. සිංගප්පූරු එකගතාව නමින් ආණ්ඩුව වෙනස් කිරීම හෙවත් ''රෙජීම් චේන්ජ්'' සඳහා ඇතිකරගත් එකඟතාවට ඇතුළත් කරුණු දහය ම ව්‍යවස්ථා සංශෝධනයට අදාළ වේ. ඒ අනුව මහින්ද රාජපක්ෂ පරාජය කිරීම සහ ව්‍යවස්ථා සංශෝධනය යන කරුණු දෙක එකට බැඳී ඇති බව පැහැදිලි ව පෙනේ.

එසේ ම ඉන්පසු ව 2014 දී ලන්ඩන් නුවරදී අමිර්තලිංගම් ගුණානුස්මරණ දේශනය පවත්වමින් වර්තමාන ජාතික ලයිස්තු මන්ත්‍රී ජයම්පති වික්‍රමරත්න මහතා පවසන්නේ මහින්ද රාජපක්ෂ රජය පෙරළා දැමීමෙන් තොර ව දෙමළ ජනතාවගේ ගැටළුවට ව්‍යවස්ථාමය විසදුමක් ලබාදිය නො හැකි බව ය. ''විකිලීක්ස්'' මගින් හෙළිදරව් වූ විවිධ රාජතාන්ත්‍රික රහසිගත ලේඛන රාශිය මගින් ද රාජපක්ෂ ආණ්ඩුව පෙරළා දැමීම සහ උතුරේ ප්‍රශ්නය විසඳීම සඳහා ව්‍යවස්ථාමය විසඳුමක් ලබා දීම යන උවමනාවන් එකට බැඳී තිබුණ බව තව දුරටත් තහවුරු වේ. ඒ අනුව වර්තමාන ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය පසුගිය රජය පරාජය කිරීමේ ක්‍රියාමාර්ගය සමග බැඳී තිබෙන බව සහ ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය ඒ තුළින් උපත ලබන්නක් බව පැහැදිලි වේ. එසේනම් ඒ තුළ කුඨ දේශපාලන අරමුණක් සැඟව තිබෙන බව පැහැදිලි වේ.

## 03. වර්තමාන ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලියට අයුතු බටහිර බලපෑම් එල්ලවීම

2015 ඔක්තෝබර් 01 වැනි දා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සමුළුව විසින් ලංකාවේ එකඟතාව මත ඒකමතික ව සම්මත කළ 30/1 යෝජනාවලියේ 16 වැනි වගන්තිය මගින් ශ්‍රී ලංකා රජයට බල කරන්නේ, නව ව්‍යවස්ථා සංශෝධනයක් මගින් 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය හරහා සිදු කළ බලය බෙදීම තවදුරටත් තහවුරු කරන ලෙස ය. එසේ ම මානව හිමිකම් මහ කොමසාරිස්වරයා විසින් ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාවේ අඩංගු විය යුතු කරුණු 4ක් සෘජු ව නිර්දේශ කොට ඇත. ඊට අමතර ව ශ්‍රී ලංකාවට පැමිණි එක්සත් ජාතීන්ගේ විවිධ විශේෂ නියෝජිතයන් කිහිප අවස්ථාවකදී ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේ අවශ්‍යතාව අවධාරණය කොට ඇත.

මේ වන විට ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලියට සහාය දීම සඳහා පත්කොට තිබෙන තාක්ෂණික කමිටුවේ උපදේශකයන් සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් මූල්‍යමය ගෙවීම් සිදු කරන බවට ද ජාතික පුවත්පත් විසින් හෙළිදරව් කොට ඇති අතර, රජයේ කිසිදු වගකිවයුත්තෙක් එම වාර්තා ප්‍රතික්ෂේප කොට නැත. 2016 අගෝස්තු මාසයේ ශ්‍රී ලංකාවට පැමිණි '' නිව් ඕර්ලියන්ස්'' නමැති ඇමරිකානු නෞකාවේ පැවති උත්සවයට සහභාගි වූ ඇමරිකානු තානාපති අතුල් කෙෂාප් කියා සිටියේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේදී පොරොන්දු වූ ආකාරයට ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා ඇමරිකානු රජය ශ්‍රී ලංකාවට උදව් කරන බවය.

## 04. මහජන අදහස් ලබා ගැනීමේ ක්‍රියාවලියේ කූඨ බව

පළමුවෙන් ම මහජන අදහස් ලබා ගැනීම සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතියකින් තොර ව, අමාත්‍ය මණ්ඩලය විසින් ''ලාල් විජේනායක'' කමිටුව නමින් කමිටුවක් පත් කරන්නේ ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය පිහිටුවීමට පෙර 2015 දෙසැම්බර් 22 දින දීය. ඒ අනුව එය ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයට අයත් ක්‍රියාවලියේ

කොටසක් හෝ වගකීමක් බවට පත් නො වේ. වසර 30කට අධික කාලයක සිට බෙදුම්වාදී මතවාද සාධාරණීකරණය කළ පුද්ගලයෙක් ලෙස පක්ෂග්‍රාහී බවට චෝදනාවට ලක්වී ඇති ලාල් විජේනායක මහතා නායකත්වය දැරූ එම කමිටුව විසින් තෝරාගත් ප්‍රශ්න 20කට අදාළ ව පමණක් මහජන අදහස් ලබාගෙන ඇත. එහිදී අදහස් ලබා දුන්නා යැයි සැලකෙන පිරිස රටේ ජනතාවගෙන් 0.0002 තරම් ඉතා සුළු පිරිසකි. එම හේතුව මත අදාළ වාර්තාව මගින් මහජන මතයක් පිළිබිඹු නො වන බව ඉතා පැහැදිලිව තේරුම් ගත හැකිය.

ඊට අමතර ව 2016 මාර්තු මස 09 වන දින සම්මත කළ ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය පිහිටුවීමේ යෝජනාවට අනුව මහජන අදහස් සලකා බැලීමක් සිදු කළ යුතු වුවත්, ඒ සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් නො වීය. නමුත් 2016 මැයි මස 19 වැනි දින පුවත්පත්වල පළ කළ දැන්වීමක් මගින් මැයි මස 31 වන දිනට පෙර අදහස් දන්වා එවන ලෙස දින 11ක කාලයක් පමණක් මහජනයාට ලබාදී ඇත. එම දැන්වීම පළ කරන්නේ කාලය දීර්ඝ කිරීම සඳහා බවට සඳහන් ව තිබුණ ද, ඊට පෙර මහජන අදහස් ඉල්ලා දැන්වීමක් පළ නො වී ය. ඒ අනුව සද්භාවයෙන් සහ සැබෑ ලෙස ම මහජන අදහස් අනුව ව්‍යවස්ථාවක් සකස් කිරීමේ අරමුණක් නොමැති බව පැහැදිලි වේ.

## 05) ව්‍යවස්ථා සම්පාදක මණ්ඩල ක්‍රියාවලියේ කූඨ බව

ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් පිහිටුවීම සඳහා සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවයෙන් සම්මත කළ යෝජනාවේ 11 වැනි වගන්තිය අනුව උප කමිටුවල සාකච්ඡා මාධ්‍යයට නිරාවරණය කළ යුතු ය. එහෙත් ඒවා රහසිගත ව සිදු කළා පමණක් නො ව ඒවා තුළ මන්ත්‍රීවරුන්ගේ අදහස් පවා සැලකිල්ලට නොගත් බවට අදාළ මන්ත්‍රීවරුන් විසින් ප්‍රසිද්ධියේ චෝදනා කරනු ලැබී ය. තවත් මන්ත්‍රීවරුන්ගේ යෝජනා වාර්තාවට ඇතුළත් කළ යුතු බවට ඔවුන් ඉල්ලා සිටියදී කාලය නොමැති බව පවසා අදාළ කමිටු සභාපතිවරුන් විසින් ඊට අවස්ථාව ලබා නො දුන් බවට ද එම කමිටුවලට චෝදනා එල්ල විය.

පාර්ලිමේන්තුව විසින් සම්මත කළ යෝජනාව අනුව උප කමිටු 6ක් සහ මෙහෙයුම් කමිටුවක් පත් කරනු ලැබුවේ එහි මුල් සැසිවාරයේ දී ය. ඉන් පසු ව අනු කමිටු පත් කළ නො හැකි වුවත් තවත් අමතර කමිටුවක් මගින් පාර්ලිමේන්තුව සහ පළාත්සභාව අතර සබඳතා පිළිබඳ ව වාර්තාවක් ලබාගෙන ඇත. එම කමිටුව යෝජනා සම්මතයක් නො මැති ව මෙහෙයුම් කමිටු සභාපතිවරයා විසින් රහසිගත ව පත් කළ කමිටුවක් ලෙස සැලකේ. ඊට අමතර ව මෙහෙයුම් මණ්ඩලයට ලැබුනායයි පවසන මහජන අදහස් ව්‍යවස්ථා සභාවෙන් පරිබාහිර කමිටුවක් වූ ''ලාල් විජේනායක'' කමිටුවට ඉදිරිපත්කොට, ඒ මගින් දෙවන වරට ද වාර්තාවක් ලබාගෙන ඇත. නමුත් ඒ සඳහා ද ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය හරහා මන්ත්‍රීවරුන්ගේ අනුමැතිය ලැබී නැත.

පාර්ලිමේන්තුව විසින් සම්මත කළ යෝජනාව අනුව උප කමිටු වාර්තා සහ මහජන අදහස් අනුව මෙහෙයුම් කමිටුව විසින් වාර්තාවක් සහ ව්‍යවස්ථා කෙටුම්පතක් සකස්කොට ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය. නමුත් එම ක්‍රමවේදය උල්ලංඝණය කරමින් උප කමිටු වාර්තා මෙහෙයුම් කමිටුව තුළ සාකච්ඡා කිරීමෙන් තොර ව ඒවා ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබී ය. 2016 නොවැම්බර් 19 දින උප කමිටු වාර්තා එසේ ඉදිරිපත් කරනු ලැබුවේ මෙහෙයුම් කමිටු වාර්තාවක් ලෙස හඳුන්වා දෙමිනි.

නමුත් ඉහත සදහන් කළ පාර්ලිමේන්තුව අනුමත කළ යෝජනාව උල්ලංඝණය කරමින් පත් කළ අමතර කමිටුවේ වාර්තාව මෙහෙයුම් කමිටුවට ඉදිරිපත් කරන්නේ 2016 දෙසැම්බර් 10 වන දිනයි. මෙතෙක් ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ නියෝජිතයින් වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට නිලවශයෙන් ඉදිරිපත් නො කළ වාර්තා කෙටුම්පතක්, 2016 නොවැම්බර් 23 දින සිට මාස 9ක් තිස්සේ මෙහෙයුම් කමිටුව තුළ සාකච්ඡා වෙමින් තිබුණි. අවසානයේදී මෙහෙයුම් කමිටුව විසින් ව්‍යවස්ථා කෙටුම්පතක් නො මැති ව වාර්තාවක් පමණක් ව්‍යවස්ථා මණ්ඩලයට ඉදිරිපත්කොට ඇත. එම

වාර්තාවේ ඇමිණුම් ලෙස ඊට දායකත්වය ලබාදුන් පක්ෂවල ලිඛිත අදහස් ඇතුළත් කොට ඇතත් එක්සත් ජාතික පක්ෂය විසින් එවැනි ලේඛනයක් ලබාදී නැත. ඒ මගින් පැහැදිලි වන්නේ සමස්ත ව්‍යවස්ථාව තුළ අඩංගු වන්නේ එක්සත් ජාතික පක්ෂයේ යෝජනා බව ද?

## 06) බෙදුම්වාදී ඉල්ලීම්වලට යටත්වීමේ අනතුරක් පැවතීම

විවිධ ක්‍රමවේද හරහා මහජනයා අතට ලැබුණු මෙහෙයුම් මණ්ඩලය තුළ රහසිගත ව සාකච්ඡාවට ලක්වී තිබෙන උප කමිටු වාර්තා අනුව ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය තුළ ප්‍රමුඛතාව හිමි ව ඇත්තේ පළාත්වලට බෙදා ඇති බලය තවදුරටත් ශක්තිමත් කිරීම, 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන් ම ක්‍රියාත්මක කිරීමට එරෙහි ව පවතින බාධා ඉවත් කිරීම  පරමාධිපත්‍ය බලය බෙදී යාම සහ මධ්‍ය ම රජයේ බලතල අඩු කිරීම, ආදී වශයෙන් වන බෙදුම්වාදී බලවේග විසින් දීර්ඝ කාලයක් තිස්සේ ඉදිරිපත් කළ යෝජනා ප්‍රමාණයකට ය. එහිදී රටේ ජීවත්වන එක් ජනකොටසක් වන දෙමළ ජනතාවගේ අපේක්ෂා ඉටු කිරීම  ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලියේ ප්‍රධානතම අරමුණ බවට ද රජයේ පාර්ශ්වයෙන් ප්‍රසිද්ධියේ අදහස් පළ වේ. ඒවා සියල්ල සැලකිල්ලට ගැනීමේදී නව ව්‍යවස්ථාවක් හෝ ව්‍යවස්ථා සංශෝධනයක් ඉදිරිපත් කිරීමේ මූලික අරමුණ බෙදුම්වාදී බලවේග සතුටු කිරීම බව පැහැදිලි ව පෙනේ.

## 07) ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලියට අදාළ ආණ්ඩුවේ සද්භාවය පිළිබඳව මහජන විශ්වාසය බිඳ වැටීම

මැතිවරණ සමයේදී විධායක ජනාධිපති ක්‍රමය වෙනස් කිරීම සඳහා ව්‍යවස්ථාවක් ගෙන එන බවට පොරොන්දු ලබා දුන්න ද දැන් එම සංවාදය යටපත් වී, එසේ පොරොන්දු දුන් දේශපාලනඥයන් නැවත විධායක ජනාධිපති තරගයට ඉදිරිපත් කිරීමට අදාළ සංවාදයක් සමාජයේ මතු වී ඇත. මීට පෙර ජනාධිපතිවරණ දෙකේදී ම එවැනි පොරොන්දු ලබාදී ඒවා නො සලකා හැර ඇත. එම පොරොන්දුවලට අදාළ යෝජනා මහජන අපේක්ෂා තුළින් ම උපන් ඒවාට වඩා

දේශපාලනඥයන් විසින් නිර්මාණය කරන ලද සටන්පාඨ බවට දූන් සමාජ මතයක් ගොඩනැගී ඇත. එම නිසා ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලියේ සද්භාවය බරපතල ලෙස අභියෝගයට ලක්වී ඇත. එම ක්‍රියාවලිය රහසිගත ව සිදු කිරීම නිසා අපේක්ෂා භංගත්වය තවදුරටත් වර්ධනය වෙමින් ඇත. මහජනයාට රහසිගත ව හෝ සහ ඔවුන්ගේ අපේක්ෂාවලට පටහැනි ව සිදුකරන ව්‍යවස්ථා සංශෝධන වලට සැබෑ මහජන අනුමැතිය ලබා ගැනීම දුෂ්කර වේ. ඒ නිසා එවැනි දේ අනුමත කර ගැනීම සඳහා කූඨ ක්‍රමවේද සහ බලහත්කාරය යොදා ගැනීමට සිදුවේ.

## 08) බලහත්කාරයෙන් හෝ කූඨ ආකාරයට සම්මත කරන ව්‍යවස්ථාවකින් බෙදුම්වාදීන්ට බලය ලබා දීම මගින් සමාජය ප්‍රචණ්ඩත්වයට යොමු වීම

ශ්‍රී ලංකාවේ පය තබා ගැනීමට මාන බලන බටහිර සහ ඉන්දියානු අධිරාජ්‍යවාදී බලවේග, තම අරමුණු ඉටුකර ගැනීම සඳහා යොදා ගන්නා මූලික ම උපාංගය වන්නේ ප්‍රචණ්ඩත්වයයි. ඊට සාපේක්ෂ ව බලනවිට බෙදුම්වාදී ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය යනු දෙපැත්ත කැපෙන ආයුධයකි. එක පැත්තකින් ඒ හරහා රාජ්‍යය දුර්වල කොට රට දෙකඩ කිරීමේ ක්‍රියාවලියට මග පාදයි. එම ක්‍රියාවලිය තුළ අවසානයේදී වෙන ම රටක් ප්‍රකාශයට පත්කෙරෙන තත්වය නිර්මාණය කෙරෙන්නේ නිරායුධ සිවිල් ජනතාවට එරෙහි ව යොදා ගන්නා ප්‍රචණ්ඩත්වය මගිනි. ඉන් පසුව එම ක්‍රියාවලිය සාධාරණීකරණය කෙරෙන්නේ ප්‍රචණ්ඩත්වය අවසන් කිරීමේ නාමයෙනි. දකුණු සුඩානය සහ කොසෝවෝ බෙදා වෙන් කිරීමේදී ඉතා ම්ලේච්ඡ ලෙස සහ සූක්ෂම ලෙස ප්‍රචණ්ඩත්වය යොදා ගත් ආකාරය ලෝකයට රහසක් නො වේ.

අනෙක් පැත්තෙන් ගත් විට සමස්ත ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය තුළ මෙන් ම, බෙදුම්වාදීන්ට බලතල ලබාදීමෙන් පසුව ඔවුන් විසින් නිර්මාණය කරනු ලබන තත්වයන් තුළ සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනතාව අතර එකිනෙකා කෙරෙහි වන සැකය- බිය සහ අවිශ්වාසය වර්ධනය වේ. ඒ ගිනි තවදුරටත් ඇවිලවීම සඳහා

ජාත්‍යන්තර සහ දේශීය බෙදුම්වාදී බලවේග විසින් ''පෙට්‍රල්'' විසිකරනු ඇත. ලෝකය පුරා බටහිර රටවල ඔත්තුසේවා විසින් තම දේශපාලන අරමුණු ඉටුකර ගැනීම සඳහා ම්ලේච්ඡ ලෙස සහ සැලසුම් සහගත ව ප්‍රචණ්ඩත්වය යොදා ගැනීම පිළිබඳ ව අත්දැකීම් රාශියක් ඇත.

ඉරාකයේ, ලිබියාවේ, සිරියාවේ සහ ඇෆ්ගනිස්ථානයේ මෙන් ම, සර්බියාවේ ද ඔවුන් විසින් ජාතිවාදී ගැටුම් අවුළුවා ඒවා දඩමීමා කරගෙන සමස්ත සමාජය ම ප්‍රචණ්ඩත්වයට ගොදුරු කරන ආකාරය සහ ඒ මත එම රටවල් ජාතිවාදී පදනමින් කැබලි කිරීමට මුල පුරන ආකාරය ලෝකයට රහසක් නො වේ. ''අයි.එස්.අයි.එස්'' වැනි අන්තවාදී ත්‍රස්ත කණ්ඩායම් පුහුණුකොට ආයුධ ලබා දී පසුව ඔවුන්ට ම පහර දෙමින් ලෝකය පුරා ප්‍රචණ්ඩත්වය අවුළුවන ආකාරය ද දැන් ලෝකයට රහසක් නො වේ.

බෙදුම්වාදී ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය හරහා අප රටේ ජනතාවගේ නළලේ කොටන්නේ එම කාලකන්නි අවාසනාවන්ත ඉරණම නො වේ ද? නමුත් ඊට වගකිවයුත්තන් කියන්නේ අප බිල්ලන් මවන බව ය. එහෙත් එපමණ ජීවමාන අත්දැකීම් අප ඉදිරියේ තිබියදී එවැනි දේ සිදු නො වන බවට සහතික දිය හැක්කේ සතුරන්ගේ ඔත්තුකරුවන්ට පමණි. රටක් බෙදීමේ ශල්‍යකර්මය සඳහා සමස්ත සමාජය සිහි නැති කළ යුතු ය. එසේ නැතහොත් හිරිවැට්ටවිය යුතු ය. ඒ සඳහා යොදා ගන්නා ප්‍රත්‍යක්ෂ ඖෂධය ප්‍රචණ්ඩත්වයයි. ජාත්‍යන්තර බෙදුම්වාදී බලවේග විසින් ප්‍රචණ්ඩත්වය නැතිකිරීමේ මුවාවෙන් ගිවිසුම් ගසා දෙකඩ කළ සුඩානයේ ජනතාව අද දෙපසට වී මරා ගන්නා ආකාරය ජාත්‍යන්තර මාධ්‍ය වාර්තා කරන්නේ මෙසේ ය. ''සුඩානය මියගොස් ය, කිසිවෙකු මළ මිනී ගණින්නේ නැත''

## මේ විනාශයෙන් ගැලවෙන්නේ කෙසේ ද?

ඉන්දියාවේ බලපෑම මත සිදු කළ 13 වන ව්‍යවස්ථා සංශෝධනය නිසා රටට සිදු වූ අනර්ථය පිළිබඳ ව මතකය සහිත පොදු මහජනතාව තවත් ඊට සමාන ආකාරයට බලපෑමට යටත් වූ

රහසිගත ක්‍රියාවලියකින් උපත ලබන නව ව්‍යවස්ථාවකින් හෝ ව්‍යවස්ථා සංශෝධනයකින් රටට යහපතක් සිදු නො වන බව විශ්වාස කිරීම ඉතා සාධාරණ වේ. පවතින ව්‍යවස්ථාවේ අඩංගු වන දුර්වලතා එවැනි ක්‍රියාමාර්ග වලින් නිවැරදි නො වන බවට ද රටේ පොදු මහජන මතයක් ගොඩනැගී ඇත. එවැනි තත්වයක් තුළ දැනට දියත් වී ඇති, ව්‍යවස්ථා විරෝධී ව සහ මහජන අනුමැතියෙන් තොරව ක්‍රියාත්මක වන බහුතර මහජන විරෝධයට ලක් වී ඇති ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය වහා නවතා දමා මහජන විශ්වාසය නැවත ගොඩනගා ගැනීම රටේ සහ රජයේ පැවැත්ම සඳහා ඉතා වැදගත් වේ.

එම නිසා මහා සංඝරත්නයේ මතයට ගරු කොට ආණ්ඩුව සහ විපක්ෂය ඇතුළු සියලු පාර්ශ්ව එකඟතාවයෙන් යුතුව වර්තමාන ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය අවසන් කළ යුතු ය. ඉන් පසුව පාර්ලිමේන්තු කාරක සභාවක් හෝ වෙනත් සුදුසු ව්‍යවස්ථානුකූල යාන්ත්‍රණයක් මගින් වඩා පුළුල් ආකාරයට සහ විවෘත ලෙස මහජන අදහස් ලබා ගැනීමේ ක්‍රියාවලියක් ආරම්භ කළ යුතු ය. එම සංවාදය තුළින් උපත ලබන මූලික ව්‍යවස්ථා සංකල්පීය රාමුවක් දේශපාලන පක්ෂවල ප්‍රතිපත්ති වලට අනුකූල වන වෙනස්කම් සහිත ව මහජනයාට ඉදිරිපත් කළ යුතුය. ව්‍යවස්ථාවේ අඩංගු විය යුතු ප්‍රතිපත්ති පදනම් කරගෙන මහජනයා විසින් එම පක්ෂ සඳහා තම ඡන්දය ඉදිරි මැතිවරණවලදී ප්‍රකාශ කරනු ඇත. ඒ අනුව ඉදිරි ජනාධිපතිවරණය ව්‍යවස්ථාව පදනම් කරගත් ජනමත විචාරණයක් බවට පත්වනු ඇත. එය වඩා ප්‍රජාතන්ත්‍රවාදී සහ රටට සහ ජනතාවට සුබවාදී ක්‍රමවේදය නො වේ ද?

## පසුවදන

# ජනමත විචාරණයක් උවමනා කාට ද?

දැනට ගොඩනැගෙමින් පවතින ඉතා සංකීර්ණ දේශපාලන වාතාවරණය තුළ ආණ්ඩුව මෙන් ම විපක්ෂය ද විවිධ මානසික යුද උපක්‍රම තෝරන බව පෙනේ. ඒවා විශ්ලේෂණය කිරීමේදී පෙනී යන්නේ විවිධ බලවේග විවිධ හේතු සහ අරමුණු මත ජනමත විචාරණයක අවශ්‍යතාව නිර්ණය කරන බව ය. මහජනයාගේ පැත්තෙන් ගත්විට ඔවුහු මේ මොහොතේ ජනමත විචාරණයක් අපේක්ෂා නො කරති. ඔවුන්ගේ මූලික අවශ්‍යතාව වන්නේ උදුරාගත් පළාත් සභා සහ පළාත් පාලන මැතිවරණ ඡන්ද අයිතිය හැකි ඉක්මනින් නැවත ලබා ගැනීම ය.

බෙදුම්වාදී බලවේග පැත්තෙන් බලන විට දිර්ඝ කාලයක් තිස්සේ ඉල්ලා සිටි, ඔවුන්ට අවශ්‍ය සියලු බෙදුම්වාදී බලතළ වර්ථමාන ව්‍යවස්ථාව සංශෝධනය කිරීමෙන් ලබාගත හැකිය. ඒ සඳහා ජනමත විචාරණයකට තුඩු දෙන සංශෝධන අවශ්‍යවන්නේ නැත. නව ව්‍යවස්ථාවක් අවශ්‍යවන්නේ ද නැත. ඔවුනට අවශ්‍ය වන්නේ 13 වන සංශෝධනය සම්පූර්ණයෙන් ම බලාත්මක කිරීමට එරෙහි ව පවතින ව්‍යවස්ථාමය බාධක ඉවත්කර ගැනීම සහ හැකිනම් තිබෙන ප්‍රතිපාදන තවදුරටත් ශක්තිමත් කර ගැනීමය. සරල වචනවලින් කියනවානම් ඔවුනට අවශ්‍යවන්නේ ෆෙඩරල් ලේබලය නොමැති ෆෙඩරල් රාජ්‍යයක් නිර්මාණය කිරීම ය. ඒ සඳහා ජනමත විචාරණයක් අවශ්‍යවන්නේ නැත.

නමුත් ජනමත විචාරණයක් අවශ්‍ය වන සංශෝධන මගින් ''ෆෙඩරල්'' අභිබවා යන ''කොන් ෆෙඩරල්' ව්‍යවස්ථාවක් සම්මත කර ගත හැකිනම් ඔවුන් ඊට ඉහළින් ම කැමති වනු ඇත. එවැනි තත්වයකදී ඔවුන් ජනමත විචාරණයකින් ජයග්‍රහණය හෝ පරාජය යන කුමන ප්‍රතිඵලය ලබා ගත්ත ද අවසානයේදී එය බෙදුම්වාදී න්‍යාය පත්‍රයට වාසිදායක වේ. ජයග්‍රහණය කළහොත් සහ සන්ධිය

හෙවත් ''කොන් ෆෙඩරල් රාජ්‍යයක්'' නිර්මාණය වේ. එය පරාජය වුවහොත් උතුර නැගෙනහිර පළාත්වල ජයග්‍රහණය වෙන්කොට හුවා දක්වා ස්වයං පාලනය සඳහා එම ජනතාවගේ කැමැත්ත ජාත්‍යන්තර ව තහවුරු කිරීමට ඉඩ ඉතිරි වේ.

එසේ වුවත් වසර 30ක් යුද්ධකොට පරාජය වී පාඩම් ඉගෙනගත් බෙදුම්වාදී බලවේග එවැනි සිහිනයක ගිලී කටයුතු නො කරනු ඇත. එයට හේතුව ජනමත විචාරණයකට තුඩු දෙන බරපතළ සංශෝධන සිදු කිරීමට උත්සාහ කළහොත් පාර්ලිමේන්තුවේදී ''තුනෙන් දෙක'' අහිමි වී සියල්ල අහිමි වීමය. ව්‍යවස්ථා සංශෝධනය කර තබාගෙන යන රනිල් වික්‍රමසිංහ මහතාට පාර්ලිමේන්තුවේ සාමාන්‍ය බහුතරයත් නැත. ඒ නිසා බෙදුම්වාදී බලවේගවලට වඩාත් ආරක්ෂාකාරී වන්නේ ජනමත විචාරණයක් දක්වා නො යන, කුඨ ව්‍යවස්ථා සංශෝධනයකින් ''වැඩේ'' බේරා ගැනීම ය. බෙදුම්වාදී මාර්ග සිතියමට ඍජු ව හා තාක්ෂණික ව සේවය නො කරන බුද්ධාගමට හිමි තැන අහිමි කිරීම හෝ ඒකීය වචනයේ එල්ලීමට ඔවුන්ට අවශ්‍ය නැත. ඒකීය වචනය ව්‍යවස්ථාවේ එසේ ම තිබියදී රටේ ඒකීයභාවය නැති කරන ආකාරය ඔවුන් ඉතා හොඳින් අධ්‍යයනය කොට ඇත. දැන් එම සොයාගැනීම් නිවැරදි බවට අධිකරණ තීන්දුවක් ද ලැබී ඇත.

ආණ්ඩුවේ මෛත්‍රී පාර්ශ්වය ගත් විට ඔවුන් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට හෝ ජනමත විචාරණයකට තුඩු දෙන සංශෝධනවලට එකඟ නැති බව පැහැදිලිව ප්‍රකාශ කොට ඇත. යම් පුද්ගලයින් විටින් විට ඊට ප්‍රතිවිරුද්ධ මත ප්‍රකාශ කළ ද මේ වන තුරු ඔවුන්ගේ නිළ මතය වන්නේ එයයි. නමුත් ඊළඟ ජනාධිපතිවරණයේදී තමාට ජයග්‍රහණය කිරීමට ඉඩක් නැති බවට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා කල්පනා කරන්නේ නම් තත්වය වෙනස් විය හැකිය. එනම්, ජනමත විචාරණයක් මගින් විධායක ජනාධිපති ක්‍රමය අහෝසිකොට වර්තමාන ධූර කාලයෙන් පසුව විධායක නො වන ජනාධිපති තනතුර තමාට ම ලැබෙන බවට සහතිකයක් ලැබේ නම් ඔහු ඊට එකග වීමේ යම් ඉඩ කඩක් ඇත.

ආණ්ඩුවේ රනිල් පාර්ශ්වය ගත් විට, ඔවුන් බෙදුම්වාදීන්ට අවශ්‍ය දේ ලබා දීමට එක පයින් කැමැත්ත දක්වන බවට විවාදයක් නැත. එහෙත් ඔවුන් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම පිළිබඳ දරන මතයේ අවංක භාවය පිළිබඳ සැක මතු වේ. රනිල් වික්‍රමසිංහ මහතාගේ විධායක ජනාධිපති සිහිනය ඉතා ප්‍රබල හේතුවක් නො මැති ව ඔහු විසින් අත් හරිනු ඇතැයි සිතිය හැකි ද? පරාජය අභිමුව ඔහු දෙවතාවක් එම අවස්ථාව ''පරිත්‍යාග' කළද ජයග්‍රහණය හමුවේ එසේ කරනු ඇතැයි සිතිය නො හැකිය.

බෙදුම්වාදයට පක්ෂපාත සුළු ජාතික පක්ෂවලට ද තම කේවල් කිරීමේ බලය ඉතා හොඳින් ආරක්ෂා කර ගත හැක්කේ විධායක ජනාධිපති ක්‍රමය තුළ දීය. එසේ ම පාර්ලිමේන්තුව තුළ දී තුනෙන් දෙක අහිමි කිරීමේ සටනට වාසි සහගත වන ප්‍රබල සංශෝධන යෝජනා කිරීම අනතුරුදායක බව සියලු පාර්ශ්ව ඉතා හොඳින් දනිති. කෙසේවෙතත් එම තත්වය එසේ තිබියදී පළාත් පාලන මැතිවරණයට පෙර ව්‍යවස්ථාවට පක්ෂපාත සියලු බලවේගවල ශක්තිය තම ශක්තිය බවට හුවා දක්වා ජාතික මැතිවරණයක් වන ජනමත විචාරණයක් ජයග්‍රහණය කිරීම මගින් රනිල් වික්‍රමසිංහ මහතාගේ අනාගත බල ව්‍යාපෘතිය ශක්තිමත් කළ හැකි බවට විවාදයක් නැත.

ජනතා විමුක්ති පෙරමුණ ද විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සඳහා ජනමත විචාරණයකට යා යුතු බවට අවධාරණය කරයි. එහෙත් ඊට ආවරණය වෙමින් බෙදුම්වාදී න්‍යාය පත්‍රයට අදාළ ව සිදු කිරීමට නියමිත සංශෝධන පිළිබඳ ව ඔවුන් වචනයක් හෝ කතා කරන්නේ නැත. ඒ මගින් ඔවුන් තම ඓතිහාසික භූමිකාව සම්පූර්ණයෙන් අතහැරීමට සූදානම් බව කිසිදු දෙගිඩියාවකින් තොර ව මහජනතාවට පෙන්වති. අද වන විට එන්.ජී.ඕ. කාරයෙක් සහ යූ.එන්.පී. කාරයෙක් විසින් මෙහෙයවනු ලබන ජනතා විමුක්ති පෙරමුණ එසේ දුෂ්ය පාවා දීමේ ස්ථාවරයකට තල්ලුවීම පුදුමයට කාරණයක් නො වේ. සැම විට ම මහින්ද රාජපක්ෂ භීතිකාවෙන් පෙළෙන ඔවුන් දේශපාලනය තෝරන්නේ පරාජිත මහින්ද රාජපක්ෂ

පය තබන ආකාරය දෙස බලාගෙන ය. මහින්ද රාජපක්ෂ මහතා පසුගිය ජනාධිපතිවරණයේදී ඔවුන් විසින් ම පරාජය කළ බව ඔවුන්ට දැන් අමතක වී ඇත. ඒ තුළ ඔවුන් රනිල් වික්‍රමසිංහ මහතා ශක්තිමත් කෙරන බෙදුම්වාදයට පක්ෂපාතී ස්ථාවරයකට තල්ලුවී ඇත. එහෙත් හැට දහසකගේ මෙන්ම එම පක්ෂයේ නිර්මාතෘවරයාගේ ජීවිත පූජා කොට තහවුරු කළ බෙදුම්වාදී විරෝධී දේශපාලන ස්ථාවරය එසේ පහසුවෙන් වෙනස් කිරීමට යම් කිසි හෘද සාක්ෂ්‍යයක් තිබෙන පාක්ෂිකයන් ඉඩ දෙනු ඇතැයි සිතිය නො හැකිය. එනිසා හෙමින් සීරුවේ ඔවුන් විසින් වැඩි සක්‍රියභාවයකින් තොර ව ව්‍යවස්ථා සංශෝධනය සම්මත වීමට ''ඉඩ හැරීමේ'' උපක්‍රම තේරීමට වැඩි ඉඩක් ඇත.

ඒකාබද්ධ විපක්ෂය ගත් විට ඔවුන් විසින් ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය සහමුලින්ම පරාජය කිරීම සඳහා සුවිශේෂී උපාය මාර්ගික සැලසුමක් තෝරා ඇති බවක් පෙනෙන්නට නැත. ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය ආරම්භ වීමට පෙර සිටම එනම් 19 වන ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීමේ සිටම ඔවුන් විසින් පෙන්වනු ලැබුවේ ආන්ඩුවේ උපායමාර්ගයට ගොදුරුවීමේ ප්‍රවනතාවයකි. ආණ්ඩුව විසින් පසුගිය කාලය තුළ ප්‍රජාතන්ත්‍ර විරෝධීව සහ බලහත්කාරයෙන් රටට හතුරු අනපනත් සම්මත කරන විට ඒකාබද්ධ විපක්ෂය විසින් ඊට එරෙහිව ප්‍රබල විරෝධයක් එල්ල කළේ නැත. 2007 දී සභාගත කොට තිබූ පනතකට කාරක සභා අවස්ථාවේදී සංශෝධන 33ක් ගෙන ඒමේ තක්කඩි ක්‍රියාවට එරෙහිව ඊට තුනෙන් දෙකේ බහුතර කැමැත්ත අහිමි කිරීම සඳහා ඔවුන් විසින් ප්‍රබල උත්සාහයක් දැරුවේ නැත. දස දෙනෙක් පනින බවට පුරසාරම් දෙඩුවත් හත් දෙනෙකුගේ කැමැත්ත අහිමි කිරීමට එසේ කළ හැකි බවට උදම් අනන නායකයින්ට නොහැකි විය. එසේ නැතහොත් ඔවුන් විසින් හිතා මතා තුනෙන් දෙක ගැනීමට ඉඩ හැර බලා සිටියාද විය හැක.

එවැනි චෝදනාවක් සාධාරණීයකරණය කිරීමට සිදුවන්නේ ඉදිරියේදී ව්‍යවස්ථා සංශෝධනය පරාජය කිරීමට අදාළව යම්

නායකයින් දරන මතය නිසාය. ඔවහු දැන් නව මතයක් තහවුරු කිරීමට උත්සහ දරති. එනම් ව්‍යවස්ථා සංශෝධනයට එරෙහිව පාර්ලිමේන්තුවේ ''තුනෙන් දෙක'' අහිමි කිරීම ගැටළු සහගත බැවින් ජනමත විචාරණයකදී එය පාජය කිරීමට සූදානම් විය යුතු බවයි. ඒ මගින් ඔවුන් ඉල්ලා සිටින්නේ මේවන විට ''තුනෙන් දෙකේ හන්දියේ'' පොලු තබාගෙන සිටින පිරිස් වහාම එම කඳවුර හකුලාගෙන ජනමත විචාරණ හන්දිය දක්වා පසු බසින ලෙසය.

යුද්ධයේ මූලික මූලධර්ම පිළිබඳව ''අයන්න'' දන්නා නායකයන්ට නම් එවැනි යුද උපාය මාර්ග තේරිය නොහැක. සතුරා දුර්වල සෑම සන්ධිස්ථානයකදීම පහර නොදුනහොත් ඔහු ඊලඟ සන්ධිස්ථානයට යන්නේ ශක්තිමත්වය. පාර්ලිමේන්තුවේ සාමාන්‍ය බහුතරයවත් නොමැති ආණ්ඩුව ''තුනෙන් දෙකේ හන්දියේදී'' මුණගැහෙන්නේ ඉතා දුර්වල තත්වයෙනි. ඒ නිසා එතන සටන අවතක්සේරු කිරීම හෝ දියාරු කිරීම හෝ අතහැරීම යනු සතුරාට අවශ්‍ය දෙයකි. පාර්ලිමේන්තුවේ සටන ජයග්‍රහණය කළහොත් ජනමත විචාරණ සටන අවශ්‍ය නොවේ. එමෙන්ම පාර්ලිමේන්තුවේදී ප්‍රහල සටනකින් සතුරාට අභියෝග කරන්නේනම් ජනමත විචාරණ සටන අතහැරරීමට සතුරාට බලකෙරේ. ඒ සියල්ල මගින් පැහැදිලි වන්නේ ඒකාබද්ධ විපක්ෂයේ යම් නායකයින්ට ජනමත වවිචාරණයක් උවමනා වන්නේ පාර්ලිමේන්තු සටන දියාරු කිරීමට බවද? එසේනම් ඒ සතුරාට උවමනා දේ නොවේද?

# අවසන් ඉල්ලීම

ජනතාවනි, මේ අවසන් අවස්ථාවයි!
පින් සිදුවෙයි, එය අත් නො හරින්න!

ආණ්ඩුව විසින් සියලු විපක්ෂ බලවේග සහ මහජනතාව ගොනාට අන්දවා සම්මත කිරීමට උත්සාහ කරන එම රට බෙදන ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත කෙසේ හෝ පරාජය කළ නො හැකි වුවහොත් සිදුවන්නේ කුමක් ද?

ඒ මගින් ශ්‍රී ලංකාවේ ඉතිහාසයේ අවසානය ආරම්භවනු ඇත. එසේ ආරම්භ වන්නේ රට දෙකඩ වීමෙන් අවසන්වන සහ සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනතාව එකිනෙකාට එරෙහි ව අවි ඔසවන සහ සුඩානයේ මෙන් බල්ලන් බළලුන් සේ මිනිසුන් මැරෙන කාලකන්නි අවාසනාවන්තයින්ගේ කථාවයි.

අප රටේ වසර 2500ක ඉතිහාසය තුළ විවිධ බාහිර ආක්‍රමණ 16කට මුහුණ දී, එක් රටක් ලෙස අප රටේ ඉතිහාසය ලිවීමට ජාතියක් ලෙස අපි සමත් වූයෙමු. මෑත කාලීන ව වසර 30ක් යුද්ධකොට බෙදුම්වාදී යුද පෙරමුණ පරාජය කිරීමට ද අපි සමත්වූයෙමු.

ජාතියක් ලෙස අප පරාජය වූවානම් එසේ වූයේ ගිවිසුම් වලින් මිස යුද්ධ වලින් නො වේ. ඉන්දු ලංකා ගිවිසුම අප අත්සන් කළ අනෙක් සියලුම ගිවිසුම්වලට වඩා වෙනස් වේ. එයට හේතුව ඒමගින් රට බෙදීම සහ යටත් කිරීම යන දෙක ම එකවිට සිදුවීමයි. දැන් එම ගිවිසුමට අනුව පොරොන්දු වූ සියල්ල අකුරක් නෑර ඉටුකරන

ලෙස බලකරන්නේ ඇමරිකාව ප්‍රමුඛ එක්සත් ජාතීන්ගේ සංවිධානයයි. යහපාලන ආණ්ඩුව දණ ගසා, හිස නමා එම බලහත්කාරයට එකඟ වී ඇත. ඊට අනුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිත ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත මෙම වසර අවසන් වීමට පෙර සම්මත කෙරෙනු ඇත.

ඒ මහා විනාශයට මඟපාදන ශ්‍රී ලංකා ඉතිහාසයේ මහා පාවාදීමට අප ඉඩ දී නිවටයින් සේ බලාසිටිනවා ද? එසේ වුවහොත් බෙදුම්වාදයට විරුද්ධ ව දේශපාලන සටන්බිමේදී ජීවිත පූජාකළ හැට දහසක් තරුණයින් සහ යුදමය සටන් බිමේ ජීවිත පූජාකළ විසිනව දහසක් රණවිරුවන් මෙන් ම, අදත් මරණය සමඟ පොරබදන සදාකාලික ව ආබාධිත වූ දාහතර දහසක් රණවිරුවන් අද යහතින් ජීවත්වන අප සැමට ශාප කරනු ඇත. ඒ නිසා මේ දුෂ්ඨ පාවාදීම පරාජය කිරීම සඳහා කළ හැකි සියලු දේ දිවි පරදුවට තබා ඉටු කරමු.

**1.රට බෙදන ව්‍යවස්ථා සංශෝධනය පරාජය කිරීම සඳහා පාර්ලිමේන්තුවේදී ඊට විරුද්ධ ව ඡන්දය දෙන ලෙස සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් ලිපි මගින් දුරකථන ඇමතුම් මගින් කෙටි පණිවිඩ-විද්‍යුත් තැපැල මගින් ඉල්ලා සිටිමු. (ඇමුණුම් -2)**

**2. ''රට බෙදන ව්‍යවස්ථා සංශෝධනය පරාජය කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සිහිනුවණ පහළවේවා! ප්‍රඥාව පහළවේවා! ආත්ම ශක්තිය පහළවේවා! යැයි රට පුරා සෑම පන්සලකම අධිෂ්ඨාන පූජා පවත්වමු. (ඇමුණුම් 1)**

**3. ''මන්ත්‍රීවරුනි, ඉතා කරුණාවෙන් ඉල්ලා සිටින වගයි! රට බෙදන ව්‍යවස්ථාවට ඡන්දය දී අපෙන් ඡන්ද ඉල්ලන්න ගමට එන්න එපා!'' යන පණිවිඩය මහජනයා අතර හැකිතාක් ප්‍රචලිත කරන්න. ඒ සඳහා දැන්වීම්, බැනර් සහ පෝස්ටර් ප්‍රදර්ශනය කරන්න.**

**4. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 76 දෙනෙකුට සිහි බුද්ධිය පහළ වුවහොත්**

මේ මහා පාවාදීමෙන් රට ගලවා ගත හැකිය. ඒ නිසා හෘද සාක්ෂ්‍යය ඇතැයි වඩා විශ්වාස කරන මන්ත්‍රීවරුන්ගේ නිවෙස් වලට පමණක් මහා සංඝරත්නය වැඩම කරවා ගෞරවණීයව ඔවුන්ට අනුශාසනා කරන්න.

5. මෙම පොතේ අඩංගු කරුණු මහජනයාට පැහැදිලි කරන කුඩා රැස්වීම් සෑම ගමක ම සෑම පන්සලක ම පවත්වන්න.

6. මෙම පොත නැවත මුද්‍රණය කොට බෙදා හරින්න.

7. මෙම පොතේ අඩංගු ප්‍රධාන කරුණු ඇතුළත්කොට විවිධ සංවිධාන නමින් පත්‍රිකා මුද්‍රණය කොට රට පුරා බෙදාහරින්න.

8. මේ රටේ කිසිදු ජනාධිපතිවරයෙක් 13වැනි ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන් ම ක්‍රියාත්මක කිරීමට එරෙහි ව පැවැති ව්‍යවස්ථාමය හෝ පරිපාලන බාධක එකක් හෝ ඉවත් කිරීමට ධෛර්ය සම්පන්න වූයේ නැත. එම නිසා යෝජිත ව්‍යවස්ථා සංශෝධනය මගින් 13ට එරෙහි ව පවතින ව්‍යවස්ථාමය බාධක ඉවත් කළහොත් ඒ පාපය වර්තමාන ජනාධිපතිතුමාගේ හිස මත වැටෙනු ඇත. ඒ බව එතුමාට පහදා දෙන ලෙස ගෞරවණීය මහා සංඝරත්නයෙන් සහ සියලු අන්‍ය ආගමික නායකයන්ගෙන් ඉල්ලා සිටිමු.

9. මහජනතාවගේ හඬට කන් නො දෙන පාවා දෙන්නන් සියල්ලන්ට එරෙහි ව සියලු දෙවියන්ට කන්නලව් කරමු. ඔබගේ අත්අකුරින් සෙත් කවි හෝ වස්කවි යවන්න (ඇමුණුම 4)

10. දිස්ත්‍රික් මට්ටමින් සඟ සමුළු සහ මහජන සමුළු පවත්වා බෙදුම්වාදී ව්‍යවස්ථාවට එරෙහි මහජන පෙත්සම් අත්සන් කරමු. මහජන බලය පෙන්වමු.

## මාතෘභූමි සුරක්‍ෂා අධිෂ්ඨාන පූජාව

01. වසර දෙදහස් පන්සියයක කාලයක් ථෙරවාදී බුදු දහම, මහ සඝරුවන සහ සමස්ත සම්බුද්ධ ශාසනය ආරක්‍ෂා කොට පෝෂණය කළ ශ්‍රී ලංකාව නම් වූ අපගේ මාතෘ භූමියේ ආරක්‍ෂාව සහ නිදහස වෙනුවෙන් දිවි හිමියෙන් කැප කිරීම් සිදු කළ සියලු විරුවන් සිහිපත් කොට ඔවුන් වෙත දක්වන්නා වූ ගෞරව බහුමානයෙන් මෙම අධිෂ්ඨාන පූජාවේ යෙදෙම්හ.

02. මෑත කාලීන ව තිස් වසරක කුරිරු බෙදුම්වාදී යුද්ධය නිම කොට සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනතාව මරණ බියෙන් නිදහස් කොට ඔවුනට ජීවිත දානය ලබාදීමේ මහා පින් බලයෙන් ඒ සඳහා ජීවිත, අත පය ඇස් ඉස් මස් ලේ දන් දුන් උතුම් වූ විරුවන් සියලු දෙනා හට මෙන් ම, ඔවුන් වෙනුවෙන් දුකට පත්වූ අඹුදරුවන් සහ ඥාති හිතමිත්‍රාදීන් මතු උපදින සියලු ආත්මයන් හි මහජන ගෞරවයට, ප්‍රණාමයට සහ සුගතියට ලක් වේවා යැයි ප්‍රාර්ථනා කරමින් මෙම අධිෂ්ඨාන පූජාවේ යෙදෙම්හ.

03. එසේ දිවි පුදා, දිවි පරදුවට තබා නිදහස් කරගත් අප මාතෘභූමියෙන් කොටසක් ''ව්‍යවස්ථා විසඳුම'' නැමැති බන්දේසියක තබා බෙදුම්වාදී යුද අපරාධකාරයන් අතට පත් කිරීමට දෙස් විදෙස් සියලු බලවේග විසින් ගන්නා වූ උත්සාහය පරාජය කිරීම සඳහා මෙම අධිෂ්ඨාන පූජාව හේතු වේවා!, හේතු වේවා!, හේතු වේවා!

අති පූජනීය දළදාවහන්සේගේ ආනුභාවයෙන්,

අති පූජනීය ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ආනුභාවයෙන්,

අසූ හාර දහසක් ධර්මස්කන්ධයේ ආනුභාවයෙන්,

පූජනීය වන්දනීය මහා සංඝරත්නයේ ආනුභාවයෙන්,

වසර 2500ක් අප රට ආරක්‍ෂාකළ සම්බුද්ධ සාශනයේ ආනුභාවයෙන්

සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනතාව මරා ගැනීමට සලස්වන සහ ජාතියේ ඉතිහාසයේ අවසානය තීන්දු කරන බෙදුම්වාදී ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවේදී පරාජය කිරීම සඳහා මහජන ඡන්දයෙන් බලයට පත් වූ සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට,

**සිහි බුද්ධිය පහළවේවා!**

**ප්‍රඥාව පහළවේවා!**

**ආත්ම ශක්තිය පහළවේවා!**

**කෘත ගුණ සහිත මෘදු සිත් පහළවේවා**

**මේ පුන්‍ය භූමියේ රැස්ව සිටින අප සැම, ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදය සහ බලය පෙරදැරි ව අධිෂ්ඨාන කරමිහ.**

**(මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනය සහ දුරකථන අංක ඉස්මතු කොට පෙන්වා ඇත්තේ පසුගියදා පළාත් සභා මැතිවරණ සංශෝධන පනත ප්‍රජාතන්ත්‍රවිරෝධිව සම්මත කළ අවස්ථාවේදී ඊට අනුමැතිය ලබාදුන් මන්ත්‍රීවරුන් බව සලකන්න)**

**කොළඹ දිස්ත්‍රිකය**

| | | |
|---|---|---|
| **1.** | **රනිල් වික්‍රමසිංහ** | **-011 4733600 / 011 2370954** |
| **2.** | **හර්ෂ ද සිල්වා** | **-011 23280440 / 077 7686897** |
| **3.** | **අනුර දිසානායක** | **-011 2777264 / 071 4824342** |
| 4. | උදය ගම්මන්පිල | -011 3357666 /071 8220451 |
| **5.** | **මනෝ ගනේෂන්** | **-011 2883719 / 077 7312770** |
| **6.** | **මොහාන් ලාල් ග්‍රේරු** | **-011 3091654 / 077 3595100** |
| 7. | දිනේෂ් ගුණවර්ධන | -011 2088828 / 077 7239446 |
| 8. | බන්දුල ගුණවර්ධන | -011 2199500 / 071 4406122 |
| **9.** | **රවී කරුණානායක** | **-011 2484600 / 077 7590590** |
| 10. | ගාමිණී ලොකුගේ | -011 2700277 / 077 7414241 |
| **11.** | **එස්. එම්. මරික්කාර්** | **-011 2572422 / 077 7886665** |
| **12.** | **හිරුණිකා ප්‍රේමචන්ද්‍ර** | **-011 530328 / 077 7222747** |
| **13.** | **සුසිල් ප්‍රේමජයන්ත** | **-011 2879401 / 077 3540070** |
| **14.** | **එම්. මුජිබර් රහුමාන්** | **-011 2335613 / 077 3312010** |
| **15.** | **විජේදාස රාජපක්ෂ** | **-011 2324681 / 077 7447252** |
| **16.** | **චම්පික රණවක** | **-0112889689 / 076 7115099** |
| **17.** | **සුජීව සේනසිංහ** | **-011 2338060 / 077-7801204** |
| 18. | විමල් වීරවංශ | -011 2890670 / 077 3601658 |
| **19.** | **එරාන් වික්‍රමරත්න** | **-011 2437706 / 077 7630601** |

**ගම්පහ දිස්ත්‍රිකය**

| | | |
|---|---|---|
| **20.** | **ලසන්ත අලගියවන්න** | **-0112 2887755 / 071 5322200** |
| **21.** | **ජෝන් අමරතුංග** | **-011 2887440 / 077 7489999** |
| 22. | ඉන්දික අනුරුද්ධ | -031 2247303 / 077 3026909 |
| **23.** | **සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ** | **-011 2177209 / 077 7741390** |
| **24.** | **එඩ්වඩ් ගුණසේකර** | **-011 2283937 / 077 7410010** |
| **25.** | **විජිත හේරත්** | **-033 2294904 / 071 4824345** |
| 26. | සිසිර ජයකොඩි | -011 2910355 / 077 3073518 |
| **27.** | **කාවින්ද ජයවර්ධන-011 2245135 / 071 9909555** | |
| **28.** | **නිමල් ලන්සා** | **-011 2687772 / 077 7769228** |

**29. අජිත් මාන්නප්පෙරුම -033 2231464 / 0773 132237**
**30. හර්ෂණ රාජකරුණා -033 2267081 / 077 3058000**
**31. රන්ජන් රාමනායක -011 2877121 / 0773 6249927**
**32. අර්ජුන රණතුංග -011 2435161 / 077 7588885**
33. ප්‍රසන්න රණතුංග -033 2226717 / 077 7772520
34. ප්‍රසන්න රණවීර -011 2949960 / 077 5804991
**35. චතුර සේනාරත්න -011 2599399 / 077 7516165**
36. දුලිප් විජේසේකර -011 2465087 / 071 3081001
**37. රුවන් විජේවර්ධන -011 2430860 / 077 3302100**

**කළුතර දිස්ත්‍රික්කය**

38. රෝහිත අබේගුණවර්ධන -034 2222564 / 077 0219219
39. පියල් නිශාන්ත -034 2270540 / 071 4995995
**40. නලින්ද ජයතිස්ස -034 2235997 / 071 8100605**
**41. අජිත් පී. පෙරේරා -038 2290692 / 0777 668993**
42. ජයන්ත සමරවීර -034 3029196 / 077 7251565
**43. රාජිත සේනාරත්න -011 2665513 / 077 7301868**
**44. පාලිත තෙවරප්පෙරුම -034 3742002 / 0775 510520**
45. කුමාර වෙල්ගම -034 2247099 / 0773 040995
46. විදුර වික්‍රමනායක -034 2260954 / 0777 274522
**47. ලක්ෂ්මන් විජේමාන්න -034 2222544 / 077 7388802**

**මහනුවර දිස්ත්‍රික්කය**

**48. ආනන්ද අලුත්ගමගේ -081 2077075**
49. මහින්දානන්ද අලුත්ගමගේ -081 2352806 / 0777662775
50. දිලුම් අමුණුගම -081 2499201 / 077 7256708
**51. මයන්ත දිසානායක -081- 3832830 / 0777 515181**
**52. රවුෆ් හකීම් -011 2177200 / 077 3401717**
**53. එම් එච් ඒ හලීම් -011 2451900 / 0777 844909**
**54. අනුරාධ ජයරත්න -011 2677237 / 071 8009009**
**55. ලකී ජයවර්ධන -081 3812200 / 077 3846109**
**56. ලක්ෂ්මන් කිරිඇල්ල -011 2879170 / 077 3323699**
**57. වේලු කුමාර් / 077 7316981**
58. කෙහෙලිය රඹුක්වැල්ල -081 2200925 / 0773 777777
59. ලොහාන් රත්වත්තේ -081 2202700 / 0777 872072

**මාතලේ දිස්ත්‍රිකය**

**60. වසන්ත අළුවිහාරේ -011 2867172 / 0777 808598**
**61. රංජිත් අළුවිහාරේ -066 2233802 / 0777 843566**
62. ලක්ෂ්මන් වසන්ත පෙරේරා -011 2186015 / 0777 412885
63. ජනක බණ්ඩාර තෙන්නකෝන් -066 2285191 / 0777 709225
**64. රෝහිණී කුමාරි විජේරත්න -066 2055440 / 077 3859609**

**නුවරඑළිය දිස්ත්‍රිකය**

**65. නවීන් දිසානායක -011 2187111**
**66. කේ. කේ. පියදාස -051 2223808**
**67. වි. රාධක්‍රිෂ්නන් -011 2784836 / 0777 883943**
68. සී.බී. රත්නායක -052 205002 / 0777 384333
**69. මුත්තු සිවලිංගම් -0112 301359 / 0777 705110**
**70. පලනි දිගම්බරම් -0112 380859 / 0777 797795**
**71. තිලකරාජ් -051 4924900 / 0777 239765**
**72. තොන්ඩමන් - 011 2301358 / 071 7399999**

**ගාල්ල දිස්ත්‍රික්කය**

**73. වජිර අබේවර්ධන -011 2698460 / 0777 518518**
**74. බන්දුල ලාල් බණ්ඩාරිගොඩ -091 2296371 / 0777 907323**
75. මොහාන් ප්‍රියදර්ශන -091 2267330 / 0777 904400
**76. විජේපාල හෙට්ටිආරච්චි -091 2233477 / 0777 424437**
**77. ගයන්ත කරුණාතිලක -011 2513507 / 0777 504504**
78. ගීතා කුමාරසිංහ -091 2290956 / 077 9902217
**79. නිශාන්ත මුතුහෙට්ටිගම -011 2320610 / 077 3078488**
**80. මනුෂ නානායක්කාර -091 2245224 / 0777 925500**
81. රමේෂ් පතිරණ -091 2248505 / 0777 743187
**82. චන්දිම වීරක්කොඩි -011 2370031 / 0777 747005**

**මාතර දිස්ත්‍රික්කය**

83. මහින්ද යාපා අබේවර්ධන -041 2268750 / 0777 723059
84. ඩලස් අලහප්පෙරුම -041 2238276 / 071 8897193
85. චන්ද්‍රසිරි ගජධීර -011 3356893 / 071 8004845
**86. බුද්ධික පතිරණ -041 2230946 / 0777 306922**
87. නිරෝෂන් ප්‍රේමරත්න -041 3406140 / 0776 388189
**88. සාගල රත්නායක -011 2186123 / 0777 583459**
**89. මංගල සමරවීර -041 2222076 / 0777 576495**
90. කංචන විජේසේකර -041 2222798 / 0777 386896

**හම්බන්තොට දිස්ත්‍රික්කය**

| | | |
|---|---|---|
| **91.** | **මහින්ද අමරවීර** | **-011 242371 / 0777 730071** |
| 92. | ඩී.වී. චානක | -041 2255641 / 077 9039495 |
| **93.** | **නිහාල් ගලප්පත්ති** | **-047 2242302 / 071 8219987** |
| **94.** | **සජිත් ප්‍රේමදාස** | **-047 2238010 / 0777 775527** |
| 95. | නාමල් රාජපක්ෂ | -047 2240332 |
| 96. | චමල් රජපක්ෂ | -047 2237483 / 071 2000999 |
| **97.** | **දිලිප් වෙදආරච්චි** | **-011 2478652 / 0777 417299** |

**යාපනය දිසාව**

| | | |
|---|---|---|
| **98.** | **ඩග්ලස් දේවානන්ද** | **-0112 503467 / 0777 781891** |
| **99.** | **විජේකලා මහේෂ්වරන්** | **-0112 187263 / 07777 14933** |
| **100.** | **ඊස්වරපතන් ස්වර්ණපතන්** | **-021 2051335 / 0714115002** |
| **101.** | **මාවෛයි සේනාධිරාජා** | **-021 2228776 / 0777 373377** |
| 102. | ධර්මලිංගම් සිද්ධාර්ථන් | -0112 586289 / 072 7952707 |
| **103.** | **සීවගානම් සීධරන්** | **-021 2280024 / 0776 913244** |
| **104.** | **එම්.ඒ. සුමන්තිරන්** | **-0112 503107 / 0777 314628** |

**වන්නි දිසාව**

| | | |
|---|---|---|
| 105. | සෙල්වම් අඩෛකලනාදන් | -0112 777438 / 07777 60795 |
| **106.** | **රිෂාඩ් බදුර්ඩීන්** | **-0112 435248 / 0777 487504** |
| **107.** | **කඩෛයි කඩෙයි මස්තන්** | **-0114 361557 / 0777 488222** |
| 108. | චාල්ස් නිර්මලන්තන් | -023 2223828 / 077 1906707 |
| 109. | එස්. සිවමෝහන් | -024 2228100 / 077 2093213 |
| 110. | ආන්මලෙයි ඩඩෛශූ සිවශක්ති | -024 2221898 / 071 4347480 |

**මඩකලපුව දිසාව**

| | | |
|---|---|---|
| **111.** | **සයඩ් අල් සහීර් මවුලානා** | **-065 2241841 / 077 2255222** |
| 112. | එස්. වියලන්දෙරන් | -077 4595807 |
| **113.** | **අමීර් අලී සිහබ්දීන්** | **-0112 300825 / 077 7306362** |
| **114.** | **ගන්නමුත්තු ශ්‍රී නේෂන්** | **-065 2229929 / 076664848** |
| **115.** | **එස්. යෝගෙස්වරන්** | **-065 2228273 / 077 6034557** |

**අම්පාර දිසාව**

| | |
|---|---|
| **116. කාසිම්** | **-0112677457 / 0777 353501** |
| 117. විමලවීර දිසානායක | -0632222820 / 0776 018878 |
| **118. දයා ගමගේ** | **-0112879350 / 0777 325553** |
| **119. හැරිස්** | **- 0112 675069 / 0777 313306** |
| **120. මන්සූර්** | **- 0777394785** |
| 121. කවිදරන කෝඩේස්වරන් | -067 2052477 / 077 4669696 |
| 122. ශ්‍රියානි විජේවික්‍රම | -063 2222121 / 077 7162133 |

**ත්‍රිකුණාමළය දිසාව**

| | |
|---|---|
| 123. අබ්දුල් හරුප් | -026 2237227 / 077 0808509 |
| **124. ඉන්බ්‍රාම් මහරුප්** | **-026 2236699 / 077 7007590** |
| **125. සුසන්ත පුංචිනිලමේ** | **-026 2222213 / 0777 484500** |
| **126. ආර්. සම්බන්දන්** | **-011 2777253** |

**කුරුණෑගල දිසාව**

| | |
|---|---|
| **127. අසෝක් අබේසිංහ** | **-0112 187220 / 0777 766159** |
| **128. අලවතුගොඩ** | **-037 2054383 / 0777 530448** |
| **129. තුෂාර ඉඳුනිල්** | **-037 2050636 / 077 9198606** |
| **130. ඉන්දික බණ්ඩාරණායක** | **-0372253190 / 071 6936936** |
| **131. තාරානාත් බස්නායක** | **-011 2576666 / 076 6540540** |
| 132. සාලින්ද දිසානායක | -037 2230696 / 071 8191167 |
| **133. ටි. බී. ඒකනායක** | **-011 2797500 / 0777 732116** |
| 134. ජොන්ස්ටන් ප්‍රනාන්දු | -0372236608 / 0777589499 |
| **135. නලින් බණ්ඩාර** | **-0322245455 / 0777578209** |
| **136. දයාසිරි ජයසේකර** | **-011 2688404 / 0777 882882** |
| **137. අකිල විරාජ් කාරියවසම්** | **-011 2784832 / 0777 777703** |
| **138. එස්.බී. නාවින්න** | **-011 2861147 / 0777 239002** |
| **139. ගාමිණී ජයවික්‍රම පෙරේරා** | **-011 2885540 / 071 8278344** |
| 140. මහින්ද රාජපක්ෂ | -047 2240332 / 0777 725697 |
| 141. අනුර ප්‍රියදර්ශන යාපා | -011 2665298 / 0777 670076 |

පුත්තලම දිසාව

| | |
|---|---|
| **142. සිසිර කුමාර** | **-032 2223345 / 0777 636895** |
| **143. හෙක්ටර් අප්පුහාමි** | **-031 2272414** |
| 144. අරුන්දික ප්‍රනාන්දු | -011 2323605 / 077 3565500 |
| 145. ප්‍රියංකර ජයරත්න | -011 2314069 / 0777 877778 |
| **146. නිරෝෂන් පෙරේරා** | **-011 247364 / 077 3282316** |
| 147. සනත් නිශාන්ත | -032 2259551 / 0777 449492 |
| **148. අශෝක ප්‍රියන්ත** | **-032 2060305 / 0777 625238** |
| **149. පාලිත රංගේබණ්ඩාර** | **-011 2136530 / 077 3505200** |

අනුරාධපුරය දිසාව

| | |
|---|---|
| **150. චන්ද්‍රානි බණ්ඩාර** | **-011 218154 / 0777 347828** |
| 151. එස්.එම්. චන්ද්‍රසේන | -025 2224904 / 077 3029464 |
| **152. දුමින්ද දිසානායක** | **-025 2222123 / 077 85956153** |
| 153. වීරකුමාර දිසානායක | -025 3779000 / 071 1814814 |
| **154. චන්දිම ගමගේ** | **-025 4934692 / 0777 862248** |
| **155. පී. හැරිසන්** | **-011 2395018 / 0777 660800** |
| 156. මුතුකුමාරණ | -025 2249206 / 071 6179923 |
| **157. රහුමාන්** | **-025 2296677 / 0777 889611** |
| 158. ෂෙහාන් සේමසිංහ | -025 3241056 / 0777 519812 |

පොලොන්නරුව දිසාව

| | |
|---|---|
| **159. නාලක කොලොන්නෙ** | **-027 2227850 / 0777 753072** |
| 160. සිරිපාල ගම්ලත් | -027 2246361 / 077 2307777 |
| **161. අනුර ජයරත්න** | **-027 2247006 / 075 591153** |
| 162. රොෂාන් රණසිංහ | -027 2227052 / 0777 684811 |
| **163. වසන්ත සේනානායක** | **-011 2886507 / 0777 385146** |

බදුල්ල දිසාව

| | |
|---|---|
| **164. නිමල් සිරිපාල** | **-011 2187225 / 077 8883554** |
| **165. හරින් ප්‍රනාන්දු** | **-055 2228900 / 077 0155555** |
| **166. අරවින් කුමා** | **-055 2229838 / 0777 727472** |
| **167. රවින්ද්‍ර සමරවීර** | **-057 2244154 / 0777 699590** |

**168. ලක්ෂ්මන් සෙනවිරත්න -055 2258304 / 0777 765377**

**169. වඩිවේල් සුරේෂ් -055 2295175 / 077 4004994**

170. තෙනුක විදානගමගේ -055 2257746 / 0777 765637

171. චමින්ද විජේසිරි -057 2232037 / 077 3607427

**මොණරාගල දිසාව**

172. විජිත බේරුගොඩ -55 2265774 / 071 8127480

173. පද්ම උදයශාන්ත -05 52055525 / 071 8278499

**174. සුමේධා ජී. ජයසේන -011 2885839 / 071 6847949**

175. ආනන්ද කුමාරසිරි -055 2055833 / 0777 704744

**176. රංජත් මද්දුමබණ්ඩාර -055 2277489 / 0777 562550**

**රත්නපුර දිසාව**

**177. තලතා අතුකෝරාල -045 2274287 / 0777 309988**

178. රංජිත් සොයිසා -054 2240654 / 0777 843809

**179. දුනේෂ් ගන්කන්ද -011 2665605 / 0777 576176**

180. ප්‍රේමලාල් ජයසේකර -045 2279173 / 0777 223892

181. වාසුදේව නානායක්කාර -011 2684820 / 071 8517344

**182. කරුණාරත්න පරණවිතාන -045 2274673 /071 6835810**

**183. ඩබ්.ඩී.ජේ.සෙනවිරත්න -045 2274142 / 077 3012588**

184. ජානක වක්කුඹුර -045 2230497 / 071 8291600

185. පවිත්‍රා වන්නිආරච්චි -045 2275585 / 0777 486081

**186. ඒ.ඒ. විජේතුංග -045 2225575**

**187. හේෂා විතානගේ -054 2241171 / 077 2328819**

**කෑගල්ල දිසාව**

188. තාරක බාලසූරිය -035 2230529 / 0777 915410

**189. දුෂ්මන්ත -011 2334288 / 0773 724634**

**190. කබීර් හසිම් -035 2246461 / 0777 485591**

191. කනක හේරත් -035 2223841 / 077 3208869

**192. සුජිත් සංජය -036 2270636 / 0777 512535**

193. චම්පිකා පේමදාස -035 2266685 / 0777 673722

194. සන්ජිත් සමරසිංහ -035 7200810 / 0777 753533

195. රංජිත් සියඹලාපිටිය -036 22657155 / 071 8899999

196. තුසිතා විජේමාන්න -036 2232846 / 0777 276956

**ජාතික ලැයිස්තු මන්ත්‍රීවරු**

197. ලක්ෂ්මන් යාපා අබේවර්ධන -041 2268089 / 077 3011093

198. සරත් අමුණුගම -011 2186034 / 0777 576133

199. පූජ්‍ය අතුරලියේ රතන හිමි -011 2882198 / 077 2650958

200. සිරිනාල් මැක්සිම් ඩී. මෙල් -0112 615361 / 077 3039780

201. එස්.බී දිසානායක -011 2861145 / 0777288641

202. සරත් ෆොන්සේකා -011 2786094 / 077 8139192

203. ඒ.එච්.එම්. ෆවුසි -011 2334023 / 071 2736266

204. අනෝමා ගමගේ -0115 235729 / 0777 562887

205. සුනිල් හඳුන්නෙත්ති -041 2238212 / 077 3908760

206. එම්.එල්.ඒ.එම්.හිස්බුල්ලා -0112 081471 / 0777 818181

207. කරූ ජයසූරිය -0112 777223 / 0777 712345

208. මලිත් ජයතිලක -038 2290412 / 077 3263499

209. තිලක් මාරපන -011 2853397 / 077 0352116

210. ආශූ මාරසිංහ -0113 190897 / 0777 779897

211. මොහොමඩ් ෆායිසර් මුස්තාපා -0112 328098 / 0777 318900

212. එම්.එච්.එම්. නවාව් -032 5672577 / 071 2519200

213. ඩිලාන් පෙරේරා -011 2879180 / 077 3088889

214. අන්ජන් රාමනාදන් -021 2216150 / 077 3827567

215. බිමල් රත්නායක -011 2785612 / 077 3111226

216. මොහොමඩ් හනීල් මොහෙමඩ් ෂලාම් -081 2210016 / 077 3158231

217. මහින්ද සමරසිංහ -011 2136505 / 0777 576450

218. මලික් සමරවික්‍රම -0112 395138 / 0777 718861

219. ශාන්ති ශ්‍රී ස්කන්ධරාසා -021 3204570 / 0774188975

220. තිලංග සුමතිපාල -011 2777492 / 0777 765544

221. ඩී.එම්. ස්වාමිනාදන් -0112 390513 / 0777 352585

222. එම්.එස්. තවුෆික් -026 2236166 / 071 8753653

223. කේ. තුරෙයි රත්නසිංහම් -0112 778545 07 14563215

224. ජයම්පති වික්‍රමරත්න -0112 885394

225. විජිතමුනි සොයිසා -055 2265472 / 0777281862

# අපේ මව්බිම එතරම් අවාසනාවන්ත නැහැ

මන්ත්‍රීවරුන් 76 දෙනෙක්ට පුළුවන් රට බෙිරගන්න. රට බෙදන ව්‍යවස්ථාවට පාර්ලිමේන්තුවේදී තුනෙන් දෙකේ බහුතර කැමැත්ත අහිමි කරන්න එපමණයි ඕන. ඊට පස්සෙ ජනමත විචාරණයක් එන්නෙ නැහැ මහින්ද මහත්තයගෙ මූණ පෙන්නල ඡන්දෙ ගත්ත කාටවත් රට බෙදන ව්‍යවස්ථාවකට ඡන්දෙ දෙන්න කිසිම අයිතියක් නැහැ. එහෙම මන්ත්‍රීවරුන් 95ක් ඉන්නව. ඒ අතර රටට ආදරය කරන හෘද සාක්ෂියක් තියෙන මන්ත්‍රීවරු 76ක් හොයාගන්න අපට බැරිද? උත්සාහ කරමු. ඔවුන්ගේ හෘද සාක්ෂියට කතාකරමු බැනර් , පෝස්ටර්, ලිපි මගින් ඔවුන් අමතමු. මෙන්න ඔවුන් දැනගත යුතු දේ -

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනි,
රට බෙදන ව්‍යවස්ථාවට අත ඔසවා
අපේ පරමාධිපත්‍යය පාවා දෙන්න එපා!
එහෙම කළොත් අපෙන් සමාවක් නැහැ!
ඡන්දය ඉල්ලන්න නැවත අපේගමට එන්න එපා!

ගරු මන්ත්‍රීවරුනි,
රට බෙදන ව්‍යවස්ථාවට පක්ෂව අත් ඔසවා රට පාවාදී අපේ ගමට නම් ආයෙත් කිසි දිනක එන්න එපා!

මන්ත්‍රීවරුනි,
රට බෙදන ව්‍යවස්ථාවට ඡන්දය දෙන්න එපා!
ඡන්දය දී අපේ ගමට එන්න එපා!

මන්ත්‍රීවරුනි,
ව්‍යවස්ථා මර උගුලට පය තබන්න එපා!

මන්ත්‍රීවරුනි,
රට බෙදන ව්‍යවස්ථා සංශෝධනයට
කාරක සභා අවස්ථාවේදී සංශෝධන ගෙන එමින්
ආණ්ඩුවේ කුඨ සැලසුමට සහය දෙන්න එපා!
සංශෝධන එපා එය සහමුලින්ම පරාජය
කරන්න.

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනි,
13 සංශෝධනයේ සැබෑ විපාක අප තවම දැකල
නැහැ. එය සම්පූර්ණයෙන්ම බලාත්මක කළොත්
බලවත් ෆෙඩරල් රාජ්‍යයක් හැදෙනව
ඒක නවතින්නෙ ඊළාම් රාජ්‍යයෙන්
ඒ පාපයට කර ගහන්න එපා!

ජේ.ආර් ජයවර්ධන මහත්තය නොකළ දේ
ප්‍රේමදාස මහත්තය නොකළ දේ
විජේතුංග සහ චන්ද්‍රිකා නෝන නොකළ දේ
මහින්ද මහත්තය නොකළ දේ
මොකද්ද ඒ......
''13 සංශෝධනය සම්පූර්ණයෙන්ම 'බලාත්මක වීම
වළක්වන්න ජේ.ආර් මහත්තය දාපු බාධක ඉවත් කරන එක''
ඇයි ඔවුන් එහෙම පරිස්සම් වුනේ....
ඒ 13 සම්පූර්ණයෙන්ම බලාත්මක කිරීම මගින් ඊළමට පාර
කැපෙන නිසා.....
ඒ කිසිම ජනාධිපති කෙනෙක් නොකළදේ
දැන් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා කරන්නයි යන්නේ.
ඔබතුමාලා ඊට පක්ෂද?

මන්ත්‍රීවරුනි,
පටලවා ගන්න එපා බෙදුම්වාදී, ජාතිවාදී, කුලවාදී, යුද වාදී, යුද අපරාධකාරයින් අතලොස්සක් අතට පොලිස්, ඉඩම්, මුදල් බලය දීමෙන් අහිංසක දෙමළ ජනතාවට සෙතක් වන්නෙ නැහැ.

මන්ත්‍රීවරුනි,
සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනතාව එකිනෙකා මරා ගැනීමට සලස්වන රට බෙදන ව්‍යවස්ථාවට ඡන්දය දෙන්න එපා!

මන්ත්‍රීවරුනි,
රට බේරා ගැනීම සඳහා අවශ්‍ය වන්නේ හෘද සාක්ෂිය සහිත මන්ත්‍රීවරු 76කි. ඔබ ඊට අයත්ද?

## සෙත් කවි සහ වස් කවි (ඡන්ද දායකයන්ට පමණි)

ඔබ වැඩියෙන්ම අමතන්න ඕන රටට ආදරය කරන සහ රට පිළිබඳ හෘද සාක්ෂිය තිබෙනවා යැයි ඔබ හිතන එහෙත් මේ නිශ්චිත මොහොතේ දේශපාලන වශයෙන් වැරදි තැන හිටගෙන සිටින මන්ත්‍රීවරුන්ටයි. රට පිළිබඳ ආදරය සහ හෘද සාක්ෂිය තිබෙන බවට ඔබ ඉතා හොඳින් හඳුනන සහ රට බෙදන ව්‍යවස්ථාවට විරුද්ධ පෙනී සිටින මන්ත්‍රීවරුන්ට බලපෑම් කිරීම සඳහා වැඩිය මහන්සි වෙන්න එපා. එසේම රට ගැන හෘදසාක්ෂියක් නැති බව හොඳටම දන්නා සහ දේශපාලන වශයෙන් වැරදි තැන සිටගෙන සිටින සහ ව්‍යවස්ථාවට පක්ෂව රෙදි ගලවාගෙන පෙනී සිටින මන්ත්‍රීවරුන් ගැන කිසිසේත්ම කරදර වෙන්න එපා.

ඒ වර්ග 03ක මන්ත්‍රීවරුන් දිස්ත්‍රික් මට්ටමින් හඳුනා ගන්න''මන්ත්‍රී පෙරෙට්ටුවක්'' මුහුණු පොතේ තිබෙනවා. ඒ අතුරින් ඔබේ දිස්ත්‍රික්කයේ ඉහත සඳහන් කළ පළමු කාණ්ඩයම සහ දෙවන කණ්ඩායම ට අයත් මන්ත්‍රීවරුන්ට ඔබේ අත් අකුරින් සෙත් කවි ලියා එවන්න. ඔබ කැමතිනම් රට පාවා දෙන බව ස්ථිර වශයෙන්ම දන්නා තුන්වන කණ්ඩායමට අයත් මන්ත්‍රීවරුන්ට ඔබේ අත් අකුරින් වස්කවි ලියා යවන්න. ඒවා ආපසු ඔබට වදින්නේ නැති බව ස්ථිරයි. එහෙත් පළමු සහ දෙවන කණ්ඩායමට අයත් මන්ත්‍රීවරුන්ට වස් කවි වදින්නේ ඔවුන් ඡන්ද දායකයින්ගේ ඉල්ලීමට කන්නොදී රට පාවා දුන්නොත් පමණි.

මෙන්න සෙත් කවි -

දියත තෙදබල මහිම පවතින සුනිල ඉඳුවර රුවැති විසිතුරු
සුගත මුනිඳුගෙ සසුන සුරකින උපුල්වන් නම් සුරිඳු බුදුකුරු
සතත දෙන පුද පඬුරු පිළිගෙන දිලෙන තුරු දිව රැයෙහි සඳහිරු
විපත දුරුකර සිහල රටදැයසමය සුරකිනු මැනවි නිරතුරු

**මෙන්න වස් කවි -**

රට බෙදන තැත දරන මැති දුදන වැනසියන්
සිහි නොඑන සුව නොාන කුණු ලෙඩම වැළඳියන්
හිස උකුණු මුව පණුවො ගුද වනය ඇතිවෙයන්
මග යනෙන නිදි වදින තැනෙක මක බැවියන්

මැතිවරණය කල් දමන්න තුනෙන් දෙකක් දීපු උන්ට
රට බෙදන්න ආණ්ඩුවට තුනෙන් දෙකක් දෙන එවුන්ට
කැබිලිත්තේ දෙවියන්ගේ නමට නිගා දීපු උන්ට
හෙණ ගහපන් හත් සැරයක් හක් කඩකට හිස සැලෙන්ට

මහජන පෙත්සම ආකෘතිය

''රට වෙනුවෙන් අපි''

ජාතික සංවිධාන එකමුතුව විසින් සකස් කරන ලද දිස්ත්‍රික් මට්ටමින් පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් වෙත යැවිය යුතු පෙත්සම ආකෘතිය

........................................... දිස්ත්‍රික්කය

1. පා.ම ගරු..........................................................

2. පා.ම ගරු..........................................................

3. පා.ම ගරු..........................................................

ගරු මන්ත්‍රීතුමනි,

හෘද සාක්ෂියක් තිබෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත

ඡන්ද දායකයින්ගේ කාරුණික ඉල්ලීම

විවිධ ජාතික සංවිධාන මගින් අන්තර්ජාලයට මුදා හැර ඇති මන්ත්‍රීවරුන් ''හඳුනා ගැනීමේ පෙරෙට්ටුව'' අනුව ඔබතුමා අයත් වන්නේ '' රට පිළිබඳව ආදරයක් තිබෙන සහ හෘද සාක්ෂිය සහිත'' එහෙත් රටට සාපේක්ෂව වැරදි තැන සිටගෙන සිටින කණ්ඩායමටයි අප විසින් ඉතා අවංක චේතනාවෙන් සහ සද්භාවයෙන් යුතුව ඔබතුමන්ලා ආමන්ත්‍රණය කරන්නේ එම විශ්වාසය මත බව පළමුවෙන්ම කිව යුතුය. විශේෂයෙන්ම ප්‍රජාතන්ත්‍ර විරෝධි ආකාරයට සම්මත කළ පළාත්සභා මැතිවරණ සංශෝධන පනතට තුනෙන් දෙකේ විශේෂ බහුතරය ලබා දීමට ඔබතුමන්ලා දායක වූ බැවින් රට වෙනුවෙන් ඔබතුමන්ලා ඇමතීමේ අවශ්‍යතාවය ඉතා ප්‍රබලව මතුවී ඇත.

නුදුරු දිනකදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිත ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත පිළිබඳව ආණ්ඩුවේ පාර්ශව විසින්

ප්‍රකාශ කරන දේ සහ ඒ මගින් අවසානයේ සිදුවන දේ අතර අහසට පොළව මෙන් වෙනස්ක තිබෙන බව දැන් සාක්ෂි සහිතව ඔප්පු කොට වී ඇත. ජාත්‍යන්තර සහ දේශීය බෙදුම්වාදී බලවේගවල බලපෑම් වලට යටත්ව ඉදිරිපත් කෙරෙන මෙම ව්‍යවස්ථා සංශෝධනයේ මූලික අරමුණ වන්නේ බෙදුම්වාදී කප්පම්කරුවන් ලෙස කටයුතු කරන සැබෑ යුද අපරාධකරුවන් විසින් ඉල්ලා සිටින ''ව්‍යවස්ථා කප්පම්'' ලබා දීම බව තේරුම් ගැනීමට මහා විශාල දේශපාලන දැනුමක් අවශ්‍ය නොවේ.

මෙම ව්‍යවස්ථා සංශෝධනය මගින් ඔවුන් බලාපොරොත්තු වන්නේ 13 වන සංශෝධනය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීමට එරෙහිව පවතින බාධා ඉවත්කර ගැනීමට සහ හැකිනම් එම ප්‍රතිපාදන තවදුරටත් ශක්තිමත් කර ගැනීම පමණි. එම භයානක උපක්‍රමය අවතක්සේරු කිරීම සහ ඒ පිළිබඳව අවධානය අන් අතකට යොමු කිරීම සිදහා ඔවුන් විසින් ඒකීය'' වචනය සහ බුද්ධාගම '' ඊට පටලවාගෙන ඇත. පරපීඩකකාමී බෙදුම්වාදීන්ට ව්‍යවස්ාවේ ඒකීය වචනය සහ බුද්ධාගමට හිමි තැන අහිමි කිරීම මඟින් මානසික සතුටක් ලබාගත හැක. නමුත් වෙනම රාජ්‍යක් කරා යන ගමනට තාක්‍ෂණිකව එවැනිදේ අවශ්‍ය වන්නේ නැත. ඊට අමතරව තව දුරටත් මහජනයා ගොනාට ඇන්දවීම සඳහා මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම වැනි 'සීනි තැවරීමේ' යෝජනාද ඔවුන් විසින් ඉදිරිපත් කරනු ඇත.

කෙසේ වෙතත් මහජනයාට පෙන්වන හෙවත් 'ගැසට් කරන' පනත් කෙටුම්පතට භයානක සංශෝධන ඇතුල් නොකර ඒවා පසුව පාර්ලිමේන්තුවේ කාරක සභාඅවස්තාවේදී ඇතුල් කරන බවට කිසිදු සැකයක් නැත. මීට පෙර සම්මත කළ පළාත්සභා සංශෝධන පනතට එවැනි සංශෝධන 33ක් ඇතුල් කිරීම නිසා එම කූඨ උපක්‍රමය ඉතා හෝදින් පැහැදිලිවේ. මෙම තත්වයන් තුළ රටේ ව්‍යවස්ථාවේ තිබෙන 'නරක දේ' සංශෝධනය කිරීමේ මුවාවෙන් දැන් තිබෙනවාට වඩා බරපතල අර්බුදයකට රට තල්ලු කරන සංශෝධන ගෙන ඒම ප්‍රඥාගෝචර නොවන බව ඔබතුමන්ලා පිළිගන්නවා ඇත. මීට පෙර ඉන්දියාවේ බලපෑම මත ගෙන එන ලද 13 වැනි සංශෝධනය නිසා රටට සිදුවූ විපත අපට මෙන්ම ඔබතුමන්ලාටද මතක තිබේ.

ත්‍රෛයිනාකායික මහනාහිමිවරුන් මේ මොහොතේ රටට නව ව්‍යවස්ථාවක් හෝ ව්‍යවස්ථා සංශෝධනයක් අවශ්‍ය නොවන

බවට අනුශාසනා කරන්නේ උන්වහන්සේලා විසින් මේ කටුක යථාර්තය ඉතා හොඳින් තේරුම්ගෙන තිබෙන නිසා බව ඔබතුමන්ලා පිළිගන්නවා ඇත. ඔබතුමන්ලා උන්වහන්සේලාගේ මතයට පිටුපා කටයුතු කිරීම බහුතර ඡන්දදායකයින් විසින් අනුමත නොකරන බවද ඔබතුමන්ලා පිළිගන්නවා ඇත. එම නිසා රටට ආදරය කරන මිනිසුන් ලෙස සහ ඔබතුමන්ලා ගේ ඡන්දදායකයන් ලෙස අප ඔබතුමන්ලාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටින්නේ රට බෙදන ව්‍යවස්ථා සංශෝධනයට පක්ෂව ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේදී මෙන්ම පාර්ලිමේන්තුවේදී ද ඡන්ද ප්‍රකාශ නොකරන ලෙසය. ඊට සංශෝධන ඉදිරිපත් කරමින් ආණ්ඩුව් කූඨ සැළසුමට සහාය දීමට උත්සාහ නොකරන ලෙසද අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිමු.

ඔබතුමන්ලාගේ වටිනා ඡන්දය මිලදී ගැනීම සඳහා විවිධ ජාත්‍යන්තර බලවේග විසින් මුදල් විසි කරනු ඇති බවට රට පුරා ප්‍රචාරය වන බව මේ වන විට ඔබතුමන්ලා දන්නවා ඇත. නමුත් ඔබතුමන්ලා මුදලට යටවී රට පාවා නොදෙන බවට අපි තරයේ විශ්වාස කරමු. එහෙත් එසේ විසිකරන දේ ඇත්නම් ඒවා අහුලාගෙන යහපත් දේකට යෙදවීම පිළිබඳව අපගේ විරෝධයක් නැත. එයට හේතුව රටට හතුරු ක්‍රියාමාර්ගයකට පක්ෂව ඡන්දය නොදී සිටවීම හෝ ඊට විරුද්ධව ඡන්දය දීම මඟින් ඒ 'පවු' සෝදාගත හැකි වීමයි.

රට බෙදීමේ පාප කර්මයට දායක නොවන්න. ඒ මහා පාවාදීම පරාජය කිරීම සඳහා අවශ්‍ය වන්නේ හෘදසාක්ෂිය සහිත මන්ත්‍රීවරුන් 76 දෙනෙක්ගේ වටිනා ඡන්දයයි. ඔබත් 76න් කෙනෙක් වන්න.

මේ වගට,

පහත අත්සන් තබන ඔබගේ ඡන්ද දායකයින්

පිටපත් -

01. ත්‍රෛයිනිකායික මහා නායක අනුනායක, අධිකරණ සංඝනායක
    ස්වාමීන්වහන්සේ

02. දිස්ත්‍රික් සාසනාරක්ෂක බලමණ්ඩල

03. දිස්ත්‍රික්කයේ සියලු මහජන සංවිධාන

# ගෝලීය ශ්‍රී ලාංකිකයින්ගෙන්,
# දේශීය ශ්‍රී ලාංකිකයන් වෙත..



**සිංහල, දෙමළ, මුස්ලිම් සියළු ජනතාව**
**මරා ගැනීමට සලස්වන**
**රට බෙදන ව්‍යවස්ථා සංශෝධනය**
**පරාජය කිරීම සඳහා**
**අවශ්‍ය වන්නේ මන්ත්‍රීවරුන් 76 දෙනෙක්**
**ඊට විරුද්ධව**
**ඡන්දය ප්‍රකාශ කිරීම පමණයි.**

## මන්ත්‍රීවරුන් 225 ක් අතරින්
## රටට ආදරය කරන
## හෘද සාක්ෂිය සහිත මන්ත්‍රීවරුන් 76 ක්
## සොයාගත නොහැකි නම්...

එවැනි පාර්ලිමේන්තුවක් රටට කුමට ද?
එය කළ නොහැකි නායකයින් අපට කුමට ද?
එවැනි රටක් ලොවට කුමට ද?

ඡන්දදායකයිනි

**ඔබගේ ඡන්දය ලබාගත් මන්ත්‍රීවරුන් ද, ඒ 76 දෙනාට අයත්දැයි සොයා බලන්න.**

ගෝලීය ශ්‍රී ලාංකික සංසදය
GLOBAL SRI LANKAN FORUM
www.globalsrilankanforum.com
secretary@globalsrilankanforum.com

මහා සංඝරත්නයෙන් අවසරයි

**පාවා දෙන්නන්ගේ ලණු කන්න එපා...**

රට බෙදන ව්‍යවස්ථා සංශෝධනය පරදවන්න ජනමත විචාරණයක් එනතෙක් බලා ඉන්න එපා. ජනමත විචාරණයක් ආවත් නාවත් කමක් නැහැ. ආවොත් ඒ ගැන ආවම බලාගමු. පළමු සටන පාර්ලිමේන්තුවේදී කරන සටන. ඒක දින්නොත් ජනමත විචාරණ එන්නේ නැහැ. යූ.එන්.පී , ජේ.වී.පී , ටී.එන්.ඒ. මන්ත්‍රීවරුන් ගැන කරදර වෙන්න එපා. ඔවුන් රට පාවාදෙන කොන්ත්‍රාත්තුව අත්සන් කරල ඉවරයි. එහෙත් මහින්ද මහත්තයගෙ මුහුණ පෙන්නල ඡන්ද ගත්ත මන්ත්‍රීවරුන්ට රට පාවා දෙන්න අයිතියක් නැහැ. ඒ නිසා සියලු සටන් ඔවුන් ඉලක්ක කරගෙන කළ යුතුයි. ඔවුන්ට ප්‍රඥාව පහළවෙන්න, ආත්ම ශක්තිය ලැබෙන්න කියා සෑම පන්සලක ම අධිෂ්ඨාන පූජා පවත්වන්න. රට පාවාදී ගමට එන්න එපා කියල සෑම පන්සලක ම බැනරයක් දමන්න. දිස්ත්‍රික් සහ සමුළු පවත්වා ඒ මන්ත්‍රීවරුන්ට ආරාධනය කරන්න. ඔවුන්ගේ නිවෙස්වලට ගොස් කරුණාවෙන් කරුණු පහදන්න. මහජන පෙත්සම් අත්සන් කරන්න. මහජනයා සමග මන්ත්‍රීවරුන් මුණගැසී ඔවුන්ට එම සංදේශ භාරදෙන්න. රටේ ඉරණම මෙන් ම සම්බුද්ධ ශාසනයේ ඉරණම මන්ත්‍රීවරු 76 දෙනෙක් අතේ තිබෙන බව අමතක කරන්න එපා.

පූජ්‍ය ආචාර්ය මාදුරුඔයේ ධම්මිස්සර හිමි


---

**19ට කළ දේ 20 ටත් කරනු ඇත.**

19 වැනි සංශෝධනය සම්මත කළ කූට ආකාරයට ම රට බෙදන 20 වැනි සංශෝධනයත් සම්මත කිරීමට මේ ආණ්ඩුව උත්සාහ කරන බවට කිසිදු සැකයක් නැත. ඔවුන් විසින් මහජනයා රැවටීම සඳහා ගැසට් කරනු ලබන පනත් කෙටුම්පතට භයානක බෙදුම්වාදී ප්‍රතිපාදන ඇතුළත් නො කරනු ඇත. එසේ භයානක ඒවායේ භයානකකම ආවරණය කිරීම සඳහා එම වගන්ති දියාරු ලෙස හෝ පැටලිලි සහගත ලෙස ඉදිරිපත් කරනු ඇත.

ඉන් පසුව පනත පිළිබඳ විවාදයේ කාරක සභා අවස්ථාවේ දී මහත් ඝෝෂා ඇති කරමින් එම භයානක බෙදුම්වාදී වගන්ති සංශෝධන ලෙස ඉදිරිපත් කොට සම්මත කරගනු ඇත. පසුගිය අවස්ථා කිහිපයකදී විපක්ෂ මන්ත්‍රීවරුන් රට ගොළුරු වූ බැවින් මෙවර ද එය සාර්ථක වනු ඇතැයි ආණ්ඩුව විශ්වාස කරනු ඇත. එසේ වුවහොත් අවසානයේ දී පාර්ලිමේන්තුවේ දී සම්මත වී එළියට පැමිණෙන්නේ ඉදිරිපත් කළ කෙටුම්පතට වඩා භයානක වෙනස් එකකි.

ජ්‍යෙෂ්ඨ නීතිඥ කල්‍යානන්ද තිරාණගම



අති පූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ නායක හාමුදුරුවන් එදා 2000 වසරේදී වදාළ දේ එදාට වඩා අද වලංගු වේ. නමුත් එදා උන්වහන්සේ අභිමුව වූ අභියෝගයට වඩා අද අප මුහුණ දෙන අභියෝගය ඉතා බලවත් සහ සංකීර්ණ බව කිව යුතු ය. එදා ඇතුළේ සිට පාවා දෙන එවුන් නොසිටිය. නමුත් අද එවැන්නෝ බහුල ව සිටිති. දෙමළ ජනතාවට සාධාරණය ඉටුකිරීමේ නාමයෙන් බෙදුම්වාදී, ජාතිවාදී, කුලවාදී, යුදවාදී වෙල්ලාලයන් අතළොස්සක් අතට පොලිස් බලය, ඉඩම් බලය, මුදල් බලය දීමෙන් උතුරේ හෝ නැගෙනහිර ජීවත් වන දෙමළ හෝ මුස්ලිම් සාමාන්‍ය ජනතාවට සුගතියක් වන්නේ නැත. මේ ගෙන එන ව්‍යවස්ථා සංශෝධනවලින් සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව තව තවත් බෙද වනවා මිස ඔවුන්ට  යහපතක් නම් නො වන බව සක් සුදක් සේ පැහැදිලි දෙයකි.

ආක්‍රමණකාරී ජාත්‍යන්තර බලවේගවල අතකොළු හෝ කුලීකරුවන් සේ ක්‍රියා කරන බෙදුම්වාදී කප්පම්කරුවන්ට සාමාන්‍ය ජනතාව ගැන දුකක් හෝ අනුකම්පාවක් නැත. ආණ්ඩුවේ නායකයන් ද එසේ ම ය. ඔවුනට උවමනා කෙසේ හෝ සුළු ජාතික ඡන්ද ටික ලබා ගෙන සදාකාලිකවම බලයේ සිටීමට ය. ව්‍යවස්ථා සංශෝධනය මගින් වෙන ම රාජ්‍යයකට ආසන්න බලතල ලබාගත් සැණින් ඔවුන් විසින් අහිංසක මහජනයා යොදාගනිමින් එම බලය තහවුරු කරගැනීම සඳහා ගැටුම් අවුළුවනු ඇත. ඊට ඊනියා ජාත්‍යන්තර ප්‍රජාව ද මැදිහත් වනු ඇත. ලේ වැගිරෙන තරමට රට වෙන් කරගැනීම ඔවුනට පහසු වනු ඇත. ජාත්‍යන්තර මහ බලවතුන් හට අප රටට පය තබාගැනීම සඳහා පාලම් තැනෙන්නේ ඒ ගැටුමට ගොදුරු වන අහිංසක මිනිසුන්ගේ ලේ ගංගා මතිනි. ඒ මහ විනාශය වැළැක්විය හැක්කේ මන්ත්‍රීවරුන් 76 දෙනෙක් ඊට විරුද්ධ ව පාර්ලිමේන්තුවේ දී ඡන්දය ප්‍රකාශ කිරීම මගිනි. ඒ නිසා ගෙන ඒමට නියමිත බෙදුම්වාදී ව්‍යවස්ථා සංශෝධනයට පාර්මේන්තුවේ දී තුනෙන් දෙකේ බහුතර කැමැත්ත අහිමි කිරීම සඳහා අප රටේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනට අප සියලු දෙනා ඉතා කරුණාවෙන් බලපෑම් කළ යුතු ය.

පූජ්‍ය මහාචාර්ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි